පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு

Ministry of Coconut Development and Janatha Estate Development

# පොල් පර්යේෂණ මණ්ඩලය

# தெங்கு ஆராய்ச்சி சபை

# Coconut Research Board




## වාර්ෂික වාර්තාව - 2012

## ஆண்டறிக்கை - 2012

## Annual Report - 2012

# පොල් පර්යේෂණ මණ්ඩලය
# தெங்கு ஆராய்ச்சி சபை
# Coconut Research Board

**වාර්ෂික වාර්තාව - 2012**

**ஆண்டறிக்கை - 2012**

**Annual Report - 2012**

## දැක්ම

පොල් සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ, තාක්‍ෂණ ජනනය කිරීම සහ තාක්‍ෂණ ප්‍රවර්ධනය කිරීමේලා කලාපයේ ප්‍රමුඛයා බවට පත්වීම

## මෙහෙවර

පොල් කර්මාන්තයේ තිරසාර දියුණුව සඳහා අවශ්‍යවන විද්‍යාත්මක පදනම නිර්මාණය කිරිම

## අරමුණු

1. පොල් ගසේ වැඩීම සහ පොල් වගාව, පොල් වගාවක් තුල අනෙකුත් භෝග වගාවන් සහ සත්ත්ව පාලන කටයුතු, පලිබෝධ සහ රෝග වලින් ආරක්ෂා වීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම
2. පොල් සැකසීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අගය එක්කල නිෂ්පාදන පිළිබඳව තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම
3. පොල් නිෂ්පාදන සැකසීම සහා නියමු යන්ත්‍රෝපකරණ සැකසීම සහ නඩත්තුව මෙන්ම පොල් සැකසුම් උපකරණ වැඩිදියුණු කිරීම
4. ආයතනයේ බීජ පොල් උයන් සහ පර්යේෂණ මධ්‍යස්ථාන අළුතින් ඇතිකිරීම සහ පවත්වාගෙන යාම
5. පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා උපදේශක සහ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම
6. පොල් කර්මාන්තය තුල ඇති සියළුම තාක්ෂණ කාර්යාවලීන් සඳහා තාක්ෂණික අංශ වලින් ලබාදිය යුතු මඟපෙන්වීම සහ උපදේශකත්වය ලබාදීම

**ආයතනික ව්‍යුහය**



සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය
අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ
නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ කළමණාකරු
අභ්‍යන්තර විගණක
පර්යේෂණ අංශ
පාලන අංශය
ගිණුම් අංශය
වතු කළමණාකරණ අංශය
ඉංජිනේරු ඒකකය
ශෂ්‍ය විද්‍යා
කෘෂි ආර්ථික සහ කෘෂි ව්‍යාපාර කළමණාකරණ
ජීවමිතික
පොල් සැකසුම්
වගා සංරක්ෂණ
ප්‍රවේණි හා ශාක අභිජනන
ශාක කායික
පාංශු හා ශාක පෝෂණ
පටක රෝපණ
කටු පොල් පර්යේෂණ
තාක්ෂණ හුවමාරු
පුස්තකාල සේවා

**පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය**
**පොල් පර්යේෂණ ආයතනය**
**ලුණුවිල**

**සංක්ෂිප්ත වාර්ෂික වාර්තාව – 2012**

**පොල් පර්යේෂණ මණ්ඩලය සහ ආයතනය**

1928 අංක 24 දරණ පොල් පර්යේෂණ ව්‍යවස්ථාවට අනුව 1929 දී පොල් පර්යේෂණ ආයතනය ආරම්භ කර ඇත්තේ පොල් පර්යේෂණ යෝජනා ක්‍රමය ලෙසය. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන මධ්‍යස්ථානය ලුණුවිල බණ්ඩිරිප්පුව වත්තේ පිහිටවනු ලැබූ අතර, එය ප්‍රවේණි, රසායන විද්‍යා හා පාංශු රසායන විද්‍යා නම් වූ තාක්ෂණික අංශ තුනකින් සමන්විත විය. 1950 දී නීතිගත කරනු ලැබූ අංක 37 දරණ පොල් පර්යේෂණ පණතින් පසු මෙය ලංකා පොල් පර්යේෂණ ආයතනය ලෙස යළි නම් කරනු ලැබිණි. 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පණත පැනවීමත් සමඟ 1972 පොල් පර්යේෂණ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි කාර්යභාරය වනුයේ පොල් පර්යේෂණ ආයතනයේ පාලන මණ්ඩලය ලෙස කටයුතු පවත්වාගෙන යාමයි.

**පොල් පර්යේෂණ මණ්ඩලය**

පොල් පර්යේෂණ මණ්ඩලය එහි පාලන මණ්ඩලය වන අතර ආයතනයේ පාලන කටයුතු හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ එම මණ්ඩලය මඟිනි. පොල් සංවර්ධන පණතේ කොන්දේසි වලට අනුකූලව පොල් පර්යේෂණ මණ්ඩලයඅමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 11 න් සමන්විත වේ. මින් එක් සාමාජිකයෙක් ආයතනයේ සභාපති ලෙස පත් කරනු ලැබේ. ආයතනය පාලනය කරනු ලබන්නේ පොල් පර්යේෂණ මණ්ඩලය මඟිනි. වසර තුනක කාලයක් සාමාජිකයින් ලෙස කටයුතු කිරීමෙන් පසුව නැවත සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

**පොල් පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයින්**

| | |
|---|---|
| සභාපති | මහාචාර්ය එච් පී එම් ගුණසේන, B.Sc. (Agric, Peradeniya, PhD (Reading, UK), D.Sc. (Rajarata, Sabaragamuwa and Wayamba) |
| අධ්‍යක්ෂ | ආචාර්ය එච් ඒ ජේ ගුණතිලක, B.Sc. Agric, PhD (Bangor, UK) |
| සාමාජික | ආචාර්ය ජේ ඩී සමරසිංහ, Ph.D.(Teesside, UK), සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව |

| | |
|---|---|
| | ආචාර්ය ඩී සිවරත්නම්, D.Sc. (WUSL), ප්‍රධාන විධායක නිලධාරී, වටවල වැවිලි සමාගම |
| | කේ ජී ශ්‍රියාපාල, අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| | එස් කීර්තිරත්න, සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය |
| | එච් එස් පී පෙරේරා, BA (Attorney at Law), සභාපති, පොල් සංවර්ධන අධිකාරිය |
| | ඒ මුණසිංහ, B.Sc. Agric., මහා භාණ්ඩාගාර නියෝජිත |
| | පී ඩබ් කුමාර, එල් එල් බී., විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව |
| | ඩබ් ආර් ඒ එන් එස් විජයසිංහ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අමාත්‍යාංශ නියෝජිත |
| | ජේ වී ආර් ඩයස්, හිටපු සභාපති පොල් වගාකරුවන්ගේ සංගමය |
| කැඳවුම්කරු | ආචාර්ය එල් සී පී ප්‍රනාන්දු, BSc Agric, PhD (Queensland, Aus) |

**විගණන හා කළමණාකරණ කමිටුව**

පොල් පර්යේෂණ ආයතනයේ විගණන හා කළමණාකරණ සැලසුම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වසර තුල රැස්වීම් පහක් පවත්වන ලදී.

| නම | පැමිණීම් වාර්තාව |
|---|---|
| ආචාර්ය ජේ ඩී සමරසිංහ | 5/5 |
| ඩී එම් එල් බණ්ඩාරනායක මහතා /ඩබ් ආර් ඒ එන් එස් විජයසිංහ මහතා | 5/5 |
| අනෝජා මුණසිංහ මිය | 5/5 |
| ආචාර්ය එච් ඒ ජේ ගුණතිලක, අධ්‍යක්ෂ | 5/5 |
| ආචාර්ය එල් සී පී ප්‍රනාන්දු, අතිරේක අධ්‍යක්ෂ | 3/5 |
| ලාලනී ගුණතිලක මිය, විගණන අධිකාරී | 5/5 |
| පී ඩබ් ඒ ප්‍රනාන්දු මයා, කැඳවුම්කරු | 5/5 |

**සභාපතිතුමාගේ පණිවිඩය**

මෙම 2012 වාර්ෂික වාර්තාව මගින් පොල් පර්යේෂණ ආයතනයේ විවිධ ක්‍රියාකාරකම් යටතේ ලබා ගත් ජයග්‍රහණ නිරූපණය කෙරේ. මෙම වසරේ වඩාත්ම වැදගත් ජයග්‍රහණය වූයේ ආයතනයේ වසර ගණනාවක් පුරප්පාඩුව තිබූ තනතුරු ගණනාවක් සඳහා නව නිලධාරීන් පත්කර ගැනීමට හැකි වීමයි. මෙහිදී බොහෝ තනතුරු විශේෂයෙන්ම පර්යේෂණ නිලධාරී තනතුරු සඳහා ඉතාමත්ම ඉහළ සුදුසුකම් ඇති අය බඳවා ගැනීමට හැකිවීම ආයතනයට ආඩම්බර විය හැකි කාරණාවක් විය. මෙම නව පත්වීම් මගින් ආයතනය තුල නවතාවයක් ඇතිවී අනාගතයේ පොල්කර්මාන්තය දියුණු කිරීමේ ලා විශිෂ්ඨ මෙහෙවරක් ඉටු කර ගැනීමට හැකිවේ යයි අපේක්ෂා කෙරේ.




ගෙවී ගිය වසර තුල වැදගත් පර්යේෂණ ජයග්‍රහණ කිහිපයක් ලබා ගැනීමට හැකි වුණි. වැලිගම කොළ මැළවීමේ රෝගය කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ ක්ෂේත්‍ර වැඩසටහන් ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රයේ ඉහළ ස්ථානයක් ගන්නා ලදී. මෙම පර්යේෂණ වැඩසටහන් ලෝක ආහාර සංවිධානය මගින් තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතියක් මගින් සපයන ලද ආධාර යටතේ වඩාත් ශක්තිමත් වුණි. මෙහිදී විදේශ උපදේශකවරුන්ගේ සහය රෝගය හඳුනා ගැනීම සහ පැතිරීම, රෝග වාහකයන් පිළිබඳ අධ්‍යයන, රෝගයට ඔරොත්තු දෙන පොල් වර්ග නිපදවීම සහ පොල් වගාකරුවන් පුහුණු කිරීම යන ක්ෂේත්‍ර වල ප්‍රවර්ධනය සඳහා බෙහෙවින් උපකාරී විය. මෙම වැඩසටහන් යටතේ ශ්‍රී ලංකා කොළ කුන්දිරා වර්ගය රෝගයට ඔරොත්තු දෙන බව හඳුනා ගැනීමට හැකිවීම විශාල ජයග්‍රහණයක් වේ. මෙම වර්ගය රෝගය බහුලව පැතිර ඇති ප්‍රදේශ වල රෝගයට භාජනය වී නැති ශ්‍රී ලංකා උස ප්‍රභේදයට අයත් ගස් සමඟ දෙමුහුම් කිරීමෙන් වඩාත් හොඳ රෝගයට ඔරොත්තු දෙන වගා දර්ශයක් බිහි කිරීම සඳහා පර්යේෂණ ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ආයතනයේ නිලධාරීන් ඉන්දියාවේ නම් ලත් පර්යේෂණ මධ්‍යස්ථාන වල පුහුණු කිරීමට ලැබීමද වැදගත් සිද්ධියක් ලෙස සඳහන් කල හැක. පොල් පළිබෝධ මර්ධනයේ ලා ලබාගත් තවත් වැදගත් ජයග්‍රහණයක් ලෙස පොල් මයිටාවා පාලනය කිරීම සඳහා ඌ ආහාරයට ගන්නා විලෝපිත මයිටාවෙකු හඳුනා ගැනීම සහ එම මයිටාවා රසායනාගාරය තුල මහා පරිමාණ වශයෙන් බෝකිරීමට අවශ්‍ය තාක්ෂණ නිමා කිරීමට හැකිවීම

සඳහන් කල හැක. මෙම විලෝපිත මයිටාවා පොල් පර්යේෂණ ආයතනය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ස්ථාපිත කර ඇති 20 පමණ රසායනාගාර වල මහා පරිමාණ ලෙස බෝකිරීම දැන් සිදුකෙරේ. මෙමඟින් පොල් මයිටා මඟින් සිදුවන හානිය 65% කින් පමණ අඩුකර ගැනීමට හැකිවී ඇත. කෘමීන් මර්ධනය සඳහා මෙලෙස ස්වභාවික සතුන් යොදා ගැනීම මඟින් රසායනික කෘමිනාශක භාවිතයද අඩුකර ගැනීමට හැකිවේ. ආයතනයේ අභිජනන අංශය ගෙවී ගිය වසර තුල සුවිශේෂී ජයග්‍රහණයක් ලබා ගත්තේ අළුතින් නව පොල් වගා දර්ශ 2 ක් නිකුත් කිරීමට හැකිවීමෙනි. මේවා සීආර්අයි 2012 හෙවත් කප්සුවය සහ සීආර්අයි2013 හෙවත් කප්සෙත නම් කර ඇත. මෙම නව වගා දර්ශ නිකුත් කිරීම අතිගරු ජනාධිපත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2012 ඔක්තෝබර් 12 දින පැවති ජාත්‍යන්තර පොල් දිනය සැමරීමේ උත්සවයේදී සිදුකරන ලදී. මීට අමතරව ඉදිරි කාලයේ උස සහ මිටි දෙමුහුම් මඟින් සාදාගන්නා නව වගා දර්ශ නිකුත් කිරීමටද බලාපොරොත්තු වේ. ගෙවී ගිය වසරේ පොල් වගාව සඳහා නියඟය බෙහෙවින් හානිකර විය. ආයතනය මඟින් ඉටු කරන ලද පරීක්ෂණ මඟින් මෙම නියඟයේ බලපෑම පරාගනය සඳහා අහිතකර ලෙස බලපාන බව අනාවරණය වී ඇත. මෙහිදී වඩාත්ම පරාගනය සඳහා බලපාන අහිතකර තත්ත්වය වනුයේ ගසේ කරටිය ඉහළ උෂ්ණත්වයකට පා තැබීමයි. මෙම අධ්‍යයනය වල ප්‍රතිපල ඉදිරි කාලයේදී නියඟ තත්තවයන්ට ඔරොත්තු දෙන පොල් වගා දර්ශ නිපදවීම සඳහා යොදා ගැනේ. කටු පොල් වගාව සම්බන්ධ පර්යේෂණද පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය පථයට ඇතුල් කරන ලදුව කටු පොල් වගාකරුවන්ගේ සහභාගිත්වයෙන් පර්යේෂණ වැඩසටහනක් සම්පාදනය කර ඇත.



රූපය 2- සීආර්අයිඑස්එල් 2012 - කප්සුවය



සීආර්අයිඑස්එල් 2013 - කප්සෙත

පොල් පර්යේෂණ ආයතනය සිය ජාත්‍යන්තර ආයතන හා සාර්ථක සම්බන්ධතා දිගින් දිගටම පවත්වාගෙන යාමට සමත්විය. ලෝක කෘෂි වන වගා කේන්ද්‍රය මඟින් ආයතනයේ විද්‍යාඥයන් කිහිපදෙනෙකුට සහ පොල් ප්‍රතිපත්ති සැලසුම් කරන නිලධාරීන්ටද ඉන්දියාවේ මධ්‍යම වැවිලි භෝග පර්යේෂණ ආයතනය (CPCRI) වෙත ගොස් වැලිගම කොළ මැළවීමේ රෝගයට සමාන රෝගයක් වන කේරළ මැළවීමේ රෝගය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම

වැදගත් සේවාවක් ලෙස සඳහන් කල හැක. ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය COGENT ව්‍යාපෘතිය හා එක්ව වැදගත් කර්ය භාරයක් ඉටුකරන ලදී. මීට අමතරව ආයතනය කැළණියේ වෛද්‍ය විද්‍යාලය සමඟ පොල් ආශ්‍රිත ආහාර වල සෞඛ්‍ය හිතකර තත්ත්වයන් පර්යේෂණ ලක් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මීට අමතරව වැලිගම කොළ මැළවීමේ රෝගය විනිශ්චය සඳහා ප්‍රතිදේහකරණ ක්‍රමය යොදා ගැනීමට හැකිදැයි පරීක්ෂා කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය සමඟ පර්යේෂණ ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. වසර පුරාම ආසියානු පැසිපික් පොල් ප්‍රජාව (APCC) ආයතනයේ වැඩකටයුතු වලට මහඟු සේවාවක් ලබා දුන් අතර පර්යේෂණ නිලධාරීන් කිහිප දෙනෙකුට විදේශ සම්මන්ත්‍රණ වලට සහභාගී වීමට අවස්ථාද සළසා දෙන ලදී.

පොල් පර්යේෂණ ආයතනයේ ගෙවී ගිය වසර පුරාම පොල් සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු ඉටු කර දීම සඳහා ඉතාමත්ම ඉහළ මට්ටමින් සහයෝගය අඛණ්ඩව ලබා දුනි. අමාත්‍යාංශයේ කප්රුක නවෝදා වැඩසටහනේ සාර්ථකත්වය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයේ සහයෝගය නොමඳව සපයා දුන් අතර දැයට කිරුළ ප්‍රදර්ශණයටද සාර්ථක ලෙස සහභාගී වී වගාකරුවන් වෙත පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත තාක්ෂණ ප්‍රචාරණය කිරීමට කටයුතු කරන ලදී. ඉදිරි වසර වලදීද පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වැඩසටහන් වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ උන්නතිය සඳහා ලබා දීමට හැකිවේ යයි බලාපොරොත්තු වේ.

මහාචාර්ය එච් පී එම් ගුණසේන

සභාපති

පොල් පර්යේෂණ මණ්ඩලය

ලුණුවිල

**අධ්‍යක්ෂකතුමාගේ විමර්ශනය**

2012 වසර පොල් පර්යේෂණ ආයතනයේ සුවිශේෂී සිදුවීම් ගණනාවක් සනිටුහන් කල වසරක් විය. මෙහි ලා කප්සුවය (ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා සහ ශ්‍රී ලංකා උස දෙමුහුම) සහ කප්සෙත (ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා සහ සැන්රාමන් උස දෙමුහුම) නිකුත් කිරීම විශිෂ්ඨතම සිද්ධිය ලෙස සඳහන් කල හැක. මෙම වගා දර්ශ 2 සිටුවා වසර 3 - 4 කින් එල දරණ ඉහළ ගෙඩි එලදාවක් සහ වැඩි කොප්පරා එලදාවක් මෙන්ම හොඳින් නියඟයට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති ලක්ෂණ පෙන්නුම් කරයි. මෙම වගා දර්ශ 2 නිකුත් කිරීමත් සමඟම මෙතෙක් පොල් පර්යේෂණ ආයතනය මඟින් නිපදවා නිකුත් කරන ලද පොල් වගා දර්ශ සංඛ්‍යාව 6 ක් වේ. මීට කලින් නිකුත් කර ඇති වගා දර්ශ 4 නම් සීආර්අයිසී 60 (ශ්‍රී ලංකා උස සහ ශ්‍රී ලංකා උස දෙමුහුම), සීආර්අයිසී 65 (ශ්‍රී ලංකා කොළ කුන්දිරා සහ ශ්‍රී ලංකා උස දෙමුහුම), සීආර්අයිඑස්එල් 98 (ශ්‍රී ලංකා උස සහ සැන්රාමන් උස දෙමුහුම) සහ කප්රුවන (ශ්‍රී ලංකා කොළ කුන්දිරා සහ සැන්රාමන් උස දෙමුහුම) වේ.

**ලෝක පොල් වගා දිනය:**

පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් සංවිධානය කල ලෝක පොල් දිනය සැමරීමේ උත්සවයට පොල් පර්යේෂණ ආයතනය ඉතාමත්ම සක්‍රීය ලෙස සහභාගිත්වය ලබා දුනි. මෙවර මෙම උත්සවය පවත්වන ලද්දේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේය. මෙදින උත්සවයේ ප්‍රධාන අරමුණ වූයේ පොල් සංවර්ධනය සඳහා ජාතික වැඩසටහනක අවශ්‍යතාවය තහවුරු කිරීම සහ ඒ පිළිබඳව ක්‍රමෝපායක් සකස් කිරීමයි. මෙදින සැමරුම් උත්සවය සඳහා පොල් වගාකරුවන්, පොල් කර්මාන්තකරුවන් සහ වෙළඳ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් 6000 ක් පමණ සහභාගී විය.



පොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ලබා දුන් දායකත්වය වෙනුවෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්ප කුමාර මැතිතුමා පොල් වගා දිනයේදී සතුට පළ කිරීම

රැස්වූ සෙනඟ අමතා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මහතා අමාත්‍යාංශය  ආරම්භ කිරීමෙන් අනතුරුව ගෙවී ගිය වසර තුන තුල පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර සහ මෙතෙක් ලබා ඇති ජයග්‍රහණ සමාලෝචනය කරන ලදී.  මෙහිදී වඩාත් කැපී පෙනෙන කාරණා වූයේ  කප්රුක පුරවර වැඩසටහන, කප්රුකයි සිප්නැණයි වැඩසටහන, වැලිගම කොළ මැළවීමේ රෝගය කළමනාකරණය කිරිම, ඒකාබද්ධ පළිබෝධ මර්ධන වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සහ 2011 සහ 2012 වසර තුල පිළිවෙලින් පොල් පැළ මිලියන 4 ක් සහ මිලියන 9 ක් ජාතික මට්ටමින් සිටුවීමයි.

මෙදින වැඩසටහනේදී පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශය අනුව කිර්තිධර විද්‍යාඥයන් වන ආසියානු පැසිපික් පොල් ප්‍රජාවේ විධායක අධ්‍යක්ෂ රොමියුලෝ එන්. ඇරන්කෝන් මහතාද, ලෝක වනවගා කේන්ද්‍රයේ ආසියානු කලාපීය අධ්‍යක්ෂ ආචාර්ය වී. පී. සින්  මහතා සහ එම කේන්ද්‍රයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රවීන්ද්‍රනාත් ප්‍රභූ යන තිදෙනාට සම්මාන ප්‍රධානය කරන ලදී.



ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා සහ පොල් සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මහතා අතින් ආසියානු පොල් ප්‍රජාවේ විධායක අධ්‍යක්ෂ එන්. ඇරන්කෝන් මහතාට ලෝකයේ පොල් කර්මාන්තය නඟාසිටුවීම සඳහා කරන ලද සේවය වෙනුවෙන් පොල් වගා දිනයේදී සම්මාන ප්‍රධානය කරන අවස්ථාව

2011 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද කටු පොල් පර්යේෂණ සහ සංවර්ධන අංශය සිය කටයුතු පළිබෝධ සහ රෝග පාලනය, පෝෂණය සහ ශෂ්‍ය විද්‍යාව සහ පටක රෝපණය යන පර්යේෂණ ක්ෂේත්‍ර කෙරෙහි මූලිකත්වයක් දක්වමින් දියත් කරන ලදී. දිවයිනේ කටු පොල් වගා වපසරිය හෙක්ටයාර 20,000 ක් දක්වා ව්‍යාප්ත කිරීමට ඉලක්ක කර ඇති අතර එමඟින් වාර්ෂිකව පාම් තෙල් මෙට්‍රික් ටොන් 60,000 ක් නිෂ්පාදනය කිරීම මූලිකව අරමුණු කරගත් සැලස්ම 2012 ජූලි 17 දින අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් පැවති දිස්ත්‍රික් සංවර්ධන කවුන්සිලයට ඉදිරිපත් කරන ලදුව එහි ප්‍රතිඵලයක් ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය තුලින් කටුපොල් පර්යේෂණ සහ සංවර්ධන වගකීම පොල් පර්යේෂණ ආයතනය වෙත පැවරීම සිදුකරන ලදී.

2013 – 2017 කාලය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ සංයුක්ත සැලැස්ම සම්පාදනය කරන ලදී. මෙම සැලැස්මේ පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ කප්රුක නවෝදා පොල් සංවර්ධන ක්‍රමවේදය හා සමගාමීව අභිජනන, වගා, වගා සංරක්ෂණ, සැකසුම් සහ සමාජ ආර්ථික යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ සංවර්ධන ප්‍රමුඛතා හුවා දක්වා ඇත. ආයතනයේ සමස්ථ පර්යේෂණ වැඩසටහන නැවත සකස් කරමින් වැඩි බරක් අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන වන වැලිගම පර්යේෂණ ව්‍යාපෘතිය, කාලගුණ වෙනස්වීම් හි බලපෑම, පාංශු සශ්‍රීකත්වය හා අදාළ, කාබනික පොල් වගාව, පොල් කෘෂි වන වගාව, පොල් තෙල් වල සෞඛ්‍යමය ගුණ, ලෝක ආහාර සංවිධානයේ තාක්ෂණික ව්‍යාපෘතිය, ලෝක වන වගා ආයතනය සහ පොල්

පර්යේෂණ ආයතනයේ සහයෝගීතා ව්‍යාපෘතිය, පොල් පර්යේෂණ ආයතනය සහ කැළණිය වෛද්‍ය විද්‍යාලය හා සහයෝගීතා ව්‍යාපෘතිය, පොල් පර්යේෂණ ආයතනය හා කර්මාන්ත සහයෝගීතා කාර්යාංශය හා සහයෝගීතා ව්‍යාපෘතිය යන වැඩසටහන් සඳහා පවරා ඇත. පොල්




පර්යේෂණ ආයතනය ස්වකීය වැඩකටයතු කරගෙන යන මාවත වෙනස් කරමින් මෙම වසරේ සිට කාලගුණ දත්ත එක්රැස් කිරීමේ සහ කළමනාකරණය කිරීමේ වගකීම ශාක කායික අංශය වෙත පවරා දීමට කටයුතු කරන ලදී. ගතවූ වසරේ තවත් වැදගත් සිද්ධීන් 2 ක් ලෙස විලෝපිත මයිටාවන් බෝකිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය, හලාවත සහ කුරුණෑගල වැවිලි සමාගම් එකතුව රසායනාගාර 10 ක් ආරම්භ කිරීම සහ කුරුණෑගල වැවිලි සමාගම හා එක්ව කිනියම වතුයායේ කප්රුවන වගා දර්ශය මහා පරිමාණ වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා බීජ උයනක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගැනීම සඳහන් කල හැක.

**විලෝපිත මයිටා බෝකිරීමේ විද්‍යාගාර ඉදිකිරීම:** පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන ඇමතිතුමාගේ නියෝගය පිළිපදිමින් පොල් පර්යේෂණ ආයතනය විලෝපිත මයිටා බෝකිරීමේ විද්‍යාගාර 11 ක් ඉදි කිරීමට කටයුතු කරන ලදී. මෙම විද්‍යාගාර අමාත්‍යාංශය යටතේ පාලනය වන පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය, කුරුණෑගල වැවිලි සභාගම සහ හලාවත වැවිලි සභාගමට අයත් පරිශ්‍රයන් තුල ඉදිකර ඇත. ගෙවී ගිය වසර තුල විලෝපිත මයිටා මළු 48,850 ක් වගාකරුවන් වෙත නිකුත් කරන ලදී. මෙම මයිටා මළු ලබාගත් වගාකරුවන් නැවත නැවතත් මයිටා මළු දිගින් දිගටම ඉල්ලුම් කිරීම තුලින් ඔවුන් තුල පොල් මයිටා (*Aceria guerreronis*) පාලනය කිරීම සඳහා විලෝපිත මයිටා (*Neoseuilus baraki*) යොදාගැනීමේ ජෛව විද්‍යාත්මක පාලනය කෙරෙහි විශ්වාසනීයත්වයක් ගොඩනැඟී ඇති බව පිළිඹිබු වේ.



**මොණරාගල දිස්ත්‍රික්කයේ පාංශු සිතියම සැකසීම:** උතුරු නැගෙනහිර පළාතේ පොල් වගාව සඳහා පාංශු යෝග්‍යතාවය අනුව ඉඩම් සිතියම්කරණය කිරීමේ වැඩසටහනේ ප්‍රථම පියවර ලෙස 2012 වසරේදී මොණරාගල දිස්ත්‍රික්කයේ සිතියම්කරණය නිමා කරන ලදී. මෙම සිතියම්කරණය යටතේ ප්‍රධාන පාංශු කාණ්ඩ 8 ක් යටතේ පාංශු වර්ග 33ක් හඳුනාගන්නා ලදී. මෙම දිස්ත්‍රික්කය තුල අවුරුද්දකට හෙක්ටයාරයකට ගෙඩි 15,000 කට වැඩි විභවයක් ඇති $S_1$ වර්ගයේ පාංශු දක්නට නොලැබුණද අවුරුද්දකට හෙක්ටයාරයකට ගෙඩි 12,500 - 15,000 ක විභවයක් ඇති $S_2$ වර්ගයට අයත් හෙක්ටයාර 17,000 ක්ද, අවුරුද්දකට හෙක්ටයාරයකට ගෙඩි 10,000 – 12,5000 විභවයක් ඇති $S_3$ වර්ගයට අයත් හෙක්ටයාර 90,000 ක්ද හඳුනාගෙන ඇත. $S_4$ සහ $S_5$ වර්ගයට අයත් භූමි ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 116,000 ක් සහ 28,300 ක් වේ. මේ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ පොල්



Map of Moneragala District

සංවර්ධනය සඳහා විශාල භූමි ප්‍රමාණයක් තිබෙන බව පෙනී යන අතර පාරම්පරික ලෙස පොල් වගා නොකෙරෙන ප්‍රදේශ වල පොල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා මෙම තොරතුරු ඉතාමත් වැදගත් වේ.

**පොල් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා කියුබා සහයෝගිත්වය:** පොල් සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් ශ්‍රී ලංකා රජය සහ කියුබාව අතර මෑතකදී අත්සන් කරන ලද ද්විපාර්ශ්වික සහයෝගීතා වැඩසටහනේ අංගයක් ලෙස පොල් සංවර්ධනය සඳහා දෙරට තුල සහයෝගීතා වැඩසටහනක් ආරම්භ කිරීමට ලබාගත් තීරණයට අනුව පොල් පර්යේෂණ ආයතනය සහ කියුබානු තානාපති අතිගරු ඉන්දිරා ලෝපේස් මහත්මිය සමඟ සාකච්ඡා කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකාව කියුබානු රාජ්‍යයට දියුණු කල පොල් ප්‍රභේද ලබා දීමටත් එම රටේ වගා සහ කර්මාන්තකරුවන් පොල් වගාව සහ සැකසුම් කර්මාන්ත සඳහා පුහුණු කිරීමටත් එකඟත්වය පලකරන අතර කියුබානු විද්‍යාඥයන් පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වැඩවලට දායකත්වය ලබාදීමටත් එකඟවේ. මෙහිදී විශේෂයෙන්ම කියුබාවේ ඉතාමත්ම දියුණු තත්ත්වයේ පවතින ජෛව තාක්ෂණ විද්‍යාඥයන් මගින් පොල් පටක රෝපණ සහ අභිජනන පර්යේෂණ වලට තාක්ෂණික දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.



කියුබානු ජනරජයේ ශ්‍රී ලංකා තානාපති අතිගරු ඉන්දිරා ලෝපේස් මහත්මිය, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා සහ පොල් පර්යේෂණ ආයතනයේ සභාපති මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානය 2012 දෙසැම්බර් මස 4 වන දින නැරඹූ අවස්ථාව

**පොල් තෙල් වල යහපත් සෞඛ්‍ය ගුණාංග සොයා බැලීම සඳහා කැළණිය විශ්ව විද්‍යාලය සමඟ පර්යේෂණ දියත් කිරීම:** පොල් පර්යේෂණ ආයතනය සහ කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඒකාබද්ධ වෙමින් පොල් තෙල් වල යහපත් සෞඛ්‍ය ගුණාංග හඳුනා ගැනීම සඳහා පර්යේෂණ දියත් කිරීමට අවබෝධතා ගිවිසුමකට 2012 මැයි මස 14 දින එළඹෙන ලදී. මෙම ගිවිසුම සඳහා පොල් පර්යේෂණ ආයතනය වෙනුවෙන් සභාපති මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා සහ කැළණිය විශ්ව විද්‍යාලය වෙනුවෙන් උපකුලපති මහාචාර්ය සරත් අමුණුගම මහතා අත්සන් තබන ලදී.



පොල් පර්යේෂණ මණ්ඩලයේ සභාපති මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා සහ කැළණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති මහචාර්ය සරත් අමුණුගම මහතා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාව

පොල් පර්යේෂණ ආයතනය මෙවැනි ගිවිසුමකට එළඹීමට හේතුවූයේ ඉදිරියේදී වැඩිවන ජනගහනයත් සමඟ පොල් තෙල් භාවිතය සඳහා ජනතාව උනන්දු කිරීම තුලින් ආනයනය කරන වෙනත් ශාක තෙල් වර්ග අවම කර ගැනීමේ අරමුණින් පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ඉලක්කය අනුව 2016 වන විට ලංකාවේ පොල් නිෂ්පාදනය දැනට පවතින මිලියන 2800 සිට 3650 දක්වා ඉහළ නැංවීම තුලින් පරිභෝජනය සඳහා අවශ්‍ය පොල් තෙල් නිෂ්පාදනය වැඩිකර ගැනීමට හැකිවනු ඇත. එම නිසා පොල් තෙල් පරිභෝජනය වැඩිකිරීම තුලින් ආහාර සඳහා ශාක තෙල් වර්ග ගෙන්වීමට වැය වන විදේශ විනිමය අඩු කර ගත හැකි වේ.

**වැලිගම කොළ මැළවීමේ රෝගය සඳහා ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයෙන් ආධාර:** ලෝක ආහාර සංවිධානය මඟින් වැලිගම කොළ මැළවීමේ රෝගය කළමනාකරණය කිරීම සඳහා දෑවුරුදු තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස 2012 සහ 2013 වසර වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 309,000 ක් ප්‍රධානය කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් රෝග විනිශ්චය, අණුක ජීව විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගනිමින් පහසුවෙන් ඉටුකර ගැනීම, GIA/ GPS තාක්ෂණය යොදා ගනිමින් රෝග පැතිරීම විනිශ්චය කිරීම, රෝග තත්ත්වය සහ ව්‍යාප්තිය කළමනාකරණය කිරීම යන කරුණු කෙරෙහි ජාත්‍යන්තර විද්‍යාඥයන් ලබා දීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රථම රැස්වීම 2012 ජූනි මස 8 දින පොල් පර්යේෂණ ආයතනයේදී ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ ජ්‍යෙෂ්ඨ වගා සංරක්ෂණ නිලධාරී ආචාර්ය පියෝ යන්ෆැන්, ලෝක ආහාර සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත ආචාර්ය පී. කුරුප්පුආරච්චි සහ ව්‍යාපෘතියේ ප්‍රධාන විශේෂඥ ආචාර්ය පී. රෙතිනම් යන අයගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.



ආචාර්ය පී. රෙතිනම් මහතා ප්‍රථම රැස්වීමේදී චාරිත්‍රානුකූල පොල් තෙල් පහන දැල්වීම

**4 වන වැව්ලි භෝග පර්යේෂණ සම්මන්ත්‍රණය:** 2012 ඔක්තෝබර් 20-21 යන දිනයන්හි කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පැවති 4 වන වැව්ලි භෝග පර්යේෂණ සම්මන්ත්‍රණයට පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් සක්‍රීය ලෙස සහභාගී වන ලදී. මෙම උත්සවයේ සමාරම්භක අවස්ථාවට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා අමාත්‍යාංශය වෙනුවෙන් සහභාගී වන ලදී. සමාරම්භක උත්සවයෙන් අනතුරුව පැවති

තාක්ෂණික සැසිවාර වලට ශාක අභිජනනය සහ ප්‍රචාරණය, ඉඩම් සහ භෝග කළමනාකරණය, පස සහ පරිසරය, අගය වැඩිකිරීම සහ සැකසුම් සංවර්ධනය, සමාජ ආර්ථික ප්‍රවේශ සහ තාක්ෂණය හුවමාරු කිරීම යන තේමා යටතේ යටතේ පොල්, රබර් තේ සහ උක් පර්යේෂණ ආයතනයන්හි විද්‍යාඥයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මෙම පර්යේෂණ පත්‍රිකා වලට පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් විසින් මෑතකදී කරන ලද පර්යේෂණ සම්බන්ධව පර්යේෂණ පත්‍රිකා හයක් ඇතුලත් විය.




පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නිහාල් සෝමවීර මහතා
4 වන වැවිලි භෝග පර්යේෂණ සම්මන්ත්‍රණයේ සමාරම්භක අවස්ථාව ඇමතීම

පොල් පර්යේෂණ ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය 2011 අප්‍රියෙල් මස අනුමත වීමත් සමඟම ආයතනයේ සේවක සංඛ්‍යාව ශක්තිමත් කිරීම දිගින් දිගටම කරගෙන යන ලදී. ගෙවී ගිය වසරේ පුරප්පාඩු 83 ක් පිරවීමට කටයුතු කරන ලද අතර වර්තමාන සමස්ථ සේවක සංඛ්‍යාව 302 දක්වා වැඩිකර ගැනීමට සමත්වී ඇත. අළුතින් බඳවා ගන්නා ලද සේවක කාණ්ඩ ආයතනයේ අවශ්‍යතා වලට ප්‍රමුඛත්වය දෙමින් පර්යේෂණ, පරිපාලන සහ වතු අංශ වල පැතිරී යන සේ යෙදවීමට කටයුතු කර ඇත. වර්තමානයේ සමස්ථ සේවක සංඛ්‍යාවෙන් ඉහළ අනුපාතයක් නව බඳවා ගැනීම් නිසා එම සේවකයින් නිසි පුහුණුවීම් වලට භාජනය කර ආයතනයේ ඉලක්ක කරා වගකීම් සහිතව සේවය කිරීමට දිරිගැන්වීම ආයතනයේ වැදගත් වගකීමක් වේ. මෙම අළුතින් බඳවාගත් නව කාර්ය මණ්ඩලයට නිවාස පහසුකම් ලබාදී අනෙකුත් සුභසාධන කටයුතු සළසා එමඟින්

ඔවුන්ට ආයතනය තුල සේවය කිරීමට සුදුසු වාතාවරණයක් ඇති කිරීමට සියළු උත්සාහයන් දරා ඇත.

ගෙවී ගිය වසර සඳහා ආයතනය සඳහා රුපියල් මිලියන 201.391 මහා භාණ්ඩාගාරය මඟින් වෙන්කර දුන් අතර එයින් රුපියල් මිලියන 156.691 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද රුපියල් මිලියන 50.70 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන්ද සමන්විය විය. මෙහිදී රජයෙන් කෙලින්ම ලබාදුන් මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 188.53 ක් වූ අතර ඉතිරි රුපියල් මිලියන 21.861 ආයතනයේ වතු වල ආදායමින් පුරවා ගන්නා ලදී. වසරේ පුනරාවර්තන වියදම් සඳහා ප්‍රගතිය 95% ක් වූ අතර ප්‍රාග්ධන වියදම් වල ප්‍රගතිය 38% ක් ලෙස නිමා වූ අතර ප්‍රාග්ධන වියදම් සත්‍ය ලෙස 55% ක ගෙවා නිමකල නොහැකි වූ වියදම් සමඟින් වාර්තා විය. ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රගතිය ප්‍රමාණවත් නොවීම තාක්ෂණ ඇගයීම් ලබාදීමේ ප්‍රමාදයද, මහා භාණ්ඩාගාරය මඟින් මුදල් නිකුත් කිරීම වසරේ අවසාන මාස වල සිදුවීම හේතු ලෙස දැක්විය හැක. කෙසේ වෙතත් ආයතනයට වසර තුලදී වැදගත් යටිතල පහසුකම් දියුණු කිරීම් ලෙස විලෝපිත මයිටා බෝකරන රසායනාගාර 3 ක් ඇති කිරීම, මිද්දෙනිය පර්යේෂණ මධ්‍යස්ථානයේ කාලගුණ දත්ත එක්කරන මධ්‍යස්ථානයක් ඇති කිරීම සහ කොහු සැකසුම සඳහා පර්යේෂණාගාරයක් ඉදිකිරීමට හැකිවුණි. මීට අමතරව ශෂ්‍ය, වගා සංරක්ෂණ සහ ශාක කායික විද්‍යාත්මක රසායනාගාර ගොඩනැඟිල්ල, පරපෝෂිත අභිජනන විද්‍යාගාරය සහ ආගන්තුක නිවාසය පිළිසකර කිරීම ද මෙම වසර තුලදී සාර්ථකව කර ගැනීමට හැකිවිය. පොල් පර්යේෂණ ආයතනයේ ඉදිරිපස වීථි ලාම්පු සවිකිරිමද, ඉදිරිපස වැට නැවත ගැසීමද ඉටු කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය සිය සුපුරුද සේවා කටයුතුද වසර තුලදී හොඳින් සපයන ලදී. බීජ උයන් මඟින් ජාතික පොල් පැල සිටුවීමේ වැඩසටහනට බීජ පොල් 1,538,174 ක් සපයා දුන් අතර වැලිගම රෝගී ප්‍රදේශ වල සිටුවීම සඳහා කොළ කුන්දිරා බීජ 143,200 ක් සපයා දෙන ලදී. පටක රෝපණ අංශය මඟින් දීකිරි පොල් පැල 65 ක් වගාකරුවන්ගේ ඉල්ලුම මත සපයා ඇත. බීජ සහතික කිරීමේ ඒකකය මඟින් වසර තුලදී පොල් පැල 414,778 ක් සහතික කර ඇත. පොල් තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රචාරණය කිරීම සඳහා ආයතනය මඟින් ගොවීන්ගේ ඉඩම් වල උපයෝගීතා පරීක්ෂණ 20 ක් ස්ථාපිත කර ඇත. රතු කුරුමිණි මර්ධනය සඳහා පෙරමෝන් නල 3,998 ක්ද පොල් මයිටා මර්ධනය සඳහා විලෝපිත මයිටා මළු 48,850 ක්ද පත්‍ර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පොල් අක්කර 9,372 ආවරණය කරමින් ආන්තරික පොහොර නිර්දේශ 110 ක්ද කාබනික් පොහොර තත්ත්ව සහතික 110 ක්ද කොහුබත් අපනයන සඳහා සහතික 47 ක්ද ගෙවී ගිය වසර තුලදී නිකුත් කර ඇත. ආයතනයේ වතු වල අභිජනනය කල එළුවන් සහ බැටළුන් 22 ක් වගාකරුවන් වෙත පොල් ඉඩම් වල සත්ත්ව පාලනය උනන්දු කරවීම සඳහා ලබාදී ඇත. ආයතනය මඟින් එකතු කරන කාලගුණ තත්ත්ව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවටද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලටද, විද්‍යාඥයන්, ගුරුවරුන් සහ වගාකරුවන්ටද අඛණ්ඩව ලබා දී ඇත. තැඹිලි කල් තබා ගැනීමේ තාක්ෂණය නිදර්ශනය කරමින් අපනයනකරුවන් 15 දෙනෙකුට තැඹිලි 200,000 ක් පමණ අපනයනය

කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාදී ඇත. සැකසුම් අංශය මඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ තාක්ෂණය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත ලබාදී ඇත.

වසර තුලදී ආයතනයේ පර්යේෂණ වැඩසටහන මුදල් ලැබීමේ ප්‍රමාදයන් පැවතුනද අඛණ්ඩව පවත්වාගන යන ලදී.

## 1. පර්යේෂණ සාධනයන් සහ විශේෂ අවස්ථා

වසර තුලදී අත්කරගන්නා ලද විශේෂ පර්යේෂණ සාර්ථකත්වයන් භෝග සංවර්ධනය, භෝග නිෂ්පාදනය, භෝග සංරක්ෂණය, පොල් සැකසුම්, සමාජ ආර්ථික සහ තාක්ෂණ හුවමාරු යන ක්ෂේත්‍ර හය යටතේ කෙටියෙන් දැක්වේ.

### 1.1 භෝග සංවර්ධනය

***ප්‍රවේණි සහ ශාක අභිජනන අංශය:*** වසර 2004 දී කප්රුවන දෙමුහුම් පොල් ප්‍රභේදය නිර්දේශ කිරීමෙන් වසර 8 කට පසුව "කප්සුවය" (CRISL 2012) හා "කප්සෙත" (CRISL 2013) නමින් නව දෙමුහුම් ප්‍රභේදයන් දෙකක් නිර්දේශ කිරීමට හැකිවිය. කප්රුවන දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය සඳහා සුදුසු හෙක්ටයාර 83 ක බිම්කඩක් හලාවත වැවිලි සමාගමට අයත් කිනියම වත්තෙන් හඳුනාගන්නා ලදී. මෙහි බිම් සකස් කිරීම මෙම වසරේ නිමකල අතර 2013 වසරේදී පැල සිටුවීම ආරම්භ කිරීමට අදාළ අවබෝධතා ගිවිසුම පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම අතර අත්සන් කිරීමට කටයුතු සූදානම් කෙරිණි.

CRIC65 දෙමුහුම් බීජ පොල් සඳහා පවතින ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා වගාකරුවන්ටම දෙමුහුම් බීජ පොල් නිපදවා ගැනීමට හැකි නව සංකල්පයක් හඳුන්වාදෙන ලදී. මේ යටතේ වගාකරුවන්ට කහ කුන්දිරා පැල ලබා දෙන අතරම දෙමුහුම් බීජ (ශ්‍රී ලංකා උස x ශ්‍රී ලංකා කහ කුන්දිරා) නිපදවීමේ තාක්ෂණ දැනුම ලබා දීමට කටයුතු කරනු ඇත.

වසර තුලදී පර්යේෂණ වගාවන්ගේ නඩත්තුව හා දත්ත ලබා ගැනීම සතුටුදායකව සිදුකරනු ලැබිණි. මයිටා හානියට ඔරොත්තුදීමේ හැකියාව ඇති දෙමුහුම් ප්‍රභේද නිපදවීමේ අරමුණින් සිදුකල දෙමුහුම් දෙකක පැල 580 ක් වියළි කලාපයේ වනාතවිල්ලුව හා මුන්දලම ප්‍රදේශ වල සිටුවන ලදී . මෙම දෙමුහුම් පැල 122 කින් වල්පිට වත්තේද නිරීක්ෂණ වගාවක් ලෙස ස්ථාපනය කෙරිණි. පර්යේෂණ වගාවන්, නිරීක්ෂණ වගාවන් සහ උපයෝගීතා පර්යේෂණ තුල පැවති පුරප්පාඩු සඳහා නව පැල මහ කන්නයේ ආරම්භයත් සමඟ සිටුවන ලදී. අඹකැලේ බීජ පොල් උයනේ වගාකර ඇති "ශ්‍රී ලංකා කහ කුන්දිරා ගහණයේ ජානමය සංයුතිය, රූපීය හා ජාන පිටපත්

සාධක නිර්ණය කිරීම" සඳහා වූ ව්‍යාපෘතියට ජාතික පර්යේෂණ කවුන්සිලයේ (NRC) මූල්‍ය දායකත්වය ලබා ගැනීමට හැකිවිය. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ අඹකැලේ බීජ පොල් උයනේ ඇති නුමුහුම් කහ කුන්දිරා මව්ශාක හඳුනා ගැනීම වන අතර එහි ප්‍රතිඵල වඩාත් සමජාතීය බීජ පොල් නිපදවීමට උපකාර වනු ඇත.

ඉන්දියාව සහ පිලිපීනයෙන් පොල් වර්ග ලබා ගැනීමට අපේක්ෂිත වුවද එම රටවල අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාදවීම නිසා මේ වසර තුලදී එය ඉටුකර ගැනීමට නොහැකි විය. එසේ වුවද අයිවරි කෝස්ට් රාජ්‍යයෙන් ගෙන්වා ගත් කළල වලින් ලබාගත් මලයානු රතු කුන්දිරා පැළ 6 ක් සහ මලයානු කහ කුන්දිරා පැල 5 ක් බණ්ඩිරිප්පුව වත්තේ විදේශ ජාන සම්පත් සංචිතයේ සිටුවන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේම ලබාගත් තවත් කළල රෝපිත විදේශීය පොල් වර්ගයන්ගේ පැළ ලබන වසර තුල ක්ෂේත්‍රයේ සිටුවීමට අපේක්ෂිතය.

පොල් වගා කරන දිස්ත්‍රික්ක 5 ක (පුත්තලම, කුරුණෑගල, යාපනය, මන්නාරම සහ ගම්පහ) ආවරණය වන පරිදි දෙමුහුම් ප්‍රභේදයන්ගේ උපයෝගීතාවය ඇගයීම සඳහා උස x දුඹුරු කුන්දිරා සඳහා පරීක්ෂණ වගා 7 ක්ද, සැන්රාමන් x දුඹුරු කුන්දිරා සඳහා පරීක්ෂණ වගා 7 ක්ද වශයෙන් උපයෝගීතා පරීක්ෂණ ස්ථාපිත කරන ලදී. දුඹුරු කුන්දිරා දෙමුහුම් ප්‍රභේද ඇගයීම, විදේශීය පොල් පරාග මුහුම් කල දෙමුහුම් ප්‍රභේද ඇගයීම, වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට හා ඇසෙරියා මයිටා හානියට ඔරොත්තු දෙන පොල් වර්ග/ප්‍රභේද හඳුනා ගැනීම, පර්යේෂණ ආයතනයේ වතු වල මෙන්ම ගොවීන්ගේ වතු වලද කුන්දිරා x කුන්දිරා ප්රභේද ඇගයීම, ඇසෙරියා මයිටා හානියට ඔරොත්තු දෙන ප්‍රභේද සහ දකුණු පළාතේ වැලිගම කොල මැළවීමේ රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද අභිජනනයේදී QTL ජාන පිටපත් සාධක විභේදනය වීම අධ්‍යයනය කිරීම සහ ජාන සම්පත් සංචිත වැඩි දියුණු කිරීම යන ව්‍යාපෘතීන් මෙම වසර තුල සාර්ථකව කරගෙන යන ලදී.

පසුගිය වසරේ නිම කරන ලද විදේශීය මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක වූ Crop Diversity Trust ව්‍යාපෘතියේ නිර්දේශ පරිදි රන් තැඹිලි පැල 50 ක් වගාකරුවන්ට නොමිළයේ ලබා දීමට කටයුතු කරන ලදී. දේශීය වශයෙන් වැදගත් වන රන් තැඹිලි ජාන ප්ලාස්ම සංරක්ෂණය සඳහා මෙය ඉවහල් වනු ඇත. කළල රෝපණ තාක්ෂණය භාවිතා කර නලස්ථව නියඟයට ඔරොත්තු දෙන ලෙස තෝරා ගත් රන් තැඹිලි හා තවත් දේශීය ප්‍රභේද කිහිපයක පැළ මෙම වසරේ ක්ෂේත්‍ර ජාන සම්පත් සංචිතයේ සිටුවීමට නියමිතය.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශයේ සේවාවන් ලෙස කොළ කුන්දිරා ගෙඩි 94,161 ක් වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය ව්‍යාප්තව ඇති දකුණු පළාතේ ප්‍රදේශ වල රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති ප්‍රභේදයක් ලෙස වගා කිරීම සඳහා තවාන් කරන ලදී. පල්ලම බීජ පොල් උයනේ සැන්රාමන් මව්ශාක 97 ක් අත්පරාගනය කර සැන්රාමන් පැළ 2148 ක් නිපදවන ලද අතර එයින් පැළ 1397 ක් පල්ලම බීජ පොල් උයනේ සිටුවන ලද අතර තවත් පැළ 750 ක් යෝජිත කිනියම කප්රුවන බීජ පොල් උයන සඳහා වෙන්කරන ලදී. මෙයට අමතරව උස වර්ගයේ මව්ශාක 100 ක් සහ සැන්රාමන් මව්ශාක 23 ක් අත්පරාගනය කර උස x දුඹුරු කුන්දිරා ගෙඩි 2729 ක්, සැන්රාමන් x දුඹුරු කුන්දිරා ගෙඩි 1509 ක් සහ සැන්රාමන් ගෙඩි 2038 ලබා ගන්නා ලදී. මෙම බීජ වලින් ලබා ගන්නා ලද උස x දුඹුරු කුන්දිරා පැළ 349 ක් සහ සැන්රාමන් x දුඹුරු කුන්දිරා පැළ 503 ක් වගාකරුවන් වෙත නිකුත් කිරීමට කටයුතු කරන ලදී. මීට අමතරව උස x උස සහ උස x සැන්රාමන් දෙමුහුම් ප්‍රභේද නිපදවීම සඳහා, පල්ලම බීජ පොල් උයනේ සැන්රාමන් මව්ශාක වලින් ලබාගන්නා සැන්රාමන් පරාග නල 11 ක් අඹකැලේ බීජ පොල් උයනටද 40 ක් හලාවත වැව්ලි සමාගමේ පලුගස්වැව වත්තටද ලබා දෙන ලදී. මෙම වසර තුලදී උස x සැන්රාමන් දෙමුහුම් බීජ පොල් 24,997 ක අස්වැන්නක් ලබා ගත් අතර එයින් බීජ පොල් 23,419 ක් පැළ නිපදවීම සඳහා පොල් පර්යේෂණ ආයතනයේ වතු අතර බෙදා දෙන ලදී. බීජ පොල් උයනක් ස්ථාපනය කර මහා පරිමාණ වශයෙන් බීජ පොල් නිපදවන තෙක් අත් පරාගණය මඟින් සුළු පරිමාණයෙන් උස x දුඹුරු කුන්දිරා (කප්සුවය) බීජ පොල් නිපදවීමට පල්ලම බීජ පොල් උයනේ කෙහෙල්හේන කොටස සඳහා සුදුසු බව 2011 වසරේදී හඳුනාගන්නා ලදී. මේ සඳහා එම ක්ෂේත්‍රයේ උස වර්ගයේ පැළ 810 ක් හා දුඹුරු කුන්දිරා පැළ 40 ක් සිටුවන ලදී. තවත් උස වර්ගයේ පැළ 1029 ක් සිටුවීම සඳහා ක්ෂේත්‍රය සකස් කලද 2012 වසර තුල පැවති නියඟය නිසා පැළ සිටුවීමට නොහැකි විය. අඹකැලේ බීජ පොල් උයනේ නැවත වගාව සඳහා උස x උස වර්ගයේ බීජ පොල් ලබා ගැනීමට 11A ක්ෂේත්‍රයේ මව්ශාක අත්පරාගනය කරන ලද අතර මුල්ම අස්වැන්න 2012 නොවැම්බර් මස ලබාගන්නා ලදී. එම පොල් පැළ ක්ෂේත්‍ර අංක 4 හි යටිවගාව සඳහා 2013 මහකන්නයේදී



රූපය 3 - කිනියම බීජ පොල් උයනේ දුඹුරු කුන්දිරා සහ සැන්රාමන් සිටුවීම



රූපය 4 - දුඹුරු කුන්දිරා ශාකයක්

සිටුවීමට අපේක්ෂිතය. ක්ෂේත්‍ර අංක 9 හි පැරණි කුන්දිරා වගාව ඉවත් කිරීමට කහ කුන්දිරා පැළ 696 ක් යටිවගා කරන ලදී. 11A ක්ෂේත්‍රයේ පාඩු සිටුවීම සඳහා කොළ කුන්දිරා පැළ 450 ක්ද සපයන ලදී.

පොල් වගා කිරීමේ මණ්ඩලයේ බීජ තේරීමේ නිලධාරීන්, නවක පත්වීම්ලාභී පොල් සංවර්ධන නිලධාරීන්, පොල් පර්යේෂණ ආයතනයේ වතුඅධිකාරීවරුන් සහ බන්ධනාගාර නිලධාරීන් බීජ හා මව්ශාක තේරීම හා තවාන් පාලනය පිළිබඳව පුහුණු කිරීමට අංශයේ නිලධාරීන් පුහුණු වැඩසටහන් 4 ක් පවත්වන ලදී. තවද තාක්ෂණ හුවමාරු අංශය මඟින් සංවිධානය කරනු ලබන අනෙකුත් පුහුණු වැඩසටහන් සඳහාද අංශයේ නිලධාරීන් දායකත්වය සපයන ලදී. තාක්ෂණ හුවමාරු අංශය මඟින් සංවිධානය කරන ලද "පොල් නැවත වගා කිරීම" එක්දින වැඩමුළුව අඹකැලේ බීජ පොල් උයනේදී වගාකරුවන් 250 ට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී. උපාධි හා පශ්චාද් උපාධි අධ්‍යයන සිසුන් කිහිපදෙනෙකුගේ පුහුණු කටයුතු අණුක විද්‍යා විද්‍යාගාරයේ සිදුකරන ලද අතර විවිධ කෘෂිකර්ම විද්‍යාල වලට අනුයුක්ත සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලටද අංශයේ නිලධාරීන් දායකවන ලදී.

***පටක රෝපණ:*** ක්ලෝනීකරණය සඳහා නැමියාවක් දක්වන මව්ශාක තෝරා ගැනීමේ මූලික අරමුණ ඇතිව අසංසේචිත ඩිම්බකෝෂ භාවිතා කරමින් පටක රෝපණ පර්යේෂණ මේ වසර තුලදීද සිදුකෙරිණි. වැඩි දියුණු කල දෙමුහුම් ප්‍රභේද සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් සීආර්අයිසී 65, සීආර්අයිඑස්එල් 98 සහ කප්රුවන යන ප්‍රභේද ක්ලෝනීකරණ පර්යේෂණ සඳහා යොදා ගැණිනි. මෙම ප්‍රභේද අතරින් සීආර්අයිඑස්එල් 98 සහ සීආර්අයිසී 65 යන ප්‍රභේද දැනට හඳුනාගෙන ඇති රෝපණ තත්ත්ව යටතේදී හොඳ ප්‍රතිඵල ලබාදුන් අතර මව්ශාක කිහිපයකින්ම ක්ලෝන පැළ සතුටුදායක ප්‍රමාණයක් ජනනය කරගත හැකිවිය. වසර තුලදී ක්ලෝන පැළ 300 ක් පමණ ලබා ගැනීමට හැකි වූ අතර කිහිපයක් දැඩිකිරීම සඳහා පසේ සිටුවීමට හැකිවිය. දැනට භාවිතා වන පටක රෝපණ තත්ත්ව යටතේ කප්රුවන ප්‍රභේදයේ ප්‍රතිඵල සතුටුදායක නොවිණි.

විදේශීය (Bioversity International) මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වූ කළල රෝපණ ව්‍යාපෘතිය සාර්ථකව ඉදිරියට ගෙන යන ලදී. විදේශීය කළල වලින් ලබාගන්නා ලද පොල් වර්ග [Palu Tall (PT), Solomon Island Tall (SIT), Panama Tall Monagre (PNT) and Thailand Tall Sawi (THT)] වල පැළ නලස්ථව වැඩීමට ලක් කල අතර වැඩුණු පැළ දැඩි කිරීම සඳහා පසේ සිටුවීමටද හැකිවිය. ඉහත පොල් ප්‍රභේද 4 න් පැළ 214 ක් (46 PT, 53 THT, 43 SIT, and 44 PNT) පසේ සිටුවන ලද අතර සෙමින් වර්ධනය වන පැළ තවමත් නලස්ථව පවතී. විදේශීය කුන්දිරා ප්‍රභේදයක් වන මලයානු කහ සහ මලයානු රතු කුන්දිරා ප්‍රභේද වල කළල රෝපිත පැළ ක්ෂේත්‍රයේ සිටුවන ලදී. තවද මලයානු රතු කුන්දිරා සහ සැන්රාමන් වර්ග වලින් කළල

පිලිපීනයෙන් ගෙන්වා ගැනීමටද හැකිවිය. මෙම කළල රෝපිත වල ක්ෂුද්‍රජීවී ආසාදන තරමක වැඩි මට්ටමක පැවතුනද අයිවරි කොස්ට් රාජ්‍යයෙන් ගෙන්වූ කළල වලට වඩා වැඩි ප්‍රරෝහණ ප්‍රතිශතයක් අත්කරගත හැකි විය. පැළ වල මූලික වර්ධන වේගයද ශීඝ්‍රවිය. මෙම ව්‍යාපෘතියෙන් ජනනය කර ගත් දත්ත, වැඩමුළුවක් පවත්වා සාකච්ඡා කල අතර ඒ සඳහා ව්‍යාපෘතියට සහභාගී වූ ප්‍රංශය, අයිවරි කෝස්ට්, පිලිපීනය හා ඉන්දියාව යන රටවල විද්‍යාඥයින් සහභාගීවිය. ව්‍යාපෘතියේ ප්‍රතිඵල තුලින් අන්තර්ජාතික පොල් කළල හුවමාරු ක්‍රමවේදය සඳහා අත්පොතක් සකස් කිරීමටද නියමිතය.

දේශීය පොල් ප්‍රභේද 5 ක (රන් තැඹිලි, ගොන් තැඹිලි, පොරපොල්, රතු කුන්දිරා සහ බෝදිරි) කළල රෝපණ හැකියාව හා නලස්ථව ප්‍රේරණය කරන ලද නියඟ තත්ත්වයට ඔරොත්තු දීමේ හැකියාව (PEG 6000 යෙදීමෙන්) ඇගයීමට ලක්කරන ලදී. ප්‍රේරණය කරන ලද විවිධ නියඟ තත්ත්ව යටතේ ඔරොත්තු දීමේ හැකියාව දැක්වූ පැළ පසේ සිටුවන ලදී. ශ්‍රී ලංකා උස මව්ශාක කිහිපයකින් ලබාගත් පරාගධානී රෝපණය කෙරුන අතර පරාගධානී රෝපණ මාධ්‍යයට බියුටනෝල් එක් කිරීමේ බලපෑම අධ්‍යයනය කෙරිනි. ජනනය වූ අලිංගික කළල කිහිපයක් පැළ ලබාගැනීම සඳහා රෝපණය කල අතර ලබාගත් පැළ කිහිපයක් නලස්ථව වැඩෙමින් පවතී.

## 1.2 භෝග නිෂ්පාදනය

***ශෂ්‍යවිද්‍යා* :** පොල් ඵලදාව ඉහළ නැංවීම හා පොල් වගා කරන ඉඩම් වල ඵලදායීතාව ඉහළ නැංවීම තුලින් පොල් වගාවේ ලාභදායීබව වැඩිකිරීම සඳහා තාක්ෂණය දියුණු කිරීම මූලික අරමුණ කොට ශෂ්‍ය විද්‍යා පර්යේෂණ ක්‍රියාත්මක විය. ක්ෂේත්‍ර පර්යේෂණ 15 ක් හා ආදර්ශණ 20 ක් තෙතමන සංරක්ෂණය, වගා පුනරුත්ථාපනය, ජීව බලශක්ති ජනනය, කොළ පොහොර යෙදීම, වල්පැළෑටි මර්ධනය, බිම්පණු පොහොර නිෂ්පාදනය, අතුරු බෝග වගාව, සත්ත්ව පාලනය හා පොල් ආශ්‍රිත ගොවිපල පද්ධති වැනි තේමා ඔස්සේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ප්‍රධාන පර්යේෂණ වලට උපකාර වීමට අධ්‍යයනයන් කිහිපයක්ද ක්‍රියාත්මක කරන ලදී.


රූපය 5 - බද්ධ කජු පැළයක්

කජු අතුරු බෝගයක් ලෙස වගා කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලබාගත හැකි විය. බද්ධ කජු වගාවේ මල් හටගැනීමට ගතවූ කාලය අවම වූ අතර පැළ සිටුවා අවුරුදු දෙකකින් අස්වනු නෙළා ගැනීමට හැකිවිය. රිකිලි බද්ධයෙන් ලබාගත් පැළ, වායව අතු

බැඳීමෙන් ලබාගත් පැළ වලට වඩා ඉක්මනින් පීදුණ අතර  මෙම වර්ධක ප්‍රචාරණ ක්‍රම වලින් නිපදවූ කජු වගාවන්ගෙන් වසරකට ගසකින් කිලෝ ග්‍රෑම් 8 ට වඩා වැඩි අස්වැන්නක් ලබාගත හැකි විය.  වැඩි දියුණු කල කජු ප්‍රභේද වන WUCC -5, WUCC- 8 සහ WUCC- 13  ඇගයීමට ලක්කල අතර දෙවන වසරේදී මල් හටගැනීම ආරම්භ විය.  මෙම වසරේ මුල්ම අස්වැන්න ලබාගත් අතර ප්‍රභේද අතර අස්වැන්නේ සැළකිය යුතු වෙනසක් මුල් අවධියේ නිරීක්ෂණය කල නොහැකි විය.



රූපය 6 -  පොල් අල්ලියක් තුල ග්ල්රිසීඩියා පේළි 2

පොල් වගා බිම්වල ග්ලිරිසීඩියා වගාකර ලබාගත හැකි කොළ සහ දැව ජෛව බර කෙරෙහි ග්ලිරිසීඩියා පැළ ඝණත්වය සැළකිය යුතු බලපෑමක් ඇති කරන බව පස් වසරක පර්යේෂණ මඟින් පෙන්වාදුනි. මේ අනුව ග්ලිරිසීඩියා පැළ පේළි 1 ක් මඟින් ලබාගත හැකි කොළ හා දැව ජෛව බරට වඩා වැඩි ප්‍රමාණයක් පිළිවෙලින් පැළ පේළි 3 ක් හා 2 ක් යෙදීමෙන් ලබාගත  හැකි විය. එසේ වුවද, වැඩි පැළ ඝණත්වයක් ඇති විට පැළයකින් ලබාගත් අස්වැන්න අඩුවිය. සමාන පැළ ඝණත්වයක් පැළ පේළි 2 ක් හා පැළ පේළි 3 ක් වශයෙන් වැඩි පරතරයක් ඇතිව වගා කල විටද වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකිවිය.  කප්පාදු කිරීමේ උස, අස්වැන්න කෙරේ බලපෑමක් ඇති නොකරන බව පෙන්වීය.

මී ගවයින් 6 ක් (පිටතින් ගෙන එන ලද පිදුරු ආහාරයට ලබා දුනි) පොල් ගස් 150 ක් හා ග්ලිරිසීඩියා ගස් 2500 ක් සහිත හෙක්ටයාරයක ජීව බලශක්ති ඒකකයක් ඇගයීමට ලක්කරන ලදී. ජීව බලශක්ති ඒකකය ග්ලිරිසීඩියා දැව අර්ධ දහනයෙන් ක්‍රියාත්මක කල අතර ජීව වායු ජනනයට මී හරක් ගොම යොදා ගැණින.  වසර තුලදී මෙම ඒකකය මඟින් මී ගව පැටවුන් 4 ක්, කිරි ලීටර් 4200 ක්, දිනකට ජීව වායු  ලීටර් 1.2 ක් හා දර කිලෝ ග්‍රෑම් 12,000 ක් නිපදවිය.  මෙම ඒකකය මඟින් ලද මුළු ආදායම රු. 260,000/- වූ අතර ජීව වායුව නිපදවීමෙන් පසු ඉතිරිවන කාබනික පොහොර යෙදීමෙන් පොල් අස්වැන්න  106% න් වැඩිවිය.

වාණිජ මට්ටමින් දර ලබාගැනීමට ග්ලිරිසීඩියා අතුරු වගාවක් පවත්වා ගැනීමේ ආදර්ශනයක් පල්ලම වත්තේ ස්ථාපනය කරන ලද අතර වසර තුලදී ගසකින් දැව කිලෝ ග්‍රෑම් 8 ක් ලබා ගැනීමට හැකිවිය.   පොල් වගාවේ පත්‍ර වල පෝෂක තත්ත්වය අධ්‍යයනය කිරීමෙන් නයිට්‍රජන්, පොස්පරස්, මැග්නීසියම් හා කැල්සියම් යන පෝෂක ප්‍රමාණවත් මට්ටමට ඉහළින් පවතින බවත්, පොටෑසියම් ඌණතාවයක් පවතින බවත් අනාවරණය විය.  වගාවෙන් දර ඉවත් කිරීම මෙම

ඌණතාවයට හේතු වියහැකි බැවින් දර දහනයෙන් පසු ඉතිරි වන අළු නැවත වගාවට යෙදීමෙන් මෙම ඌණතාවය මගහරවාගත හැකි වනු ඇත.

බිම් පණුවන් මගින් පසේ සාරවත් බව වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කල ව්‍යාපෘතියේ ප්‍රතිඵල අනුව ගොවිපල තුල නිපදවෙන ශාක හා සත්ත්ව අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට බිම් පණු පොහොර නිෂ්පාදනය සඳහා යොමුවීම ඉතා යෝග්‍ය බව පෙන්වා දීමට හැකිවිය. බිම් පණුවන් මගින් ගොවිපල අපද්‍රව්‍ය සති 5-6 ක කාලයකදී කොම්පෝස්ට් පොහොර බවට පත් කරන බැවින් පොල් වගාව ආශ්‍රිත ගොවිපල සඳහා පරිසර හිතකාමී, අඩු වියදම් පෝෂක ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයක් ලෙස නිර්දේශ කල හැක. මෙම ව්‍යාපෘතිය යටතේ බිම්පණු පොහොර නිෂ්පාදන ඒකක 04 ක් පොල් ත්‍රිකෝණය තුල ස්ථාපිත කරන ලදී. වාණිජ මට්ටමින් බිම්පණු පොහොර නිෂ්පාදනය සඳහා උනන්දුවක් දැක්වූ පොල් වගාකරුවන් 20 ක් හා ගොවීන් 5 ක් සඳහා බිම්පණුවන් ලබාදෙන ලදී. පොල් පැල වර්ධනය හා පොල් අස්වැන්න මත බිම්පණු පොහොර යෙදීමේ බලපෑම අධ්‍යයනය කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂණ 3 ක් ආරම්භ කරන ලද අතර පැළ වගාවට බිම්පණු පොහොර යෙදීම තුලින් පැළ වල වටේ කඳ ප්‍රමාණය සැළකිය යුතු ලෙස වැඩිවූ බව නිරීක්ෂණය කිරීමට හැකිවිය. තවද කාබනික පෝෂක ප්‍රභව ලෙස ග්ලිරිසීඩියා කොළ පොහොර, එළු පොහොර හා බිම්පණු පොහොර පාදක කරගත් 100% කාබනික මිශ්‍රණ යෙදීමෙන් පැළ පොහොර මිශ්‍රණය (YPM) යෙදීම හා සමාන ප්‍රතිඵල ලබා දෙන බව සනාථ විය.

පොල් වගාවේ පස පුනරුත්ථාපනය කිරීම සඳහා ගිලිරිසීඩියා (ග්ලිරිසීඩියා සේපියම්), වල්සූරියකාන්ත (ටයිතෝනියා ඩයිවර්සිෆෝලියා) හා පැනිකම් මැක්සිමම් යන ශාක විශේෂ තනිව හෝ කිහිපයක් වගා කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. ග්ලිරිසීඩියා තනිව හෝ වල්සූරියකාන්ත සමඟ එකට වගාකිරීමෙන් වැඩිම ජෛව ස්කන්ධයක් නිපදවන බව නිරීක්ෂණය කරන ලදී. මෙම අතුරුවගාවන් සහිත ක්ෂේත්‍රයන්හි පොල් අස්වැන්නද එකිනෙකට සැළකිය යුතු මට්ටමින් වෙනස්වූ අතර වැඩිම අස්වැන්නක් වාර්තා වූයේ ග්ලිරිසීඩියා සහ පියුරේරියා යටි වගාවන් සහිත ක්ෂේත්‍රයන්හිය. මෙම ක්ෂේත්‍රයන්හි පාංශු භෞතික, රසායනික හා ජෛව විද්‍යාත්මක සාධක අධ්‍යයනය සඳහා පස් සාම්පල එක්රැස් කර ගන්නා ලදී.

පොල් වගාවේ ලාභදායීතාව සහ පොල් ඉඩම් වල සාරවත් බව ඉහළ නැංවීමට පොල් වගාවන් ආශ්‍රිතව සුළු පරිමාණයෙන් එළුවන් හා මී ගවයින් ඇතිකිරීම දිරිගැන්වීම සඳහා සත්ත්ව අභිජනන ව්‍යාපෘතියක් 1999 දී ආරම්භ කෙරිණි. මෙයට අදාළ එළුවන් අභිජනනය හා ආදර්ශණයක් පොත්තුකුලම හා රත්මලාගාර වතුවල සාර්ථකව ක්‍රියාත්මක විය. මෙම වසර තුලදී එළුවන් 120 ක් හා බැටළුවන් 30 ක්, මූරා වර්ගයේ පට්ටිගොනුන් 5 ක් මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිපලවල් වලට සහන මිළට ලබාදීමෙන් එම ගොවිපල වල සතුන්ගේ ගුණාත්මය ඉහළ නැංවීමට දායක විය. පොල් වගා බිම්වල වල් පැළෑටි මර්ධනය හා සාරවත් බව ඉහළ නැංවීම සඳහා බැටළු පාලනය දිරිගැන්වීම හා ව්‍යාප්ත කිරීම සඳහා ආදර්ශනයක් රත්මලාගාර වත්තේ ආරම්භ කරන ලදී.



රූපය 7 - පොල් ඉඩමක එළුවන් ඇති කිරීම

යූරියා හා මියුරියේට් ඔෆ් පොටෑෂ් වෙනුවට කාබනික පොල් වගාවේදී භාවිතා කල හැකි කොළ පොහොර මිශ්‍රණයක් නිර්දේශ කිරීම සඳහා පර්යේෂණ 2012 වසරේදී ආරම්භ කෙරිණි. වල්සූරියකාන්ත කොළ පොහොර පසේ සාරවත්බව ඉහළ නැංවීම සඳහා යොදා ගත හැකි කාබනික පෝෂක ප්‍රභවයක් වන අතර ශාකයේ ජෛව ස්කන්ධය නිපදවීම, පැළ සිටුවීමේ ක්‍රමය, කප්පාදු කරන වාර ගණන, පැළ ඝණත්වය හා ක්ෂේත්‍රයේ තත්ත්වය මත රඳා පවතී. මාස 8 ක් වයස ටයිතෝනියා වගාවකින් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 2.0-3.9 (වියළි බර) ජෛව ස්කන්ධයක් අස්වැන්න ලෙස ලබාගත හැක. ටයිතෝනියා ශාකයේ මෙම කොළ පොහොර තුල අඩංගු පෝෂක තත්ත්වය වියළි බර අනුව නයිට්‍රජන් 3.5% ක් හා පොටෑසියම් 4.1% ක් වන අතර එය අන් කොල පොහොර ප්‍රභවයන් හා සාපේක්ෂව ඉහළ අගයක් වේ.

විවිධ රනිල ආවරණ බෝග හා වගා කළමනාකරණ ක්‍රම සහිත පොල් වගාව ආශ්‍රිත කෘෂි වනවගා පද්ධති තුල සිදුවන පාංශු ඛාදනය සීසියම් 137 සමස්ථානිකය භාවිතයෙන් තක්සේරු කිරීමට විදේශ මූල්‍ය දායකත්වයෙන් ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණි. සීසියම් 137 සමස්ථානිකය භාවිතා කිරීම පාංශු ඛාදනය අධ්‍යයනය කිරීමේ ඍජු ඉක්මන් හා නිවැරදි ක්‍රමවේදයක් වන අතර එය එවැනි අධ්‍යයනයන් සඳහා බහුලව භාවිතාවේ. අනිකුත් පාංශු ඛාදන අධ්‍යයන ක්‍රමවේදයන් හා සංසන්දනය කරන විට මධ්‍ය පරිමාණයේ පාංශුඛාදන හා තැන්පත් වීමේ ශීඝ්‍රතාවයන් අධ්‍යයනයට වඩාත් යෝග්‍ය වන්නේ සීසියම් 137 සමස්ථානිකය භාවිතාවන ක්‍රමවේදය වේ. මෙම ව්‍යාපෘතිය ශ්‍රී

ලංකා පරමාණුක බලශක්ති අධිකාරියේ සම්පත් දායකත්වය ලබන අතර ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරියෙන් පහසුකම් සැපයීම සිදුකෙරේ.

***පාංශු හා ශාක පෝෂණ:*** අකාබනික පොහොර මෙන්ම පහසුවෙන් සපයා ගත හැකි කාබනික පෝෂක ප්‍රභවයන් භාවිතා කර පෝෂක කළමනාකරණය, පසේ ගුණාත්මය පවත්වා ගැනීම, විවිධ පාංශු වර්ග අනුව පෝෂක තත්ත්ව වෙනස්වීම අධ්‍යයනය, පාංශු පෝෂක මට්ටම වැඩිදියුණු කිරීම, ජල/පොහොර මිශ්‍රිත ජල සම්පාදනය, අංශු මාත්‍ර මූලද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනය හා සම්ප්‍රදායික නොවන පොල් වගා ප්‍රදේශ වල ඉඩම් යෝග්‍යතාවය හඳුනාගැනීම වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකරමින් අංශයේ පර්යේෂණ ක්‍රියාත්මක විය.

මේ සඳහා වසර තුලදී ක්ෂේත්‍ර පරීක්ෂණ 22 ක්, හරිතාගාර පරීක්ෂණ 3 ක්, විද්‍යාගාර පරීක්ෂණ 5 ක් සහ විවිධ අධ්‍යයනයන් කිහිපයක් මඟින් ප්‍රධාන පර්යේෂණයන් සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.

දීර්ඝ කාලයක් (වසර 20 ක්) විවිධ පොස්පරස් පෝෂක ප්‍රභවයන් වන ට්‍රිපල් සුපර් පොස්පේට්, ආනයනික රොක් පොස්පේට් හා එප්පාවල රොක් පොස්පේට් යොදන ලද පර්යේෂණයක් නිමාවූ පසු එහි ශේෂ බලපෑම අධ්‍යයනය කරන ලදී. පොහොර යෙදීම නවත්වා වසරක් ගතවූ පසුද අස්වැන්නේ හෝ පත්‍ර වල පෝෂක තත්ත්වයේ හෝ සැළකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි. දකුණු පළාතේ (මිද්දෙනිය) පාංශු වර්ග සඳහා පොස්පරස් පෝෂක ප්‍රභවයක් ලෙස ආනයනික රොක් පොස්පේට් හෝ එප්පාවල රොක් පොස්පේට් යෙදීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. වසර 5 ½ ක් මෙම පොහොර යෙදීමෙන් පසුව පත්‍ර තුල පොස්පේට් පෝෂක සංයුතියේ සැළකිය යුතු වෙනසක් නිරීක්ෂණය කල නොහැකිවූ බැවින් දකුණු පළාතේ පාංශු වර්ග සඳහාද එප්පාවල රොක් පොස්පේට් යෝග්‍ය බව නිර්දේශ කල හැක.

වසර 15 ක දීර්ඝකාලීන පර්යේෂණයක් මඟින් අකාබනික හා කාබනික පොහොර යෙදීමේ ප්‍රතිඵල අධ්‍යයනය කෙරිණි. පත්‍ර පෝෂක මට්ටමේ සැළකිය යුතු වෙනසක් දක්නට නොලැබුණ නමුත් අස්වැන්න පැහැදිලි ලෙස වෙනස් විය. කුකුල් පොහොර යෙදීමෙන් වැඩිම අස්වැන්නක් ලබාගත හැකිවූ අතර එය පොහොර නොයෙදූ විට ලැබූ අස්වැන්නට සාපේක්ෂව 118% ක්ද, අකාබනික පොහොර යෙදීමෙන් ලැබුණ අස්වැන්නට සාපේක්ෂව 105% ක්ද වැඩිවිය. පොහොර නොයෙදූ විට ලැබුණ අස්වැන්නට සාපේක්ෂව අකාබනික පොහොර යෙදීමෙන් 6% ක්, ගොම පොහොර යෙදීමෙන් 6% ක්, එළු පොහොර යෙදීමෙන් 29% ක් හා කොළ පොහොර යෙදීමෙන් 33% ක් වැඩි අස්වැන්නක් වාර්තා විය. ගැහැණු මල් හටගැනීමේ ප්‍රවණතාවයේ වෙනසද මෙයට සමාන වූ අතර වැඩිම ගැහැණු මල් ප්‍රමාණයක් හටගැනුනේ කුකුල් පොහොර යෙදූ ගස් වල බව නිරීක්ෂණය කල හැකි විය.

එන්පීකේ පොහොර සමඟ කීසරයිට් යෙදීමේදී පොටෑසියම් හා මැග්නීසියම් අතර අන්තර් ක්‍රියාකාරිත්වය අවම කිරීමේ ක්‍රමවේදයක් සෙවීමට පර්යේෂණ ක්‍රියාත්මක විය. වසර 10 කට පසු මැග්නීසියම් ප්‍රභවයක් නොයෙදූ ක්ෂේත්‍ර අස්වැන්න අවම අගයක් දැක්විය. පොහොර කවයේ අඩකට කීසරයිට්ද ඉතිරි කොටසට එන්පීකේ මිශ්‍රණයද යෙදීමෙන් වැඩිම අස්වැන්නක් හා ගැහැණු මල් හටගැනීමක් නිරීක්ෂණය කල හැකිවිය. එබැවින් මැග්නීසියම් ඌණතාවයක් ඇති ක්ෂේත්‍ර සඳහා කීසරයිට් යෙදීමේදී පොහොර කවයේ අඩකට කීසරයිට්ද ඉතිරියට එන්පීකේ මිශ්‍රණයද යෙදීම නිර්දේශ කල හැක.

කාන්දු ජල සම්පාදනය හා නල ජල සම්පාදනය යන ජල සම්පාදන ක්‍රම භාවිතා කර නිර්දේශිත පොහොර ප්‍රමාණය සමාන කොටස් 12 ක් ලෙස ජලය සමඟ මිශ්‍රකර පොල් වගාවට සැපයීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. මෙම ක්‍රමයන් 2 මඟින් පොහොර ලබාදීම තුලින්, නිර්දේශිත පොහොර ප්‍රමාණය එක්වරක් යෙදීම (ජල සැපයුමකින් තොරව), ජල සම්පාදනය පමණක් සිදුකිරීම (පොහොර යෙදීමෙන් තොරව), පොහොර යෙදීම හා ජල සම්පාදනය කිරීම, පොහොර නොයෙදීම හා ජල සම්පාදනය නොකිරීම වැනි සාමාන්‍ය වගා පාලන ක්‍රම වලට සාපේක්ෂව වැඩි අස්වැන්නක් ලබාගත හැකි බව අනාවරණය විය. මෙලෙස අස්වැන්න වැඩිවූ ප්‍රතිශතය පිළිවෙලින් (වාර්ෂික පොහොර යෙදීම හා පොහොර, ජලය නොයෙදීමට සාපේක්ෂව) 32%, 16%, 11% හා 13% ක් විය.

මොණරාගල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව දිස්ත්‍රික්ක හා යාපනය අර්ධද්වීපයේ පාංශු යෝග්‍යතාවය අධ්‍යයනය කිරීමේ ව්‍යාපෘතිය 2011 අප්‍රියෙල් මස ආරම්භ කෙරිණි. මොණරාගල දිස්ත්‍රික්කයේ සමීක්ෂණ හා යෝග්‍යතා අධ්‍යයනයන් මෙම වසරේදී නිමකරන ලදී. මේ අනුව මොණරාගල දිස්ත්‍රික්කය තුල ප්‍රධාන පාංශු ඛාණ්ඩ 9 කට අයත් පාංශු වර්ග 33 ක් හඳුනා ගන්නා ලදී. පාංශු යෝග්‍යතා ශ්‍රේණි $S_1$ (ඵලදායීතා විභවය වසරක හෙක්ටයාරයකට ගෙඩි 15,000 ට වැඩි) අයත් ප්‍රදේශ මොණරාගල දිස්ත්‍රික්කය තුල හඳුනාගත නොහැකි විය. $S_2$ ශ්‍රේණියට අයත් (වසරකට හෙක්ටයාරයකට ගෙඩි 12,500 – 15,000) ප්‍රදේශ රතු දුඹුරු ලැටසෝල් (RBL), රතු කහ පොඩ්සොලික් (RYP), චූර්ණමය නොවන දුඹුරු (NCB) හා ඇලුවියල් ප්‍රධාන පාංශු කාණ්ඩ යටතේ හඳුනා ගන්නා ලදී. මෙම $S_2$ ශ්‍රේණියට අයත් ප්‍රදේශ හෙක්ටයාර 17,800 ක් විය. $S_3$ ශ්‍රේණියට (වසරකට හෙක්ටයාරයට ගෙඩි 10,000 – 12,500) අයත් හෙක්ටයාර 90,500 ක්ද හඳුනාගත හැකිවිය. $S_4$ හා $S_5$ ශ්‍රේණි වලට අයත් හෙක්ටයාර 116,550 ක් හා 28,300 මොණරාගල දිස්ත්‍රික්කය තුල විය. ප්‍රධාන පාංශු කාණ්ඩයක් වූ සොලොඩයිස් සොලොනෙට්ස් (SS) යටතේ සැළකෙන සිත්තාරම පාංශු වර්ගය පොල් වගාවට නුසුදුසු ($N_1$) පසක් වූ අතර එහි හෙක්ටයාර 100 ක් හඳුනා ගන්නා ලදී.

සේවාවන් ලෙස වගාකරුවන් 114 දෙනෙකු සඳහා හෙක්ටයාර 3,794.33 ආවරණය වන පරිදි ආන්තරික පොහොර නිර්දේශ ලබා දෙන ලදී. අකාබනික පොහොර (343), කාබනික පොහොර (124) හා කොහුබත් (575) සාම්පල සඳහා තත්ත්ව පරීක්ෂණ සිදුකරන ලදී. වගාකරුවන් 38 ට අයත් හෙක්ටයාර 1,047 ක පාංශු සමීක්ෂණ හා යෝග්‍යතා පරීක්ෂණද සිදුකරන ලදී.

***ශාක කායික විද්‍යා:*** පොල් එලදාවේ විචල්‍යතාවයට හේතුවන කරුණු හඳුනා ගැනීම, මාසික පොල් එලදාව පුරෝකථනය කිරීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම, කාලගුණික විපර්යාස පොල් වගාවට බලපාන අන්දම සහ ඊට ඔරොත්තු දීම සඳහා ක්‍රියාමාර්ග හඳුනා ගැනීම, මිද්දෙණිය ආශ්‍රිත කුඩා පොල් ත්‍රිකෝණයේ පාංශු වර්ග වල තෙතමන සංරක්ෂණය, විවිධ පොල් වර්ග වල මූල පද්ධතියේ විහිදීම හා කායික විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම හා වැලිගම පොල් කොළ මැළවීමේ රෝගයේ පැතිරීම චන්ද්‍රිකා ඡායාරූප මඟින් අධ්‍යයනය කිරීම යන තේමා ඔස්සේ ශාක කායික විද්‍යා පර්යේෂණ ක්‍රියාත්මක විය.

පොල් එලදාවේ විචල්‍යතාව තීරණය කරන කාලගුණික සාධක හා ශාක කායික ක්‍රියා හඳුනා ගැනීමේ පර්යේෂණ $WL_3$ (ගම්පහ දිස්ත්‍රික්කය) හා $IL_{1a}$ (කුරුණෑගල දිස්ත්‍රික්කය) දේශගුණික කලාප වලින් තෝරා ගත් අවුරුදු 27-28 වයස් කාණ්ඩයේ උස x උස වර්ගයේ වගාවන් භාවිතා කර සිදුකරන ලදී. පොල් වල්ලක මුල් මාස කිහිපය තුල ඉතිරි වන බැට්ටා සංඛ්‍යාව එලදාව තීරණය කරන ප්‍රධාන සාධකය වන අතර එය එම මල විවෘත වූ මාසයේ පවතින කාලගුණික සාධක මත රඳා පවතින බව අනාවරණය විය. වසරක් තුලදී ඉතිරි වන බැට්ටා සංඛ්‍යාව වැඩිම අගයක් ගත්තේ $WL_3$ කලාපයේදී මාර්තු, අප්‍රියෙල් හා මැයි කාලයේදී හා $IL_{1a}$ කලාපයේදී මාර්තු, අප්‍රියෙල් කාලයේදී බව නිරීක්ෂණය කරන ලදී. මේ නිසා 2013 වසරේදී $WL_3$ කලාපයේ වැඩිම අස්වැන්න ජනවාරි සිට මාර්තු දක්වාත් $IL_{1a}$ කලාපයේදී ජනවාරි සිට පෙබරවාරි දක්වාත් බලාපොරොත්තු විය හැක. $WL_3$ කලාපයේ ජනවාරි/පෙබරවාරි අස්වැන්න 2012 සමාන කාලයේ අස්වැන්න මෙන් 50% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එසේ වුවද 2012 වසරේ අගෝස්තු - සැප්තැම්බර් කාලයේදී බලපැවැත්වූ දරුණු නියඟ තත්ත්වය නිසා 2013 වාර්ෂික අස්වැන්න 2012 හා සසඳන විට අඩු අගයක් ($WL_3$ 12% ක් හා $IL_{1a}$ 34%) වනු ඇත. තවද 2012 වසර හා සන්සන්දනය කරන විට ගසක පොල් එලදාව අවම වනුයේ (50%) 2013 මැයි, ජූනි කාලයේදීය. වසර 2009 – 2012 කාලය තුල මාසික බැට්ටා වර්ධනයේ විචල්‍යතාව හා එයට බලපාන ලද පරිසර සාධක (උෂ්ණත්වය හා තෙතමනය) හා ශාක කායික ක්‍රියා (ගැහැණු මල් නිෂ්පාදනය හා පෝෂක සඳහා ඇති තරඟකාරී බව) අතර සබඳතාව මඟින් එලදාව පුරෝකථනය කිරීමට ගණිතමය ක්‍රමවේදයක් ගොඩනැඟීමට අවධානය යොමු කරන ලදී. 2014 වසරේ එලදාව පුරෝකථනය කිරීම සඳහා ඉහත දැක්වූ දේශගුණික කලාපයන්හි ක්ෂේත්‍ර වලට අමතරව පුත්තලම, කුරුණෑගල, ගම්පහ හා

කුලියාපිටිය යන ප්‍රදේශ වල පොල් ගස් 120 බැගින් වූ ක්ෂේත්‍ර තෝරා ගෙන 2013 ජනවාරි සිට දත්ත එක්රැස් කිරීම ආරම්භ කරන ලදී. විවිධ පොල් වර්ග සඳහා පත්‍ර කිරුලේ මුළු ප්‍රභාසංස්ලේෂණය ගණනය කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳ අධ්‍යයනය කිරීමේ පර්යේෂණ තුලින් උස x උස හා කොළ කුන්දිරා x උස වර්ග සඳහා ගණිතමය ක්‍රම හඳුනාගන්නා ලදී. එලදා විචල්‍යතාවය සඳහා ශාකයේ පෝෂක නිෂ්පාදනයේ දායකත්වය මේ දත්ත තුලින් අධ්‍යයනය කිරීමට හැකිවනු ඇත.




පොල් වගාකරන ප්‍රදේශ වල කාලගුණික තත්ත්වයේ වෙනස්වීම් අධ්‍යයනය කිරීම සඳහා කාලගුණික දත්ත සංචිතයක් ආරම්භ කරන ලදී. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානය, අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානය, බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය (පුත්තලම දිස්ත්‍රික්කය) සහ මාදුරුඔය ජාන සම්පත් මධ්‍යස්ථානය (පොළොන්නරුව දිස්ත්‍රික්කය) යන පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ මධ්‍යස්ථාන වලින් ලබාගත් කෘෂි-කාළගුණ විද්‍යා දත්ත අනුව මිමි. 1710.2, මිමි. 1449.1, මිමි. 2020.1 සහ මිමි. 1948.4 ක වර්ෂාපතනයෙක් මෙම වසර තුල වාර්තා වී ඇති අතර ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් කාලයේදී මුළු වර්ෂාපතන පිළිවෙලින් 65%, 64%, 54% සහ 71% ක අගයක් ගනී. පුත්තලම දිස්ත්‍රික්කයේ පාංශු ජල තුලිතතාවයේ වෙනස්වීම් සඳහා කාලගුණ වෙනස්කම් වල බලපෑම අධ්‍යයනය කිරීමට නව පර්යේෂණයක් ආරම්භ කරන ලදී. වර්ෂාපතනය හා වායුගෝලීය උෂ්ණත්වය ඇසුරෙන් උත්ස්වේදනය හා පාංශු ජල තුලිතතාවය ගණනය කරන ලදී. පුත්තලම දිස්ත්‍රික්කයේ කාලගුණ විපර්යාස ජල තුල්‍යතාවය කෙරෙහි ඇතිකල බලපෑම අධ්‍යයනය කිරීමට පර්යේෂණයක් ආරම්භ කරන ලදී. වර්ෂාපතනය හා උෂ්ණත්වය යන කාලගුණික දත්ත භාවිතා කර උත්ස්වේදන විභවය හා ජල තුල්‍යතාවය ගණනය කරන ලදී. ජල ඌණතාවයක් නැති විටදී, අධික උෂ්ණත්වය පරාග වල ගුණාත්මය මත බලපෑමක් ඇති නොකරන බවත් පරාග ප්‍රරෝහණය හා බැට්ටා ඇතිවීම මත සෘණාත්මක බලපෑමක් (ජල සම්පාදන තත්ත්ව යටතේදීත්) ඇති කරන බවත් අනාවරණය විය. අධික උෂ්ණත්වය හා ජල වාෂ්ප ඌණතාවය මගින් පරාග නිපදවීමේ හා පරාගනය සිදුවන

කාලයේදී ඇතිවන බලපෑම නිසා පරාග වල ගුණාත්මය හා බැට්ටා හටගැනීම වෙනස්වන අයුරු මාදුරුඔය පර්යේෂණ මධ්‍යස්ථානයේදී (වියළි කලාපයේ) ජල සම්පාදන තත්ත්ව යටතේ අධ්‍යයනය කරන ලදී.

කාලගුණික විපර්යාස වලට ඔරොත්තු දිය හැකි ප්‍රභේද හඳුනා ගැනීම සඳහා දෙමුහුම් ප්‍රභේද වල එල දරන අවධියේ ස්ථායීතාවය විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ අධ්‍යයනය කරන ලදී. මේ සඳහා එල දරණ මුල් කාලයේ පසුවන (පැළ සිටුවා වසර 7-8 හා පීදීමෙන් වසර 4-5 වූ) උස x උස (සීආර්අයිසී 60, TT), උස x සැන්රාමන් (සීආර්අයිඑස්එල් 98, TSR), කොළ කුන්දිරා x සැන්රාමන් (කප්රුවන, DGSR), කොළ කුන්දිරා x උස (සීආර්අයිසී 65, DGT), උස x දුඹුරු කුන්දිරා (TDB), දුඹුරු කුන්දිරා x උස (DBT) සහ දුඹුරු කුන්දිරා x සැන්රාමන් (DBSR) යන දෙමුහුම් ප්‍රභේද වනාතවිල්ලුව (වියළි කලාපය, $DL_3$) සහ රද්දෙගොඩ (වියළි අතරමැදි කලාපය, $IL_{1a}$) ක්ෂේත්‍රයන්හිදී ඇගයීමට ලක්කරන ලදී. මෙම ප්‍රභේදයන්ගේ උෂ්ණත්වයට ඔරොත්තුදීමේ හැකියාව අධ්‍යයනය කිරීම සඳහා පරාග ප්‍රරෝහණය විවිධ උෂ්ණත්ව පරාස යටතේ නලස්ථව පිරික්සන ලදී. උෂ්ණත්වය සමනය කර පොල් වගාවේ එලදැරීම සඳහා බලපාන පාරිසරික සාධක යහපත් වූ ක්ෂුද්‍ර පරිසරයක් වියළි කලාපයේ මිශ්‍ර වගාවන් තුල ඇත්දැයි සොයා බැලීම සඳහා නව පර්යේෂණයක් ආරම්භ කරන ලදී. පුත්තලම ($DL_3$) ප්‍රදේශයේ පොල්-කජු මිශ්‍ර වගාවක්ද, අනුරාධපුර ($DL_{1b}$) ප්‍රදේශයේ පොල්-පේර හා පොල්-කෙසෙල් වගාවන්ද ඇගයීමට ලක්කෙරිනි. මෙහිදී ලැබුණ කැපී පෙනෙන නිරීක්ෂණයක් නම් පොල්-කජු මිශ්‍ර වගාවේ ක්ෂුද්‍ර පාරිසරික තත්ත්වයන් (පසේ උෂ්ණත්වය, පොහොර කවයේ සෙ.මී.25 ගැඹුරින් පාංශු තෙතමනය හා පොල් කරටිය අවට වායු උෂ්ණත්වය) හා පොල් බැට්ටා වර්ධනය මධ්‍යස්ථ ජල ඌණතා (6-10% පාංශු ජලය) තත්ත්ව යටතේ යහපත් වීමය. එසේ වුවද දැඩි ජල ඌණතාවයක් (2% පාංශු ජලය) මාස 3 ට වැඩි කාලයක් බලපැවැත්වූ විට කජු ශාකය පොල් අභිබවා ජලයට තරඟකාරී වන බව දක්නට ලැබිණි. මේ අනුව අගෝස්තු සැප්තැම්බර් කාලයේදී ඉතා ඉහළ බැට්ටා වැටීමක් නිරීක්ෂණය කල අතර තනි වගාවේ බැට්ටා වර්ධනය පහළ වැටීම (20%) හා සන්සන්දනය කරන විට මිශ්‍ර වගාවේ එය 50% දක්වා ඉහළ අගයක් විය. මෙම බැට්ටා වැටීම පුත්තලම දිස්ත්‍රික්කයේ 2013 පොල් එලදාව පහළ වැටීමට හේතු වන අතර මැයි, ජූනි මාසවලදී මෙය බලාපොරොත්තු විය හැක.

පොල් වගාවක (තනි වගාවක) කාබන් තිරකිරීමේ හා කාබන් ගබඩා කිරීමේ විභවය ගණනය කිරීමෙන් අනතුරුව පොල් මිශ්‍ර වගා පද්ධති තුල එම අගයන් ගණනය කිරීම සඳහා තෙත්, අතරමැදි හා වියළි කලාපවල ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී. දත්ත රැස්කිරීම 2013 ජනවාරි සිට ආරම්භ කිරීමට නියමිතය.

මිද්දෙණිය ආශ්‍රිත කුඩා පොල් ත්‍රිකෝණය ලෙස නම් කර ඇති ප්‍රදේශයට යෝග්‍ය දෙමුහුම් ප්‍රභේද ඇගයීමට හා නියඟ තත්ත්වයට ඔරොත්තු දීම සඳහා තෙතමන සංරක්ෂණ ක්‍රම භාවිතා කිරීම ප්‍රචලිත කිරීමේ ආදර්ශණයක් ලෙස මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානයේ ස්ථාපනය කල පර්යේෂණ වගාව සාර්ථකව පවත්වාගෙන යන ලදී. වසර තුනක කාලයක් තුලදී සීආර්අයිසී 65 හා කප්රුවන දෙමුහුම් ප්‍රභේද වල 80% ක පිදීමක් නිරීක්ෂණය කල අතර උස වර්ගයේ (සීආර්අයිසී 60, සීආර්අයිඑස්එල් 98 හා රුමස්සල සංරක්ෂිත වගා දර්ශය) එම අගය 30% ක් විය. වසර 4 ක් අවසානයේ දෙමුහුම් ප්‍රභේද 100% ක් ද උස ප්‍රභේද 80% ක් ද පිදුණ අතර වසර 5 ක් අවසන් වන විට පාඩු සිටවූ පැළ හැර ඉතිරි සියළු පැළ පිදීම නිරීක්ෂණය කල හැකිවිය. පැළ පිදීම, පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රම භාවිතා කල ක්ෂේත්‍ර වල වැඩිම අගයක් පෙන්වූ අතර ජල සම්පාදනය කල ක්ෂේත්‍ර වල ජල සැපයුමට කඩින් කඩ බාධා ඇතිවීම හේතුවෙන් එහි පැළ පිදීම අතරමැදි තත්ත්වයක් දැක්විය. දෙමුහුම් ප්‍රභේදයන්ගේ ප්‍රශස්ථ පාරිසරික තත්ත්ව පවතින විට සැළකිය යුතු මට්ටමකින් වැඩි ප්‍රභාසංස්ලේෂණ ශීඝ්‍රතාවක් දැක්වූ අතර වියළි කාළගුණ තත්ත්ව යටතේදී එය ඉතා සුළු වෙනසක් විය. කප්රුවන හා සීආර්අයිසී65 ඵල දරන ගස් වල වාර්ෂික ඵලදාව ගසකට ගෙඩි 25-15 අතර අගයක් වූ නමුත් උස වර්ගයේ ගස් ප්‍රමාදවී පිදුණ බැවින් එය ගෙඩි 5 ක් පමණ විය.

ශ්‍රී ලංකා පොල් වර්ග විදේශීය පොල් පරාග මඟින් පරාගනය කර නිපදවන ලද නව දෙමුහුම් සහිත වගාවක (මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානයේ) ශාක කායික විද්‍යාත්මක අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. නව ප්‍රභේද 4 ක් (උස x මලයානු රතුකුන්දිරා, උස x රෙනාල් උස, උස x වැග්නනාන් උස, උස x බ්‍රසීලියන් කුන්දිරා) හා දේශීය දෙමුහුම් 3 ක් (කප්රුවන, සීආර්අයිඑස්එල් 98 සහ සීආර්අයිසී 65) මෙහිදී අධ්‍යයනය කෙරේ.

වෙනස් කෘෂි දේශගුණික කලාප හා පාංශු යෝග්‍යතා ශ්‍රේණි තුලදී විවිධ පොල් වර්ග වල මූල පද්ධතියේ විහිදීම අධ්‍යයනය කිරීම සඳහා නව පර්යේෂණයක් සැලසුම් කරන ලදී. මෙම පර්යේෂණය කෘෂි දේශගුණික කලාප 2 ක් (අතරමැදි හා වියළි) පාංශු යෝග්‍යතා ශ්‍රේණි 2 ක් ($S_2$ සහ $S_4$) තුල කප්රුවන හා සීආර්අයිඑස්එල් 98 පැළ භාවිතා කර වසර 2013 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සැටලයිට් ඡායාරූප භාවිතයෙන් වැලිගම පොල් කොළ මැළවීමේ රෝගයට පාත්‍ර වූ ගස් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා වූ පර්යේෂණ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහයෝගීතාවය හා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය ආධාරයෙන් සාර්ථකව ක්‍රියාත්මක විය. සැටලයිට් ඡායාරූපයේ වර්ණ භාවිතා කර පරිගණක ආශ්‍රිතව රෝගී ගස් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් දියුණු කිරීමේ හැකියාවක් ඇතිබව අනාවරණය විය.

පොල් පර්යේෂණ ආයතනයේ කෘෂි කාළගුණ විද්‍යා හා වර්ෂාපතන දත්ත රැස්කිරීමේ කටයුතු ශාක කායික විද්‍යා අංශයට පැවරිණි. මෙම දත්ත ජාතික කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පර්යේෂකයින්, සිසුන් හා වගාකරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම් මත ලබාදෙනු ඇත. මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානයේ ස්ථාපනය කල නව කෘෂි කාළගුණ විද්‍යා මධ්‍යස්ථානය 2013 පෙබරවාරි සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. තැඹිලි කල් තබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව අපනයනකරුවන් 15 ක් පමණ දැනුවත් කරන ලද අතර එය භාවිතා කර තැඹිලි ගෙඩි 200,000 මෙම වසර තුලදී අපනයනය කල බව වාර්තා විය.

***ජීවමිතික:*** පරිගණක 28 කින් සමන්විත ආයතනයේ පරිගණක ජාලය සාර්ථකව කළමනාකරණය කරන ලදී. ජාතික පොල් ඵලදාව සඳහා දත්ත ලබා ගැනීමේ සමීක්ෂණය පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් සංවර්ධන නිලධාරීන් හා ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ සහයෝගීතාවයෙන් වසර පුරා ක්‍රියාත්මක විය. වසර 2013 අස්වැන්න පුරෝකථනය කිරීම සඳහා වූ කමිටුවට ජීවමිතික අංශයේ පර්යේෂණ නිලධාරීන් දායක විය. පුරෝකථනය කල අස්වැන්න ගෙඩි මිලියන 2853 කි. ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ජාතික පොල් ඵලදාව ගසකට ගෙඩි 35 (2011) සිට 48 (2012) දක්වා වැඩිවීමක් පෙන්නුම් කරනලදී. මෙය 2011 ට සාපේක්ෂව 39.8% ක වැඩිවීමකි. ගසක සාමාන්‍ය ඵලදාවේ අඩුම අගය (32) වාර්තා වූයේ රත්නපුරයෙන් වූ අතර උපරිමය (62) අම්පාර ප්‍රදේශයෙන් වාර්තා විය. සියළු පොල් සංවර්ධන නිලධාරී කලාප සළකා බැලූ විට ගසක පොල් ඵලදාව 2011 ට සාපේක්ෂව සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළේය.

## 1.3 භෝග සංරක්ෂණය

භෝග සංරක්ෂණයට අදාළව පර්යේෂණ මෙන්ම සේවාවන් සඳහා අවධානය යොමු කරන ලදී. වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය හඳුනාගැනීම, ක්ෂේත්‍ර සමීක්ෂණ, පැතිරීම වැළැක්වීම හා සමෝධානික පාලනය සඳහා සම්පත් සංවර්ධනය කර ගැනීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ඇමරිකානු ඩොලර් 307,000 ක ආධාර මුදලක් ලැබුණි. අතුරු නිර්දේශ 3 ක් ලබා දීමට හැකිවිය. a) පොල් මයිටා මර්ධනය සඳහා විලෝපිත මයිටාවන් නිදහස් කිරීම, b) කළු කුරුමිණි මර්ධනය සඳහා පෙරමෝන් උගුල් භාවිතය, c) රතු කුරුමිණියා මර්ධනය සඳහා මොනොක්‍රොටොෆොස් වෙනුවට පෙන්තොඒට් භාවිතය



රූපය 8 - ප්ලෙසිස්පා කුරුමිණි හානියට පත් පොල් පැළයක්

නිර්දේශ කිරීම. ජ්ලෙසිස්පා කුරුමිණියා ජෛව විද්‍යාත්මක පාලනය සඳහා ටෙට්‍රාස්ටිකස් බ්‍රොන්ටිස්පේ නම් පරපෝෂිත විශේෂය තායිලන්තයෙන් ගෙන්වන ලදී. වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය පාලනය කිරීමට රෝග මුක්ත කලාපය පවත්වා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක විය. අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ හා මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයේ විලෝපිත මයිටා අභිජනන විද්‍යාගාර දෙකක් ස්ථාපිත කල අතර අනිකුත් ආයතන වල එම විද්‍යාගාර ඉදි කිරීමට හා පවත්වා ගැනීමට තාක්ෂණ දැනුම ලබා දීමටද කටයුතු කරන ලදී.

වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය පිළිබඳ පර්යේෂණ ගණනාවක් ක්‍රියාත්මක විය. ප්‍රතිදේහ ජනක භාවිතයෙන් රෝගී ගස් හඳුනා ගැනීමේ ක්‍රමවේදය සැළකිය යුතු මට්ටමකට දියුණු කරන ලදී. රෝගී ගස් හඳුනා ගැනීමේ ක්‍රමවේදයන් වන ප්‍රතිදේහ ජනක භාවිතය, අණුක තාක්ෂණ ක්‍රම භාවිතය (real time PCR, LAMP) සැළකිය යුතු මට්ටමකට දියුණු කරන ලදී. මෙහිදී එම ක්‍රමවේදයන්ගේ නිරවද්‍යතාවය වැඩි කිරීමට අවශ්‍ය තත්ත්ව හඳුනා ගැනීමට පර්යේෂණ ක්‍රියාත්මක විය. රෝග වාහකයන් ලෙස අනුමාන කරන ලද *Proutista moesta*, *Proutista* විශේෂයක් සහ *Stephanitis typica* භාවිතා කර පර්යේෂණ සිදුකරන ලදී. මෙම වාහකයන්ට පෝෂණය වීමට සැලැස්වූ පොල් පැල වල රෝග ලක්ෂණ ඇතිවීම අධ්‍යයනය කල අතර මේ වන තෙක් රෝග ලක්ෂණ ඇති නොවීය. රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍රයේ සිටවූ ප්‍රභේද 14 න් 6 ක් රෝගයට පාත්‍රවිය. ප්‍රතිරෝධී දෙමුහුම් 3 ක් නිපදවීම සඳහා ගස් 70 ක් භාවිතා කර අත්පරාගන වැඩසටහනක් ක්‍රියාත්මක විය.

රෝග මුක්ත කලාපය තුල ඉඩම් 20,406 ක් පරීක්ෂා කර රෝගී ගස් 250 ක් ඉඩම් 96 ක් තුලින් සොයාගනු ලැබිණි. තහනම් කරන ලද ද්‍රව්‍ය ප්‍රවාහනය වැළැක්වීමට වලස්මුල්ල හා අකුරැස්ස යන ස්ථාන වල මාර්ග බාධක ඉදිකරනු ලැබීය. රෝගී ගස් ඉවත් කරන ලද පොල් වතු 3 ක් ආශ්‍රිතව ආර්ථික භෝග වගාවන් ස්ථාපනය කර විකල්ප ආදායම් මාර්ග පිළිබඳව ගොවීන් දැනුවත් කරන ලදී. රෝගය ව්‍යාප්තව ඇති හා පිටත ප්‍රදේශ වල දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක්ද ක්‍රියාත්මක කරන ලදී.

පොල් මයිටා මර්ධනය සඳහා විලෝපී මයිටා *Neoseiulus baraki* යොදා ගැනීමේ නියමු ව්‍යාපෘති පොල් වතු 2 ක සිදු කෙරිණි. වගාවේ ගස් ¼ ක් අහඹු ලෙස තෝරා ගසකට මයිටාවන් 5000 ක් පමණ මාස 3-4 කට වරක් යෙදීමෙන් එලදාවේ ලොකු ගෙඩි ප්‍රතිශතයේ වැඩිවීමක් (85-90%) මෙන්ම කුඩා ගෙඩි ප්‍රතිශතයේ අඩුවීමක් (10-13%) නිරීක්ෂණය කල හැකිවිය. මෙම අගයන් විලෝපිත මයිටා නිදහස් නොකළ ක්ෂේත්‍රයේ පිළිවෙලින් 79-81% හා 17-20% ක අගයක් විය.

විලෝපිත මයිටා අභිජනනය සඳහා විද්‍යාගාර 6 ක් ඉදිකෙරිණි. 2012 වසර අවසාන වන විට විද්‍යාගාර 11 ක් (පොල් පර්යේෂණ ආයතනය මගින් 3, කුරුණෑගල වැවිලි සමාගම මගින් 1, හලාවත වැවිලි සමාගම මගින් 2 හා පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් 5) සතුටුදායකව ක්‍රියාත්මක විය. වසර තුල විලෝපිත මයිටාවන් 48,850 ක් වගාකරුවන්ට නිකුත් කිරීමට හැකිවිය.

ප්ලෙසිස්පා හා බ්‍රොන්ටිස්පා කුරුමිණියන්ගේ පරපෝෂිතයන් වන ටෙට්‍රාස්ටිකස් බ්‍රොන්ටිස්පා තායිලන්තයෙන් ගෙන්වා පර්යේෂණ ආරම්භ කරන ලදී. ආරම්භයේදී වැඩි ගැහැණු පරපෝෂිතයන්ගේ බෝවීම තුලින් 75-80% පරපෝෂීතාවක් පෙන්නුම් කලද වසර අවසාන වන විට ගැහැණු පිරිමි සතුන්ගේ අනුපාතය ශීඝ්‍රයෙන් අඩුවිය.

පෙරමෝන උගුල් ස්ථාපිත කිරීමෙන් කළුකුරුමිණි හානිය සැළකිය යුතු මට්ටමකින් අඩුවීමක් නිරීක්ෂණය කල හැකිවිය. උගුල් භාවිතයට මාස 32 ක් ගත වූ විට 50% ක හානියේ අඩුවීමක් වාර්තාවිය. ඔරික්ටස් වෛරසය කළුකුරුමිණියන්ට ආසාදනය කර නිදහස් කිරීම මගින් කුරුමිණි ගහණය තුල ආසාදිත කුරුමිණියන්ගේ වැඩිවීමක් හා හානියේ අඩුවීමක් දක්නට හැකිවිය.

පොල් දළඹුවන්ගේ හානිය ඇති වගාවන් සඳහා පරපෝෂිතයින් 574,250 ක් නිදහස් කිරීමට හැකිවිය. රතුකුරුමිණි පෙරමෝන නල 3,996 ක් වගාකරුවන්ටත් 6,000 ක් පොල් වගා කිරීමේ මණ්ඩලයටත් ලබා දීමට හැකිවිය. විලෝපීය මයිටා පැකට්ටු 12,503 ක් වගාකරුවන්ට ලබාදුනි. වගාකරුවන්ට රෝග හා පළිබෝධකයන් පාලනය කිරීමට උපදෙස් ලබාදීමද විශ්ව විද්‍යාල හා කෘෂිකර්ම විද්‍යාල වලින් පැමිණෙන සිසුන් පුහුණු කිරීම හා දැනුවත් කිරීමද සිදුකෙරිණි.

## 1.4 පොල් සැකසුම්



අංශයේ පර්යේෂණ කටයුතු පොල් ආශ්‍රිත නිෂ්පාදන බිහිකිරීම හා එම නිෂ්පාදන ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම කෙරෙහි යොමුවිය. පොල් කිරි අයිස්ක්‍රීම්, මීරා හා පැණි විසුරුම් වියලනය, පොල් තලපය වැඩිදියුණු කිරීම, අපනයනය සඳහා පොල් වතුර කල්තබා ගැනීම, පොල් සම්බෝල මිශ්‍රණයේ ගුණාත්මය අධ්‍යයනය, පොල් තෙල් වල ගුණාත්මය හා සෞඛ්‍යයට ඇති බලපෑම අධ්‍යයනය, විජලනය කල පොල් මද, පරිසර හිතකාමී උසස් ප්‍රමිතියේ කාබන් නිපදවීමේ

යාන්ත්‍රණය දියුණු කිරීම හා කොහුබත් වියළීම සඳහා අඩු පීඩනයක් තුල වියළීම වැනි නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලීන් අධ්‍යයනය කරන ලදී.



ආහාරයට යෝග්‍ය මේද හා කිරි මිශ්‍රණයක් රසවත් කර වෙනත් ආදේශක ඇතිව හෝ නැතිව ශීතකිරීමෙන් අයිස්ක්‍රීම් නිපදවනු ලැබේ. පොල් කිරි අයිස්ක්‍රීම් වැනිලා හා කොකෝවා රසයෙන් නිපදවනු ලැබීය. වැනිලා අයිස්ක්‍රීම් ඝන ද්‍රව්‍ය 37.3%, මේද 9.32%, සීනි 30.6% හා ප්‍රෝටීන් 0.27% සංයුතියකින් යුතු අතර කොකෝවා රස අයිස්ක්‍රීම් ඝන ද්‍රව්‍ය 38.1%, මේද 9.42%, සීනි 30.6% හා ප්‍රෝටීන 0.27% සංයුතියකින් යුතුවිය. මෙම අයිස්ක්‍රීම් වර්ග දෙකම ඉහළ කැමැත්තක් දිනාගනු ලැබීය. සුළු හා මධ්‍යපරිමාණ නිෂ්පාදකයන්ට හඳුන්වාදීමෙන් දැන් මෙම නිෂ්පාදන වෙළඳපලට නිකුත්වෙමින් පවතී. මෙම අයිස්ක්‍රීම් ලැක්ටෝස් අසාත්මිකතාව ඇති අයටද යෝග්‍යය. මෙය ශ්‍රී ලංකාවේ මුල් වරට හඳුන්වා දෙන ලද නිෂ්පාදනයකි.

මීරා ඉක්මනින් පැසීමට ලක්වේ. මීරා කල්තබා ගැනීමේ ක්‍රමවේදයක් ඇත්නම් අවශ්‍ය වූ විටක පැණි, හකුරු හෝ ගෝල්ඩන් සිරප් සෑදීමට භාවිතා කල හැක. එම නිසා මීරා අස්ඵටික තත්ත්වයේ පිටි ලෙස කල්තබා ගැනීමට විසුරුම් වියලන ක්‍රමය භාවිතා කර ගැණින. මෙම පිටිකල මීරා වල තෙතමනය, අස්ඵටික හැඩය, සීනි ප්‍රමාණය ආදී විවිධ ලක්ෂණයන්ද අධ්‍යයනය කරන ලදී. මීරා පිටි බවට පත්වීමේ කාර්යක්ෂමතාව 56.35± 2.90% විය. තෙතමනය 1.24±0.01% ද මුළු සීනි ප්‍රමාණය 66.1±0.04% විය. සීනි



ප්‍රමාණයෙන් 32.7±0.02% ප්‍රතිශතයක් පෲක්ටෝස් විය. ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂ ඡායාරූප මඟින්ද එම පිටි අංශු වල අස්ඵටික තත්ත්වය තහවුරු විය. මෙම පිටි වල තෙතමන ප්‍රමාණය අනෙකුත් ආහාරමය පිටි වර්ග වල තෙතමන ප්‍රමාණය හා සැසඳිය හැකි මට්ටමක පැවතිණ. පිටිකල මීරා මාස 5 කට වැඩි කාලයක් ගබඩා කර තැබීමට හැකිය. මෙම කාලය වැඩිකර ගැනීමට තවදුරටත් පර්යේෂණ ක්‍රියාත්මකය. පිටි කල මීරා නව නිෂ්පාදනයක් වන අතර භාවිතය පහසුය. ඉක්මනින්

දියවෙයි. සෞඛ්‍යාරක්ෂිතව අඩු ඉඩ ප්‍රමාණයක වැඩි කාලයක් ගබඩාකර තබාගත හැක. මෙම නව නිෂ්පාදනය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට නියමිතය.

පොල් පැණි, සීනි සංයුතිය ඉහළ ආහාරයකි. පැණි වල ඉහළ දුස්ස්‍රාවීතාවය හා ඇලෙන සුළු ගතිය නිසා විශාල පරිමාණයේ නිෂ්පාදනය අපහසුය. මේ නිසා ආහාර කර්මාන්තයට හා පාරිභෝගිකයන්ට පහසු වියළි පිටි ලෙස පැණි නිෂ්පාදනය කිරීම විශාල අවශ්‍යතාවයක් පවතී. විසිරුම් වියලනය මඟින් වියළි කුඩු ලෙසට පැණි කල්තබා ගත හැකි ලෙස සැකසීමට ක්‍රමවේදයක් හඳුනාගත් අතර එම නිෂ්පාදනයේ තෙතමනය, සීනි සංයුතිය, කුඩු අංශු වල හැඩය අධ්‍යයනය කරන ලදී. මෙම පිටි කල පොල් පැණි ද නව නිෂ්පාදනයක් වන අතර සීනි ආදේශකයක් ලෙසද භාවිතා කල හැක. භාවිතයට පහසු, ඉතා හොඳින් දියවන, සෞඛ්‍යාරක්ෂිතව වැඩි කාලයක් අඩු ඉඩ ප්‍රමාණයක ගබඩා කර තැබිය හැකි මෙම නිෂ්පාදනයටද පේටන්ට් බලපත්‍රයක් ඉල්ලුම් කර ඇත.

නිවෙස් වල ආහාර පිළියෙල කිරීමේදී පොල් කිරි ලබාගැනීමෙන් පසු ඉතිරි වන පොල් කුඩු ඉවත දමනු ලබයි. පොල් කුඩු පෝෂණ ද්‍රව්‍ය හා තන්තු අඩංගු කොටසකි. මෙලෙස පොල් අපතේ යාම මඟහරවා ගැනීමට සම්පූර්ණ මදය භාවිතා කර පොල් තලපය නිපදවීය. පොල් තලපය කල්තබා ගැනීමේදී ස්ථිර වෙන්වීම මඟහරවා ගැනීමට තිරකාරක යොදා හොඳින් මිශ්‍ර කිරීමේ හැකියාව අධ්‍යයනය කරනලදී.

කෘතිම බීම වර්ග වෙනුවට පොල් වතුර භාවිතා කිරීමට දැඩි නැඹුරුතාවයක් ඇමරිකාව හා යුරෝපා වෙළඳපල තුල අද වර්ධනය වෙමින් පවතී. පොල් වතුර පිළිකා කාරක නාශක ගුණ සහිත බවටද පිළිගැනීමක් ඇත. දැඩි විජලන තත්ත්වයකදී බීමක් ලෙස හෝ අන්ත:ශිරා එන්නතක් ලෙස හෝ ප්‍රතිකාර කිරීමට භාවිතාකල හැක. පොල් වතුර තුල පොටැසියම්, පොස්පරස් හා සෝඩියම් වැනි ඛණිජ වර්ගද විටමින් සී හා සීනි වර්ගද අන්තර්ගතය. ශරීරයෙන් ඉවත් වන සෝඩියම් හා පොටැසියම් (මුත්‍රා සහ දහඩිය මඟින්) නැවත ලබා ගත හැකි හිතකර සෝඩියම් හා පොටැසියම් අනුපාතයකින් යුතු බීමක් ලෙස පොල් වතුර හඳුනාගෙන ඇත. පොල් වතුර වාතයට හා උණුසුමට නිරාවරණය වූ විට ඉතා ඉක්මනින් එහි ගුණ හානි වේ. ඉහළ උෂ්ණත්වයක් යොදා (100°C ට වැඩි) පොල් වතුර ජීවාණුහරණය කිරීමෙන් එහි පෝෂක ගුණය හා රසය හානිවේ. පොල් වතුර අපනයනයට ඇති ප්‍රධානම බාධාව



වන්නේ සැකසුම් හා ප්‍රවාහන කාලයේදී සිදුවන මෙම භෞත රසායන වෙනස්වීමය. නොමේරු

ගෙඩි කාමර උෂ්ණත්වයේ සතියකට වඩා කල්තබාගත හොත් පිටත පැහැය වෙනස්වීම හා හැකිලීම, මණිපත්‍ර ප්‍රදේශයේ ක්ෂුද්‍රජීවී ආසාදනය වීම හා පොල් වතුර වියෝජනය වැනි වෙනස්කම් සිදුවේ. පොල් වතුර කල්තබා ගැනීම සඳහා පැස්චරීකරණය (90°C දී විනාඩි 10 හා 100°C දී විනාඩි 10) හා ආහාර කල්තබා ගන්නා රසායන භාවිතය (100 ppm KMS හා 0.05 % CMC) යන ක්‍රම හඳුනාගෙන ඇත. මෙලෙස සකස් කල පොල් වතුර බෝතල් කර කාමර උෂ්ණත්වයේ (30±2°C) හෝ ශීතකරණයේ (4±2°C) මාස 6 පමණ කල්තබා ගත හැක. මෙම නිෂ්පාදනයේ රසායන හා ක්ෂුද්‍රජීවීන් සඳහා වූ ගුණාත්මක දත්තයන් හා රසය ඉහළ මට්ටමක පැවතුන හෙයින් නිෂ්පාදනය සඳහා පුද්ගලික අංශය සමඟ සහයෝගීතාවයක් ගොඩනඟා ගැනීමට සැලසුම් කර ඇත.

පොල් සම්බල ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ආහාරයක් බැවින් ක්ෂණිකව පිළියෙල කරගත හැකි නිෂ්පාදනයක් ලෙස හඳුන්වාදීම වඩා ප්‍රයෝජනවත් වේ. පොල් සම්බල කල්තබා ගැනීමේ ක්‍රමවේදයන් 2 ක් හඳුනා ගැනීමට පර්යේෂණ ක්‍රියාත්මක විය. එම නිෂ්පාදනය ශීතරකණය තුල හෝ අධිශීතකරණය තුල මාස 3 ක් කල්තබා ගැනීමට හැකිවූ අතර කාලය දීර්ඝ කර ගැනීම සඳහා පර්යේෂණ තව දුරටත් ක්‍රියාත්මකය.

වෙළඳපලේ මිළදී ගැනීමට ඇති පොල් තෙල් වෙනත් එළවළු තෙල් වර්ග (විශේෂයෙන් ආනයනික පාම් තෙල්) සමඟ මිශ්‍ර කර ඇත. පොල් තෙල් නිෂ්පාදන ක්‍රියාවලිය තුලදීද විවිධ අපද්‍රව්‍ය මිශ්‍ර විය හැක. පොල් තෙල් පරිභෝජනය කිරීමෙන් සෞඛ්‍යයට ලැබෙන හිතකර බලපෑම් ගැන ශ්‍රී ලංකාවේ මෙතෙක් පර්යේෂණ සිදුකර නැත. එම පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට පොල් පර්යේෂණ ආයතනය කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීය. මෙම පර්යේෂණ මඟින් ධමනි වල මේද තැන්පත්වීම හා ශරීරයේ බර වැඩිවීම සඳහා පොල් තෙල් වල බලපෑම හා පොල් තෙල් වල ප්‍රති-ඔක්සිකාරක ගුණ පිළිබඳ පර්යේෂණ කිරීමට නියමිතය. විවිධ නිෂ්පාදන තත්ත්ව යටතේ නිෂ්පාදනය කල පොල් තෙල් වල ගුණාත්මයේ වෙනස හා ඒ මඟින් ඇතිවිය හැකි බලපෑම්ද අධ්‍යයනය කෙරේ. වෙළඳපලෙන් ලබාගත හැකි සුදු පොල් තෙල්, නැවුම් පොල් තෙල් හා පිරිසිදු කල පොල් තෙල් යන වර්ග හා පොල්, මීයන්ට ආහාර ලෙස ලබාදී ශරීර බර, ලේ වල මේද සංයුතිය, ධමනි වල මේද තැන්පත්වීම, ප්‍රති-ඔක්සිකාරක ගුණ පිළිබඳ හැදෑරීමට අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණයේ මුල් වසර තුල වෙළඳපලෙන් ලබාගත් තෙල් සාම්පල තෙතමනය, මේද අම්ල සංයුතිය, වර්ණය, ඝණත්වය වැනි ගුණාංග සඳහා පරීක්ෂා කෙරිණ. මෙම පර්යේෂණ අවසානයේ පොල් තෙල් පරිභෝජනයෙන් ඇති විය හැකි බවට අනුමාන කරන හානිකර බලපෑම් පිළිබඳ මිත්‍යා මත බිඳ දැමීමට හැකිවනු ඇත.

විජලනය කර පැණිරස ගැන්වූ පොල් මදය පෙති වශයෙන් නිපදවූ විට හොඳින් හැපෙන ක්ෂණික ආහාරයක් ලෙස භාවිතයට ගතහැකිය. මෙය ආහාරයට ගැනීමට  පෙර බැදීම අවශ්‍ය නොවේ. කල්තබා ගැනීමේදී ප්‍රධාන ගැටළුව වන්නේ මුඩු වීමයි. මුඩුවීම හේතුවෙන් අම්හිරි සුවඳක් හා රසයක් ඇතිවේ.  හොඳින් හැපෙන ස්වභාවය අඩුවී මැලවුණු ස්වභාවයට පත්වීම තවත් ගැටළුවකි. මෙම කල්තබා ගැනීමේ ගැටළු සඳහා විසඳුම් ලෙස ප්‍රතිඔක්සිකාරක භාවිතය හා සුදුසු අසුරනයක් හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ ආරම්භ කෙරිණි.

ලොව පුරා විවිධ කර්මාන්ත සඳහා භාවිතා වන කාබන් නිෂ්පාදනය සඳහා පොල් කටු යොදා ගැනීමේ හැකියාව ඉතා ඉහළය.  පොල් කටු අඟුරු වලින් සක්‍රීය කාබන් නිපදවිය හැක.  ශ්‍රී ලංකාවේ පොල් කටු අඟුරු මෙට්‍රික් ටොන් 40,000 ක් පමණ නිපදවන අතර මෙට්‍රික් ටොන් 70,000 ක පමණ ඉල්ලුමක් පවතී.  සාම්ප්‍රදායික පොල්කටු අඟුරු පෝරණු භාවිතයේදී අධික දුමක් පරිසරයට මුදාහැරෙන බැවින් පරිසරයට සහ මිනිස් සෞඛ්‍යයට අහිතකරය.  පොල් කටු අඟුරු නිෂ්පාදනයේ යෙදෙන අය අතර ශ්වසන රෝග හා ඇස් රෝග බහුල බවද වාර්තාවේ.  මේ නිසා සමහර ප්‍රදේශ වල සාම්ප්‍රදායික ක්‍රමයට අඟුරු නිපදවීමට අවසර ලබා නොදෙන අවස්ථා ඇත. මෙම ගැටළු සඳහා පිළියමක් ලෙස කුඩා පරිමාණයේ, අඩු වියදම්, පරිසර හිතකාමී උඳුනක් සැලසුම් කිරීමට පොල් පර්යේෂණ ආයතනය, කර්මාන්ත සේවා කාර්යාංශය, හේකාබ් ආයතනය හා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මේ තුලින් දේශීය හා විදේශීය වෙළඳපොල සඳහා ඉහළ ගුණාත්මයෙන් යුතු පොල්කටු අඟුරු නිපදවීමට අපේක්ෂිතය.

ලෝකයේ දෙවන කොහු අපනයනය කරන රට ශ්‍රී ලංකාවයි.  කොහු නිෂ්පාදන ක්‍රියාවලියේදී අතුරු නිෂ්පාදනයක් වන කොහුබත් මුළු පොල් නිෂ්පාදන අපනයන ආදායමින් 15% ප්‍රතිශතයකට හිමිකම් කියයි.  කොහු කිලෝ ග්‍රෑම් 1 ක් නිෂ්පාදනයේදී කොහුබත් කිලෝ ග්‍රෑම් 2 ක් නිපදවෙන අතර එහි 53.3% ලිග්නීන්, 19.9% සෙලියුලෝස්, 11.9% හෙමිසෙලියුලෝස්, 7% පෙක්ටීන් හා 0.3% නිස්සාරක ද්‍රව්‍ය අන්තර්ගතය.  කොහුබත් යොදා ගන්නා මූලික නිෂ්පාදන ලෙස බේල් කරන ලද කොහුබත්, කොහුබත් කැට, පැලැටි වවන මළු ආදිය හැඳින්විය හැක.  මෙම නිෂ්පාදන සඳහා හිරුඑළියෙන් වියළන කොහුබත් භාවිතා කරන අතර වර්ෂා කාලයේදී සැපයුම අඩාල වේ. අඩු පීඩනයෙන් වියළීම මෙම ගැටළුවට විසඳුමක් ලෙස භාවිතා කල හැකි අතර එහිදී කොහුබත් වල ගුණාත්මයට සිදුවිය හැකි වෙනස්කම් අධ්‍යයනය කල යුතුවේ. එමඟින් ඉහළ ගුණාත්මයකින් යුතු වියළි කොහුබත් නිපදවීමට අවශ්‍ය තත්ත්ව හඳුනා ගැනීමට අපේක්ෂිතය.  පොල් පර්යේෂණ ආයතනය මේ සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය හා සහයෝගීතාවයෙන් පර්යේෂණ සිදුකරයි.

## 1.5 සමාජ ආර්ථික අධ්‍යයන

පොල් පර්යේෂණ ආයතනයේ සමාජ ආර්ථික විද්‍යා අධ්‍යයන පොල් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගෙන ක්‍රියාත්මක විය. මෙම වසර තුල සිදුකරන ලද අධ්‍යයනයන් ප්‍රතිපත්ති වල බලපෑම, තැඹිලි කර්මාන්තයේ සැපයුම් වෙළඳපොල, ඩී 1 යන්ත්‍රයේ බලපෑම අධ්‍යයනය, පොල් කර්මාන්තයේ ආරක්ෂණය සහ තරඟකාරිත්වය, වැලිගම පොල් කොළ මැළවීමේ රෝගයේ සමාජ ආර්ථික බලපෑම, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වල වියදම, බාදා තෙල් කර්මාන්තයේ ඒකාබද්ධතාවය, පොහොර සහනාධාර ව්‍යාපෘතිය ඇගයීම සහ 2012 වසරේදී කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක වල පැවති නියඟයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය යන අංශයන් කෙරෙහි යොමුවිය. මෙයට අමතරව, පොල් පර්යේෂණ ආයතනය ජාතික කෘෂිකාර්මික සංගණනය - 2013 සැලසුම් කිරීම, රේගු බදු සංශෝධනය - 2012, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට, මුදල් අමාත්‍යාංශයේ සැලසුම් දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට තොරතුරු සැපයීම යන කාර්යයන් සඳහා දායක විය.

විශේෂයෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙළඳ ආරක්ෂණය බහුලව භාවිතා කෙරේ. ලෝකයේ අවධානය නිදහස් වෙළඳාමට යොමුවී ඇති නිසා මෙය විවාදාත්මක කරුණකි. කෙසේ වෙතත්, මෙම සංකල්ප දෙකම ලෝකයේ සියළුම රටවල අඩු වැඩි වශයෙන් භාවිතා වේ. නිදහසින් පසු ශ්‍රී ලංකාව බලයේ පවතින දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති අනුව, මෙම ප්‍රතිපත්තීන් ක්‍රියාවට නංවා ඇත. පොල් මද කර්මාන්තය සහ පොල් මද නොවන කර්මාන්ත විෂය අධ්‍යයනයක් ලෙස සළකා, වෙළඳ ආරක්ෂණවාදය ශ්‍රී ලංකාව තුල කෙසේ ක්‍රියාකර ඇත්ද යන්න හඳුනා ගැනීමේ අරමුණු ඇතිව අධ්‍යයනයක් සිදුකරන ලදී. පොල් තෙල්, දිසිදි පොල්, කොප්පරා, පොල් ක්‍රීම් සහ පිටිකල පොල් කිරි පොල් මද කර්මාන්ත වූ අතර කොහු, පොල් කටු සහ යුෂ නිෂ්පාදන මද නොවන කර්මාන්ත විය. නාමික ආරක්ෂණ සංගුණකය, සඵල ආරක්ෂණ සංගුණකය සහ දේශීය සම්පත් වියදම භාවිතා කර මෙම නිෂ්පාදන සඳහා ආරක්ෂණය සහ සන්සන්දනාත්මක වාසිය ඇස්තමේන්තු කරන ලදී. නාමික ආරක්ෂණ සංගුණකය, දේශීය වෙළඳපල මිළ සහ දේශ සීමා මිළ අතර අනුපාතය වන නිසා එමඟින් නිමැවුම් වෙළඳපලෙහි ආරක්ෂණය ග්‍රහණය වන අතර සඵල ආරක්ෂණ සංගුණකය මඟින් නිමැවුම් සහ යෙදවුම් වෙළඳපල දෙකෙහිම ආරක්ෂණය ග්‍රහණය කරගනී. සළකන ලද භාණ්ඩය දේශීයව නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ කාර්යක්ෂමතාවය දේශීය සම්පත් වියදම මඟින් විස්තර කරයි. ඇස්තමේන්තු වල ප්‍රතිඵලය පවතින ප්‍රතිපත්ති රාමුව තුල විස්තර කරයි. පොල් තෙල් සහ කොප්පරා හැරුණු විට අනිත් සියළුම නිෂ්පාදන සඳහා සෘණ ආරක්ෂණයක් පවතින බව නාමික ආරක්ෂණ සංගුණක මඟින් පෙන්නුම් කරන ලදී. සඵල ආරක්ෂණ සංගුණකයද එම ආකාරයෙන්ම ක්‍රියා කිරීම මඟින් මෙම නිෂ්පාදන වල යෙදවුම් වෙළඳපල සෘණාත්මකව ආරක්ෂණය වී ඇති බව පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් පොල් තෙල් වලට වඩා මිළෙන් අඩු ආනයනික ආදේශක බාදා තෙල් සඳහා තීරු

බදු නිතර වෙනස් කිරීම නිසා පොල් තෙල් කර්මාන්තය සඳහා ඇති ආරක්ෂණය ගණනය නොකරන ලදී. අඩු අස්වනු කාල වලදී පොල් මිළ පාලනය කිරීමේ උපකරණයක් ලෙස රජය මෙය යොදාගනී. මෙම හේතුව නිසා පොල් තෙල් කර්මාන්තය මෙම කාලය තුල හොඳින් වර්ධනය නොවීය. කොප්පරා හැරුණු විට අනිත් නිෂ්පාදන දේශීයව නිෂ්පාදනය කිරීම සන්සන්දනාත්මකව කාර්යක්ෂම බව දේශීය සම්පත් වියදම් අගයන් මගින් පෙන්නුම් කරන ලදී. සාම්ප්‍රදායික පෙට්ටි කුට්ටම් භාවිතයෙන් කොහු නිෂ්පාදනයේ සන්සන්දනාත්මක වාසිය කාලයත් සමඟ අඩුවී ඇති අතර තාක්ෂණික අපගමනය නිසා කර්මාන්තය රඳා පැවතුණි.

පොල් තෙල් හා දීසිදි පොල් ශ්‍රී ලංකාවේ ප්‍රධානම පොල් මද ආශ්‍රිත කර්මාන්ත දෙක වේ. පොල් තෙල් ප්‍රධානම පාරිභෝගික ඛාද්‍ය තෙල් වන අතර දේශීයව නිෂ්පාදනය කරයි. දිසිදි පොල් කර්මාන්තය අපනයනය සඳහා වන අතර දේශීය පරිභෝජනය නොසළකා හැරිය හැකි තරම්ය. මෙම කර්මාන්ත දෙක අමු ද්‍රව්‍ය, එනම් දේශීය අමු පොල් පරිභෝජනයෙන් පසු අතිරික්තය සඳහා එකිනෙකා සමඟ තරඟකරයි. පොල් සැපයුම අඩුවූ විට සහ දේශීය පොල් තෙල් මිළ ඉහළ ගිය අවස්ථා වලදී, රජය ඛාද්‍ය තෙල් මත පනවා ඇති ආනයන තීරු බදු අඩු කිරීම තුලින් ඛාද්‍ය තෙල් වෙළඳපල විවෘත කරයි. මීට අමතරව, දිසිදි පොල් කර්මාන්තය, විදේශ විනිමය ඉපයීම, රැකියා සැපයුම සහ රාජ්‍ය ආදායම් ඉපයීම් අතින් පොල් මද කර්මාන්තයේ වඩාත්ම වැදගත් සාධකය නිසා මෙමඟින් පොල්තෙල් නිෂ්පාදනය අධෛර්ය කර දිසිදි පොල් කර්මාන්තයට පොල් සැපයුම වැඩිකිරීම රජය අරමුණු කරයි. තවත් පැත්තකින්, දිසිදි කර්මාන්ත හිමියන් ඛාද්‍ය තෙල් මත පනවා ඇති ආනයනික තීරු බදු අඩු කිරීමට බලපෑම් කරයි. ඛාද්‍ය තෙල් මත පනවා ඇති තීරු බදු ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ප්‍රධානම සහ වඩාත්ම වැදගත් වෙළඳ ප්‍රතිපත්තිය වේ. කෙසේ වෙතත් ආනයන ඛාද්‍ය තෙල් මත පනවා ඇති බදු වෙනස් කිරීම නිසා පොල් ක්ෂේත්‍රයට සිදුවන බලපෑම විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය මිළ සම්ප්‍රේෂණය වීමේ නම්‍යතාවයන් ඇස්තමේන්තු කර නැත. තවදුරටත් මෙම ප්‍රතිපත්ති වෙනස්වීම් වල බලපෑම අධ්‍යයනයේදී වැදගත් සාධකයක් වන, ඛාද්‍ය තෙල් මත පනවා ඇති තීරු බදු දිසිදි කර්මාන්තය මඟින් කොතෙක් දුරට තීරණය වේද යන්නත් සොයා බලා නොමැත. එබැවින් ලෝක වෙළඳපල මිළ ගණන් (පොල් තෙල්, දිසිදි පොල් සහ ආදේශක තෙල්) දේශීය වෙළඳපලට සම්ප්‍රේෂණය වීමේ නම්‍යතා ඇස්තමේන්තු කිරීම සහ ලෝක වෙළඳපලේ දිසිදි පොල් සඳහා ලැබෙන මිළ මඟින් ඛාද්‍ය තෙල් මත පනවා ඇති බද්ද කොතරම් දුරට තීරණයවේද යන්නත් සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සිදුකරන ලදී.

ඉහත අරමුණු දෙක ලඟාකර ගැනීම සඳහා ක්‍රම දෙකක් භාවිතා කරන ලදී. මිළ සම්ප්‍රේෂණය වීමේ නම්‍යතාවයන් සහ ඒකාබද්ධතාවය සහ ස්වයං ප්‍රතිගමනය භාවිතයෙන්ද ඛාද්‍ය තෙල් මත පනවා ඇති ආනයන තීරුබදු කෙතරම් දුරට දිසිදි වෙළඳපල මඟින් තීරණය වේද යන්න පෙනෙන ලෙසට අසම්බන්ධ වක්‍ර භාවිතයෙන්ද ඇස්තමේන්තු කරන ලදී. ඉල්ලුම සහ සැපයුමට අදාළ 1990 – 2009 දක්වා මාසික මිළ ගණන් මෙම විශ්ලේෂණයේ දත්ත ලෙස භාවිතා කරන ලදී.

සහඒකාබද්ධතා විශ්ලේෂණය සඳහා යොදාගත් දත්ත එකම අනුපිළිවෙලට ඒකාබද්ධ වී ඇත. ඒකීය දත්ත පෙළ පළමු අනුපිළිවෙලට ඒකාබද්ධ වී ඇත. ලෝක වෙළඳපල සහ දේශීය වෙළඳපල අතර මිළ ගණන් යුගල ලෙස සහඒකාබද්ධ වී නැති නමුත් දේශීය වෙළඳපලෙහි එය දක්නට ඇත. මිළ ගණන් සහඒකාබද්ධතාවය ඇති විට ඒවා දීර්ඝකාලීනව සමතුලිතතාවයට පත්වේ. ලෝක වෙළඳපලෙහි පොල්තෙල් මිළ, කටු පොල්තෙල් මිළ සහ දිසිදි පොල් මිළ අනිකුත් මිළ ගණන් තීරණය කරයි. ලෝක වෙළඳපලෙහි කටුපොල් තෙල් සහ කටුපොල් මද තෙල් වල මිළ ගණන් වල වෙනස්වීමට අනුව දේශීය වෙළඳපල මිළ ගණන් වෙනස්වීම ඉතා සෙමින් සිදුවීමට හේතුව දේශීය වෙළඳපලෙහි ආනයන බදු ප්‍රතිපත්තිය විය හැකියි. දේශිය සිරස් වෙළඳපලෙහි සියළුම වෙනස්කම් අමු පොල් වල ගොවිපල මිළ සහ දිසිදි පොල් වල ලංකා නැව්ගත මිළ මත රඳා පවතී. පොල් වගාකරුවන් වෙළඳපල ක්‍රමය සමඟ ඒකාබද්ධ වී ඇත. දේශීය පොල්තෙල් මිළ ලෝක වෙළඳපලෙහි පොල් තෙල්, ආදේශක තෙල් සහ දිසිදි පොල් මිළ ගණන් වෙනස්වීම් සමඟ ප්‍රතිපත්තිමය වෙනස්කම් අතර පවා මාස දෙකක් ඇතුලත අනුගත වේ. බාදා තෙල් මත පනවා ඇති ආනයන බදු දිසිදි පොල් වල ශ්‍රී ලංකා නැව්ගත මිළ සමඟ සැළකිය යුතු තරම් ප්‍රතිවිරුද්ධ සම්බන්ධතාවයක් පෙන්වයි. තවදුරටත් බාදා තෙල් මත පනවා ඇති තීරු බදු ප්‍රධාන වශයෙන් දිසිදි පොල් වල ශ්‍රී ලංකා නැව්ගත මිළ මඟින් තීරණය වන බව හෙළිවිය.

ලෝකයේ පානීය වෙළඳපල ස්වභාවික සහ සෞඛ්‍යසම්පන්න පානයන් කරා යොමුවෙමින් පවතී. මීළඟ වසර 8 තුලදී, වැඩිහිටි ජනගහනය සහ සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කිරීම නිසා, දියුණු රටවල ලෝක වෙළඳපල සෞඛ්‍යසම්පන්න ආහාර සහ පාන කෙරෙහි යොමුවනු ඇති අතර ආහාර සුරක්ෂිතතාව ඉදිරියට එනු ඇත. එබැවින් සෞඛ්‍යසම්පන්න පානයක් ලෙස කුරුම්බා සඳහා ඇති ඉල්ලුම වැඩිවෙමින් පවතී. ඇසුරුම් කරන ලද කුරුම්බා සඳහා පිපාසය සංසිඳවන පානයක් ලෙස ඇමරිකාවේ, යුරෝපීය එකමුතුව සහ ආසියානු කලාපය (ඉන්දියාව) තුල ඉල්ලුමක් පවතී. ලතින් ඇමරිකා, දකුණු ඇමරිකා, කැරිබියන් දූපත්, කැනඩාව, ජර්මනිය සහ අප්‍රිකා රටවල වෙළඳපල ඇතිවෙමින් පවතී. මැලේසියාව, සිංගප්පූරුව, වියට්නාමය සහ තායිලන්තය ඇමරිකානු සහ යුරෝපීය වෙළඳපලෙහි ප්‍රධානම ටින් කරන ලද කුරුම්බා වතුර අපනයනකරුවන් වේ. පොල් වතුර, ක්‍රීඩා සහ ජීවන රටාවට අනුගත වන පානයක් ලෙස ඇමරිකාව තුල ජනප්‍රිය වෙමින් පවතී. මෙම අපගමනය ප්‍රධාන කාබනීකෘත පානයක් නිපදවන ප්‍රධාන වෙළඳ සමාගම් මඟින් පිළිඹිබු වේ. උදාහරණයක් ලෙස බ්‍රසීල පොල් වතුර නිෂ්පාදකයාව පෙප්සි සමාගමද, කැලිෆෝනියානු සමාගමක් කොකා කෝලා සමාගම මඟින්ද ලබාගෙන ඇත. ශ්‍රී ලංකාවේ තැඹිලි ප්‍රධාන වශයෙන්ම පානය කිරීම සඳහා නිපදවයි. රන් තැඹිලි, කහ තැඹිලි සහ ගොන් තැඹිලි ලෙස සාමාන්‍ය නම් වලින් හැඳින්වෙන තැඹිලි වර්ග ගණනාවක් ලංකාවේ ගෙවතු වල නිතර වගාකරන අතර පිපාසය සංසිඳුවන පානයක් ලෙස පාර අද්දර වෙළඳාම් කිරීම සුලභ විකුණුම් ක්‍රමයයි. ලංකාවේ ඇති තැඹිලි ගස් සංඛ්‍යාව 2,208,834 (ආසන්න ලෙස අක්කර 36,266) ක් වන අතර ගම්පහ සහ කළුතර ප්‍රධාන ලෙස වගා කරන දිස්ත්‍රික්ක වේ. 2011 වසරේදී ගෙඩි 139,849

අපනයනය කල අතර එහි වටිනාකම රුපියල් මිලියන 9.97 ක් වූ අතර එය 2010 වසරේදී ගෙඩි 9725 ක් සහ රුපියල් මිලියන 1.24 ක් විය. තැඹිලි සඳහා වූ සෙස් බද්ද ඉවත් කිරීම නිසා මෙම වැඩිවීම දැකගත හැකි විය. තැඹිලි සඳහා පවතින නිෂ්පාදන සහ වෙළඳපල ක්‍රමය ගැන අවබෝධයක් ලබා ගැනීමට සහ අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම සඳහා පවතින අවස්ථා සහ ගැටළු සොයා බැලීම සඳහා අධ්‍යයනයක් ගම්පහ දිස්ත්‍රික්කය තුල සිදුකරන ලදී. ගම්පහ දිස්ත්‍රික්කය තුල විශාල වශයෙන් තැඹිලි වගාකර ඇති නිසා මෙම දිස්ත්‍රික්කය තෝරාගන්නා ලදී. යෙදවුම් සැපයුම්කරුවන්, වගාකරුවන්, එකතුකරන්නන්, පාර අද්දර විකුණන්නන් සහ අපනයනකරුවන් මෙම දාමයේ ප්‍රධාන කණ්ඩායම් වේ. ගොවීන් 37 දෙනෙක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර අපනයනකරුවන් 6 දෙනෙකු සහ පාර අද්දර වෙළඳාමේ නිරතවූවන් 4 දෙනෙකුද ආවරණය කරන ලදී. දත්ත රැස්කිරීමේදී පැල නිෂ්පාදනය, යෙදවුම් සැපයුම, නිෂ්පාදනය, අස්වනු නෙළීම සහ පසු අස්වනු ප්‍රතිකාරක, ගෙඩි එකතු කිරීම සහ බෙදා හැරීම, ප්‍රවාහනය සහ අවසාන වෙළඳපල, අන්තර්සමාගම් සහයෝගීතාව සහ උපක්ෂේත්‍ර සිතියම පිළිබඳ අවධානය යොමුකරන ලදී. බොහෝ වගාකරුවන් සතුව පැවතුනේ තැඹිලි ගස් 10 ට අඩු සංඛ්‍යාවකි. වගාකරුවන්ගෙන් 68% ක් පමණ ඔවුන්ගේ නිෂ්පාදනය අතරමැදියන්ට විකුණන අතර 16% ප්‍රමාණයක් විකිණීම සිදුනොකරන අතර කිසිවෙකුත් අපනයනකරුවන්ට කෙලින්ම විකිණීම සිදුනොකරන ලදී. ඔවුන් අපනයනකරුවන්ගේ තොරතුරු දැන සිටියේ නැත. වගාකරුවන්ගෙන් 84% ක් ඔවුන්ගේ නිෂ්පාදන භාවිතා කරන දේ පිළිබඳව දැනුවත්ය. ඔවුන්ට අනුව 57% ක් පරිභෝජනය සඳහාද 19% ක් සකස් කිරීම සඳහාද යොදාගනී. වගාකරුවන්ට අනුව ගැණුම්කරු විසින් මිළ තීරණය කරනු ලබයි. වගාකරුවන්ගෙන් 66% ක් දෙනා පැවසුයේ ගැණුම්කරු මිළ තීරණය කරන අතර 24% ක් කේවල් කිරීම සහ 10% දෙනා ඔවුන්ම මිළ තීරණය කරනු ලබන බවයි.

පසුගිය දශකය තුල කොහු අපනයනය සැළකිය යුතු තරම් වැඩි වුවද කොහු කර්මාන්තය අඩපණ වී ඇති බවක් පෙන්නුම් කරයි. වසර 2000 සිට ලෝකයේ කොහු ආනයනය සැළකිය යුතු ලෙස වැඩිවී ඇත. 2000 වසරේදී ලෝකයේ කොහු අපනයනයෙන් 63% ක් යුරෝපයට යවන ලදී. චීනයේ ආනයනය 0.5% ට වඩා අඩුවිය. කෙසේ වෙතත් 2009 වසරේදී චීනයේ ආනයනය ලෝක කොහු ආනයනයෙන් 62% ක් විය. චීනයේ වැඩිවන ආනයන ඉල්ලුම ශ්‍රී ලංකාවට වාසිදායක වී ඇත. 2000 වසරේදී ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තය වූයේ මුළු ගුදිරි කොහු අපනයනයෙන් 22% ක් වූ එක්සත් රාජධානිය වූ අතර චීනයට අපනයනය 0.62% කි. 2010 වසරේදී ශ්‍රී ලංකාවේ ගුදිරි කොහු අපනයනයෙන්



77% කට ආසන්න ප්‍රමාණයක් චීනයට අපනයනය කරන ලදී. මෙම වැඩිවන ගුදිරි කොහු ඉල්ලුම සහ ගුදිරි කොහු වෙළඳපොල තරඟකාරීවීම නිසා නිදහසේ නිෂ්පාදනයට අවතීර්ණ වීමට ඇති හැකියාව නිසා සමහර ප්‍රදේශ වල ඩී 1 කොහු නිස්සාරණ යන්ත්‍ර පොකුරු ලෙස ආරම්භ කරන ලදී. මෙම නිස්සාරණ ක්‍රමය රටේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වුවත් බ්‍රිස්ටල් කොහු නිෂ්පාදන කර්මාන්තයට සහ වෙනත් අදාළ ක්‍රියාකාරකම් වලට මෙහි ඇති බලපෑම සොයා බලා නොමැත. සමාජ ආර්ථික බලපෑම තක්සේරු කිරීමේ ක්‍රමවේදය මෙම අරමුණ සඳහා යොදාගන්නා ලදී. පොල් ත්‍රිකෝණය තුල එනම් කුරුණෑගල, පුත්තලම සහ ගම්පහ දිස්ත්‍රික්ක වල සමීක්ෂණයක් මඟින් දත්ත රැස්කරන ලදී. ඩී 1 යන්ත්‍ර භාවිතයෙන් කොහු නිස්සාරණය හෙට්ටිපොල, බිංගිරිය සහ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවලට කේන්ද්‍රගතවී ඇත. ඩී 1 යන්ත්‍ර වලින් 60% ක්ද සාම්ප්‍රදායික කොහු මෝල් 50% ට වැඩි ප්‍රමාණයක්ද නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වෙයි. සාම්ප්‍රදායික මෝල් වලින් 25% ක් සම්පූර්ණයෙන්ම වසා දමා ඇත. වසා දැමීමට සහ කඩින් කඩ වැඩ කිරීමට ප්‍රධාන හේතුව මූලික අමුද්‍රව්‍ය වන ලෙලි හිඟකමයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ලෙලි වලින් 25% ට වඩා කොහු නිස්සාරණය සඳහා යොදා නොගනී. එම නිසා ගැටළුව වනුයේ ලෙලි හිඟකම නොව ලෙලි සුලභනොවීමයි. ආහාර සකස් කිරීම සඳහා යොදා ගන්නා ලෙලි එකතු කිරිමට සුදුසු ක්‍රමයක් අවශ්‍ය වේ.

ගොවීන් සඳහාම වූ රෝග මර්ධන ක්‍රමයක් දියුණු කිරීම සඳහා වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය පිළිබඳ ක්‍රමවත් සමාජ-ආර්ථික තක්සේරු කිරීමක් අවශ්‍ය වේ. බලපෑම් ඇතිවිය හැකි ආකාර (ආදායම් තත්ත්වය, රැකියා නියුක්තිය, සැකසුම් කරුවන්) හඳුනාගැනීමට සහ හානියට ලක්වූ පුද්ගලයන්ගේ ප්‍රතිචාර හඳුනාගැනීමට උදව්වේ. පළමු පියවර වශයෙන් ගොවීන්ගේ ආදායමට කෙලින්ම බලපාන අහිමිවීම් ප්‍රමාණකරනය කිරීමට බලාපොරොත්තු වේ. මෙය අළුත් රෝගයක් නිසා පොල් වගාවට එහි ඇති බලපෑම හොඳින් අවබෝධ කරගෙන නොමැත. එබැවින් අස්වැන්නට සහ අනිකුත් කාර්යයන් සඳහා ඇතිවන බලපෑම නොකඩවා නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. මෙම ආදායම් අහිමිවීමත් සමඟම, යෝජිත රෝග පාලන ක්‍රමවේදයන්හි ආර්ථික යෝග්‍යතාව වගේම මෙම ක්‍රමවේදයන් ගොවීන් කොතෙක් දුරට පිළිගනීද යන්නත් හඳුනාගැනීමට අවශ්‍ය වන අතර රෝග පාලන ක්‍රම හෝ නීතිමය සීමාකිරීම් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා පවතින වෙළඳපොල විනාශ කරන අතර පොල් ඉඩම් වල වටිනාකමද අඩුකරයි. මේ හැරුණු විට කම්කරු සුලභතාවේ ස්වභාවය මත ඇතිවන වියදම සහ අනිකුත් සමාජ ආර්ථික ගැටළු වලට විසඳුම් යෝජනා කිරීම. එබැවින් වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය හා සම්බන්ධ සමාජ ආර්ථික කරුණු හඳුනා ගැනීම, වැලිගම කොළ මැළවීමේ රෝගය නිසා ඇතිවූ ආර්ථික අහිමිවීම් ප්‍රමාණාත්මක කිරීම සහ පොල් පර්යේෂණ ආයතනය විසින් යෝජනා කරන ලද රෝග පාලන ක්‍රම සඳහා ගොවීන්ගේ කැමැත්ත සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සැලසුම් කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා 2009-2010 වසර වල සිදුකරන ලද සමීක්ෂණ නියැදියෙන් ඉඩම් 200 ක් තෝරා

ගන්නා ලදී. දත්ත රැස්කිරීම ආරම්භ කල අතර දැනටමත් දත්ත රැස්කිරීම 50% ක් සම්පූර්ණ කර ඇත.

නිෂ්පාදන වියදම ඇස්තමේන්තු කිරීම සඳහා පොල් ත්‍රිකෝණය තුල දත්ත රැස්කිරීම වසර මෙම වසර තුලදීද නොකඩවා පවත්වාගෙන යන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ ප්‍රධාන වියදම් සංරචක වල වෙනස්කම්, කෘෂි දේශගුණික කලාප, ඉඩම් ප්‍රමාණය සහ කළමනාකරණ මට්ටම මත හඳුනාගැනීමයි. වියදම් සංරචක ලෙස පොහොර යෙදීම්, කම්කරු කුලිය, වල් මර්ධනය, කෘෂි රසායන සහ පොල් කැඩීම හඳුනා ගන්නා ලදී. 2012 වසරේදී පොල් ත්‍රිකෝණය තුල සාමාන්‍ය නිෂ්පාදන වියදම ගෙඩියකට රු. 13.00 ක් විය (විචල්‍ය වියදම්). සාමාන්‍ය නිෂ්පාදන වියදමට අමතරව විවිධ භූමි යෝග්‍යතා කාණ්ඩ එස් 1-එස් 2, එස් 3 සහ එස් 4 සඳහා නිෂ්පාදන වියදම පිළිවෙලින් ගෙඩියකට රු. 8.00, රු. 9.00 සහ රු. 13.00 ක් විය.

පසුගිය වසර කිහිපය තුල පොල් නිෂ්පාදනය බොහෝ දුරට එක තැන පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් වල ඒක පුද්ගල සුලභතාවය කාලයත් සමඟ අඩුවී ඇති නිසා කර්මාන්තයේ තිරසාර බව පිළිබඳව සැකයක් මතුවී ඇත. පොල් වගාවට අයෝජන කිරීමට මිනිසුන් උනන්දු කරවීමට තරම් ගොවිපල මිළ ප්‍රමාණවත් නැත. පොහොර මිළ වැඩිවීමේ සහ නුසුදුසු කළමනාකරණ ක්‍රමවේදයන් නිසා පොල් ඉඩම් වල අඩු ආදායමක් ජනනය වීමේ ප්‍රතිඵලයක් ලෙස පොහොර භාවිතයේ අඩුවීමක් පෙන්නුම් කරයි. රජය, වසර ගණනාවක් මුළුල්ලේ පොහොර සහනාධාර ක්‍රම විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කල අතර වී වගාව සඳහා සහනාධාර සැපයීම මෑත කාලීන අත්දැකීමකි. මෙමඟින් ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය ස්වයංපෝෂිතවීම නිසා මෙය සාර්ථකත්වයට පත්වී තිබේ. 2016 වසර වන විට පොල් වගාකරුවන්ගෙන 60% පොහොර භාවිතයට යොමු කිරීම ඉලක්ක කරගෙන පොල් වගාවේ පොහොර භාවිතය වැඩිකිරීමේ අරමුණින් රජය 2010 වසරේදී පොල් සඳහා පොහොර සහනාධාර ක්‍රමයක් පටන් ගන්නා ලදී. මෙම ඉලක්ක තබා ගත්තද මෙවැනි ක්‍රියාකාරකම් සඳහා මෙම ක්ෂේත්‍රයේ ඇති අත්දැකීම් ප්‍රමාණවත් නැත. එබැවින් පොහොර සහනාධාර වැඩසටහනේ වාසි සහ ගැටළු හඳුනාගැනීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනේ ක්‍රියාත්මක අවධිය, දුර්වලතා හඳුනා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ අරමුණු විය. සහනාධාර ක්‍රමයේ අරමුණු වූයේ කෘෂිකාර්මික ඵලදායීතාව වැඩි කිරීම, ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සහ දුප්පත් ගොවීන්ගේ ආදායමට සහය දීමයි. නිශ්චිත සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක වන විට අන්තර්ජාතික වෙළඳපොලේ පොහොර මිළ වෙනස් වීමත් සමඟ සිල්ලර මිළ වෙනස් වන නමුත් විචල්‍ය සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක වන විට දේශීය සහ අන්තර්ජාතික මිළ වෙනස් වුවත් පොහොර මිළ නියතව තිබෙනු ඇත. එබැවින් විචල්‍ය සහනාධාර ක්‍රමය පදනම් කරගෙන පොල් පොහොර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. ශ්‍රී ලංකා මහ බැංකු දත්තයන්ට අනුව 1998 වසරේදී රජය පොහොර සහනාධාර සඳහා රුපියල් මිලියන 2,152.00 ක් වැය කල අතර එය රජයේ මුළු

වියදමින් 0.8% කි. 2011 වසරේදී මෙම ප්‍රමාණය රුපියල් මිලියන 29,802 ක් දක්වා ඉහළ ගිය අතර එය රජයේ මුළු වියදමින් 2.13% ක් විය. නව පොහොර සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි පොහොර භාවිතය පිළිවෙලින් 36.59, 61.54 සහ 33.33 ප්‍රතිශතයකින් වැඩිවීම නිසා, මෙම ප්‍රමාණය තවදුරටත් ඉහළ යනු ඇත. වගාකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් (67%) වසරකට වරක් පොහොර භාවිතා කරන බව මෙම අධ්‍යයනයෙන් තව දුරටත් අනාවරණය වූ අතර පොහොර සහනාධාරය පිළිබඳ පුත්තලම් දිස්ත්‍රික්කය තුල ඉහළ දැනුවත්භාවයක් (53%) තිබූ අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ පිළිබඳව දැනුවත් වී තිබූ පිරිස අඩුවිය (20%). තාක්ෂණ භාවිතය නිසි ආකාරයෙන් සිදුවීම සඳහා කෘෂිකර්මාන්තයේදී මිනිසුන්ගේ විශ්වාසය ඉතා වැදගත්ය. ප්‍රතිචාර දැක්වූවන් අතරින් 97% කට වැඩි පිරිසක් පොහොර සහනාධාරය නිසා පොල් අස්වැන්න වැඩි වනු ඇති බව විශ්වාස කල අතර වගාකරුවන්ගෙන් 84% ක් දෙනා පොහොර නිර්දේශය පිළිබඳවද 69% ක් දෙනා ඩොලමයිට් භාවිතය පිළිබඳවද දැනුවත් වී තිබුණි. කාබනික පොහොර භාවිතයේ වාසි තිබුනද වගාකරුවන්ගෙන් වැඩි දෙනෙක් (68%) තවමත් ඔවුන්ගේ පොල් වගාව සඳහා කාබනික පොහොර භාවිත නොකරයි. වගාකරුවන්ගේ ධනාත්මක විශ්වාසය නිසා මෙම පොහොර සහනාධාරයට ප්‍රතිචාර දැක්වීම මෙම වසරේ පවතින යහපත් කාලගුණයත් සමඟ වැඩිවනු ඇත.

පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණාත්මක සොයාගැනීම් මඟින් අනාවරණය වී ඇත්තේ දේශගුණය, පොහොර භාවිතය, නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම භාවිතය, රෝග සහ පළිබෝධ මර්ධන තීව්‍රතාවය සහ වගා කරන ප්‍රදේශය, වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය තීරණය කරන ප්‍රධාන සාධක බවයි. මෙම කරුණු අතරින් වර්ෂාපතන තීව්‍රතාවය සහ පැතිරීම ජාතික පොල් නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන්ම බලපායි. වගාකරුවන්ගේ සහ පර්යේෂකයින්ගේ නිරීක්ෂණයන්ට අනුව 2011 වසරේ මුල් මාස හත තුල පැවති නියඟය රටේ ජාතික පොල් එලදාවට අහිතරක ලෙස බලපා ඇති අතර 2011 වසරේ පසු කාලයේ සහ 2012 වසරේ නියඟයේ බලපෑම පිළිඹිඹු විය. 2011 සහ 2012 වසර වලදී පුත්තලම සහ කුරුණෑගල පැවති නියඟයේ බලපෑම ඇගයීම සඳහා පොල් පර්යේෂණ ආයතනය අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. අධ්‍යයනය අදියර දෙකකින් ක්‍රියාත්මක විය. පළමු අධ්‍යයනය 2011 වසරේදී හානිවූ ප්‍රදේශ ආවරණය කල අතර දෙවන අධ්‍යයනයෙන් පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක වල 2012 වසරේදී හානිවූ ප්‍රදේශ ආවරණය කරන ලදී. 2011 වසරේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලසීමාවේදී දෛනික උපරිම උෂ්ණත්වය වැඩිවීමේ ප්‍රවණතාවයක් දත්ත මඟින් පෙන්නුම් විය. මෙය උපරිම උෂ්ණත්වයේ 5% ක පමණ වැඩිවීමකි. ඒවාගේම 2005 සිට 2012 දක්වා දිස්ත්‍රික්ක දෙකේම වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය සැළකිය යුතු තරමකින් අඩුවී ඇත. මෙම තෝරාගත් නියැදිය ඉඩම් යෝග්‍යතා කාණ්ඩ එස් 2-එස් 4 නියෝජනය කරන ලදී. පත්‍ර වල පෙනුම සහ බැට්ටා වැටීම භාවිතයෙන් නියඟයේ බලපෑම සොයා බැලුණි. සමීක්ෂණය සිදුකල ප්‍රදේශ වලින් 70% ක් නියඟයේ බලපෑමට ගොදුරු වී ඇති බව සමීක්ෂණ ප්‍රතිඵල පෙන්වීය. මෙය අතු කඩා වැටීම මඟින්

පෙන්නුම් විය. බැට්ටා සහ කුරුම්බා වැටීම නියඟය හඳුනා ගැනීමේ තවත් දර්ශකයකි. බැට්ටා වල වර්ධක අවස්ථාවන් මාස එක සිට තුන, හතර සිට පහ, හය සිට හත සහ අට සිට නමය ලෙස කාණ්ඩ හතරකට වෙන් කෙරේ. ප්‍රතිඵල වලට අනුව වැඩිම බැට්ටා වැටීම මාස හතර සිට පහ දක්වා සහ මාස එක සිට තුන දක්වා වූ අතර ඉඩම් යෝග්‍යතා කාණ්ඩ එස් 3 වැඩිම බලපෑමට ලක්විය. වයස් කාණ්ඩ සළකන විට වයස අවුරුදු 3-4 සහ 10-25 යන කාණ්ඩයන්හි වැඩිම මරණ අනුපාතිකයක් වාර්තාවිය. මෙම පැවති නියඟය නිසා සමහර ක්‍රියාකාරකම් අතපසු වී ඇති බව මෙම අධ්‍යයනයෙන් තවදුරටත් හඳුනා ගන්නා ලදී. අත්සිටවූ ක්‍රියාකාරකම් වලින් ක්‍රමානුකූල පොහොර භාවිතා කරන්නන්ගෙන් 15% ක් ඔවුන්ගේ ක්‍රියාකාරකම් අත්සිටුවා තිබුණි. නියඟයේ බලපෑමට ලක්වූ බොහෝ ප්‍රදේශයන්හි භූගත ජල මට්ටම ඉතා ශීඝ්‍රයෙන් පහළ බැස තිබූ බව අධ්‍යයනයේදී නිරීක්ෂණය විය. මෙම නියඟය එම ප්‍රදේශවල බහු වාර්ෂික සහ ද්විවාර්ෂික වගාවන්ට වැඩියෙන්ම හානිදායක විය. හොඳින් කළමනාකරණය කරන ඉඩම් වලට නියඟයේ බලපෑම වැඩියෙන් දරාගත හැකි බව අධ්‍යයනයෙන් නිගමනය කල අතර අතරමැදි සහ වියළි කලාපයේ අතුරුබෝග වගාව සම්බන්ධ නිර්දේශයන් නැවත සළකා බැලීම අවශ්‍ය වේ. පුත්තලම දිස්ත්‍රික්කය තුල වඩාත්ම හානිවූ ප්‍රදේශ වනුයේ ආනමඩුව, ආරච්චිකට්ටුව, කල්පිටිය, කරුවලගස්වැව, මහකුඹුක්කඩවල, මුන්දලම, පල්ලම, පුත්තලම සහ වනාතවිල්ලුවයි. මෙය අක්කර 45,073 ක පමණ ප්‍රමාණයක් වන අතර හානියට පත්වූ ගස් සංඛ්‍යාව 180,000 (අක්කර 2,817) ක් පමණ වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වඩාත්ම හානිවූ ප්‍රදේශ වනුයේ බිංගිරිය, කටුපොත, කොටවෙහෙර, මහව, නිකවැරටිය, ගල්ගමුව, ගනේවත්ත, පොල්පිතිගම සහ රස්නායකපුරයි. මෙය අක්කර 80,183 ක ප්‍රමාණයක් වන අතර ගස් 133,905 (අක්කර 2,092) ක් හානියට පත්විය.

## 1.6 ඔයිල් පාම් පර්යේෂණ හා සංවර්ධනය

ඔයිල් පාම් වගාව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා නව පර්යේෂණ අංශයක් 2011 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. මෙම අංශයේ මූලික අරමුණ රටේ පාම් ඔයිල් අවශ්‍යතාවය වන මෙට්‍රික් ටොන් 60,000 ක් නිපදවීම සඳහා ඔයිල් පාම් වගාව හෙක්ටයාර 20,000 දක්වා වර්ධනය කිරීමයි. මේ සඳහා වන පර්යේෂණයන් පාරිසරික බලපෑම අධ්‍යයනය, පාංශු යෝග්‍යතා අධ්‍යයනය, පාංශු හා ශාක පෝෂණය අධ්‍යයනය, පටක රෝපණය හා ඔයිල් පාම් වගාව සම්බන්ධ සමාජ ආර්ථිකය වැනි තේමා ඔස්සේ ක්‍රියාත්මකය.

දකුණු පළාතෙන් පිටත ඔයිල් පාම් ශාක වර්ධනය හා අස්වැන්න පිළිබඳ හැදෑරීම සඳහා අතරමැදි කලාපයේ (බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල) සහ වියළි කලාපයේ (මාදුරුඔය බීජ පොල් උයන) ඔයිල් පාම් වගාවන් (පැළ 35 බැගින්) ස්ථාපිත කරන ලදී. ශාක පෝෂණ පර්යේෂණ යටතේ පෝෂක ඉවත් කිරීම ප්‍රමාණ කිරීම හා ඔයිල් පාම් වගා කෙරෙන පාංශු වර්ග වල ශාකයට ලබාගත

හැකි පොටෑසියම් හා පොස්පරස් පෝෂණ ප්‍රමාණ කිරීම වැනි පර්යේෂණ සිදුකරමින් පවතී. පටක රෝපණය සඳහා සුදුසු මාධ්‍යයක් හඳුනා ගැනීමට රෝපණ මාධ්‍යයන් 4 ක් භාවිතා කර කිණක පටක නිපදවීම නිරීක්ෂණය කරන ලදී. ඔයිල් පාම් වගාවන් පවත්වාගෙන යන වැවිලි සමාගම් සඳහා ඔයිල් පාම් බීජ ආනයනය, තවාන් පාලනය, පොහොර නිර්දේශ, රෝග හා පළිබෝධ මර්ධනය වැනි වගාවන් නඩත්තු කිරීමේදී අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරන ලදී. වසර තුලදී පස් සාම්පල 850 ක් හා ඔයිල් පාම් කොළ සාම්පල 475 ක් විශ්ලේෂණය කර පොහොර නිර්දේශයන් ලබාදෙන ලදී. ආන්තරික පොහොර නිර්දේශයන් 12 ක් වටවල, අගලවත්ත, නමුණුකුල හා ඇල්පිටිය වැවිලි සමාගම් වලට ලබාදෙන ලදී. පොහොර නිර්දේශ කිරීම සඳහා පස් හා කොළ සාම්පල ලබාගැනීම පිළිබඳව පුහුණුවක් හෙමොදොල, තලංගහ, නාකියාදෙණිය, එලදූන්න, සිට්‍රුස්, හුලන්දාව, අකුරැස්ස, ක්ලොඩෙන් යන වතු වලදී ලබාදෙන ලදී.

රෝග හා පළිබෝධ මර්ධනය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂකයක් තවාන් 4 ක් නිරීක්ෂණය කර මුල් අවධියේ තවාන් වලින් දෙවන අවධියේ තවාන් සඳහා පැළ නිකුත් කිරීම නිර්දේශ කරන ලදී. මෙම නිරීක්ෂණය කල තවාන් 4 හි (*Tetranychus* sp. and *Eutetranychus* sp.) හඳුනා ගැනීමට හැකි වූ අතර එම පළිබෝධකයන් පාලනයට පළිබෝධ නාශක නිර්දේශ කිරීමට හැකිවිය. ඇල්ගී (*Cephaleurus* sp.) මඟින් ඇතිවන රෝගය මියුරියේට් ඔෆ් පොටෑෂ් යෙදීම මඟින් පාලනය කල හැකි බව සොයා ගන්නා ලද අතර අතරමැදි නිර්දේශයන් ලෙස ගසකට කිලෝ ග්‍රෑම් 3.2 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් යෙදීම නිර්දේශ කරන ලදී. නමුනුකුල වතු සමාගමට අයත් පල්ලෙගොඩ තවානේ දිලීර ආසාදනයක් හඳුනාගත් අතර ෆොලිකර් ඉසීම මඟින් එය මර්ධනය කිරීමට හැකිවිය. පැපුවා නිව් ගිනියාවෙන් ආනයනය කල බීජ තොගයකින් ලබා ගත් පැළ ශීඝ්‍රයෙන් මියයාම වාර්තා වූ බැවින් එම බීජ හා පැළ නිරෝධායනය කර පුළුස්සා විනාශ කරන ලදී. ඔයිල් පාම් වගා කිරීමේ ආර්ථික වාසි 2012 ජූලි 17 පැවති දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද අතර එහි මුලසුන ගත් ජනාධිපතිතුමාගේ අනුදැනුම ඇතිව ඔයිල් පාම් පර්යේෂණ හා සංවර්ධන කටයුතු පොල් පර්යේෂණ ආයතනයට පැවරීය.කොස්ටාරිකා රාජ්‍යයෙන් ඔයිල් පාම් බීජ ආනයනය කිරීමේ හැකියාවද අධ්‍යයනය කරන ලදී. සුළු පරිමාණයේ වගාකරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් ඔයිල් පාම් වගාව පිළිබඳව උනන්දුවක් දැක්වූ අතර ඔවුන්ට උපදෙස් ලබා දීමට හා ඔවුන්ගේ තොරතුරු රැස්කර තබා ගැනීමට කටයුතු කරන ලදී.

## 1.7 තාක්ෂණ හුවමාරු

තාක්ෂණ හුවමාරු කාර්යයන් වලට අමතරව කාබනික පොල් වගාව පිළිබඳව කාබනික පොල් වගාකරුවන්ගේ මෙන්ම සාමාන්‍ය පොල් වගාකරුවන්ගේ ඇති කැමැත්ත ඇගයීම සඳහා පර්යේෂණ අධ්‍යයනයක් සිදුකරන ලදී. මෙහිදී අනාවරණය වූ කරුණු අනුව, සාමාන්‍ය පොල්

වගාකරුවන් කාබනික පොල් වගාව සඳහා නැඹුරු නොවීමට හේතුව කාබනික පොල් මිළ තරමක් වැඩි වුවද ඵලදාව අඩුවීමයි. මීට අමතරව ඔවුන් දැනට පුරුදුවී සිටින අකාබනික පොහොර හා කෘෂි රසායන යෙදීමෙන් වෙනස් වීමට අකමැත්ත තවත් හේතුවකි. කාබනික පොල්වගාකරුවන් ඔවුනට සෙරන්ඩිපොල් ආයතනයෙන් නිෂ්පාදන අළෙවිය සහ යෙදවුම් සපයා ගැනීමට ලැබෙන සහයෝගය හේතුවෙන් ඒ සඳහා නැඹුරුවීමක් දක්නට ලැබුණි. ඔවුහු කාබනික වගාවේ පාරිසරික හිතකර බව පිළිබඳව ද උනන්දුවක් දක්වති. මේ අනුව කාබනික වගාව පිළිබඳ දැනුවත් කිරීම හා ගොවීන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම කාබනික වගාකරුවන් දිරිමත් කිරීමට වැදගත් වේ. සහභාගිත්ව ව්‍යාප්ති වැඩසටහන් හා ක්ෂේත්‍ර ගොවි පාසල් යොදා ගැනීම මඟින් ගොවීන් කාබනික වගාව සඳහා දිරිමත් කල හැක. තවද, රාජ්‍ය නොවන සංවිධාන වල හා පුද්ගලික සමාගම් වල සහය ලබා ගැනීම මඟින්ද කාබනික වගාව ගොවීන් අතර ප්‍රචලිත කල හැක.

**තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්:** වගාකරුවන්ගේ ඉල්ලීම් මත ක්ෂේත්‍ර පරීක්ෂාවන් 22 ක් සිදුකරන ලදී. එක්දින පුහුණු පාඨමාලාව පහත දැක්වෙන පරිදි සිදුකරන ලදී.

| දිනය | ස්ථානය | විෂය ක්ෂේත්‍රය | සහභාගිත්වය | |
|---|---|---|---|---|
| | | | වගාකරුවන් | කාර්ය මණ්ඩල |
| මැයි 31 | හුඳකාල බීජ පොල් උයන, අඹකැලේ | පොල් නැවත සිටුවීම හා පැල වගා පාලනය | 142 | 48 |
| ජූනි 29 | රත්මලාගාර වත්ත | පාංශු හා තෙතමන සංරක්ෂණය | 128 | 43 |
| ජූලි 27 | ප්‍රධාන කාර්යාලය, පොල් පර්යේෂණ ආයතනය | පොහොර නිර්දේශ | 127 | 38 |
| අගෝස්තු 24 | මාකඳුර වත්ත | අතුරු බෝග හා සත්ත්ව පාලනය | 119 | 40 |
| සැප්තැම්බර් 28 | ප්‍රධාන කාර්යාලය, පොල් පර්යේෂණ ආයතනය | පළිබෝධ හා රෝග පාලනය | 112 | 42 |
| ඔක්තෝබර් 25 | රත්මලාගාර වත්ත | වගා පුනරුත්ථාපනය | 97 | 45 |
| නොවැම්බර් 30 | ප්‍රධාන කාර්යාලය, පොල් පර්යේෂණ ආයතනය | වතු කළමනාකරණය | 102 | 50 |

වසර තුලදී බෝග සායන 17 ක් පොල් වගා කිරීමේ මණ්ඩලය හා එක්ව ක්‍රියාත්මක කිරීමට හැකිවිය. ප්‍රදර්ශණ 8 ට සහභාගී වූ අතර පර්යේෂණ ව්‍යාප්ති සංවාද 3 ක් පැවැත්වීමට හැකිවිය. කප්රුක පුරවර සමිති නායකයින් වෙනුවෙන් පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| ස්ථානය | දිනය | විෂය ක්ෂේත්‍රය |
|---|---|---|
| වෙල්පල්ල (පන්නල) කප්රුක සමිතිය | මැයි 8 | පොල් ප්‍රභේද හා පැළ සිටුවීම |
| වෙල්පල්ල (පන්නල) කප්රුක සමිතිය | ජූනි 19 | රතු කුරුමිණි හා කළු කුරුමිණි උවදුර හඳුනා ගැනීම හා පාලනය |
| වෙල්පල්ල (පන්නල) කප්රුක සමිතිය | ජූලි 30 | ප්ලෙසිස්පා, මයිටා හා වේයන්ගේ හානිය හඳුනා ගැනීම හා පාලනය |
| වෙල්පල්ල (පන්නල) කප්රුක සමිතිය | අගොස්තු 16 | පෝෂණ ඌණතා හඳුනා ගැනීම, කාබනික පොහොර සකස් කිරිම, යෙදීම හා අකාබනික පොහොර යෙදීම |
| වෙල්පල්ල (පන්නල) කප්රුක සමිතිය | නොවැම්බර් 22 | පොල් වගාව පිළිබඳ වීඩියෝ දර්ශන හා පුහුණුවට සහභාගීවූවන්ට සහතිකපත් බෙදා දීම |

වෙනත් ආයතන වල නිලධාරීන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් 15 ක්, දැනුවත් කිරීම් සඳහා මාධ්‍ය වැඩසටහන් 2 ක් හා ගුරුවරුන් හා සිසුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් 12 ක් වසර තුලදී පවත්වන ලදී. පොල් තාක්ෂණික පුවත් හා සීආර්අයි පුවත් (ඉංග්‍රීසි මාධ්‍යය) යන ප්‍රකාශණද නිකුත් කරන ලදී. උපදේශ පත්‍රිකා A, B හා C කාණ්ඩ දෙමළ මාධ්‍යයට පරිවර්තනය කර මුද්‍රණය කල අතර B කාණ්ඩය සිංහල මාධ්‍යයෙන්ද මුද්‍රණය කරන ලදී.

***තාක්ෂණ උද්‍යානය:*** පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ උද්‍යානය හොඳින් පවත්වාගෙන යනු ලබන අතර පොල් වගාව පිළිබඳ තොරතුරු හා පොල් නිෂ්පාදන සඳහා උනන්දුවක් දක්වන විශාල පිරිසක් එහි පැමිණේ. ප්‍රකාශන හා නිෂ්පාදන අලෙවියෙන් ලද ආදායමේද සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි.

ආදායම් සාරාංශය (2012)

| වර්ගය | මුදල (රු.) |
|---|---|
| පොලි බැග් පැල | 1,948,625.00 |
| විවිධ නිෂ්පාදන<br>තාක්ෂණ උද්‍යානයේ නිෂ්පාදන<br>වෙනත් ආයතන වල නිෂ්පාදන | <br>366,004.00<br>751,827.00 |
| පොත් /ප්‍රකාශන | 220,655.00 |
| විවිධ | 19,015.00 |
| මුළු මුදල | **3,306,126.00** |

*වෙනත් තාක්ෂණ හුවමාරු/ක්‍රියාකාරකම්:*

1. පොල් පර්යේෂණ ආයතනයට හා අඹකැලේ හුදකලා බීජ පොල් උයනට පැමිණි සිසුන්, ගොවීන් හා වගාකරුවන් සඳහා ප්‍රවේණි හා ශාක අභිජනන අංශය මඟින් දේශණ පැවැත්වීම.

2. ශාක අභිජනන හා අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳව පාසල් සිසුන්, තාක්ෂණ විද්‍යාල සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා පශ්චාත් උපාධි සිසුන් දැනුවත් කිරීම ප්‍රවේණි හා ශාක අභිජනන අංශයේදී හා අණුක ජීව විද්‍යා විද්‍යාගාරයේදී සිදුකිරීම.

3. ආචාර්ය එල් පෙරේරා, ආර් ජයතිලක මහතා සහ බීජ සහ බීජ පැල සහතික කිරීමේ ඒකකයේ නිලධාරීන් විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ බීජ තේරීමේ නිලධාරීන්, නවක පොල් සංවර්ධන නිලධාරීන්, බන්ධනාගාර නිලධාරීන් හා පොල් පර්යේෂණ ආයතනයේ වතු අධිකාරීවරුන් සඳහා ඉබ්බාගමුවේදී බීජ පොල් නිෂ්පාදනය, මව්ශාක තේරීම, පරාග සැකසීම හා ගබඩා කිරීම, අත් පරාගනය, බීජ පොල් උයන් පාලනය, තවාන් පාලනය වැනි ක්ෂේත්‍ර පිළිබඳව පුහුණුවක් ලබාදීම.

4. කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය මඟින් වගාකරුවන් සඳහා පොල් ගස් වල මිළ තක්සේරු කිරීම, පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ගේ සත්‍යතාව අධ්‍යයනය කිරීම, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා දත්ත ලබාදීම හා පර්යේෂණ අංශයන්ගේ පර්යේෂණයන්ගේ ආර්ථික සක්‍යතාවය අධ්‍යයනය කිරීම.

5. පොල් පර්යේෂණ ආයතනය මඟින් පවත්වන ලද "පොල් වගා කෙරෙන පස හා ඉඩම් යෝග්‍යතාව" යන පුහුණු වැඩසටහනේ සම්පත් දායකයකු ලෙස ආචාර්ය ඩී.එම්.ඩී.අයි. විජේබණ්ඩාර මහත්මිය සහභාගී විය.

6. ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා සහ ආචාර්ය ඩී. එම්. ඩී. අයි. විජේබණ්ඩාර මහත්මිය විසින් පාසල් සිසුන්, ගුරුවරුන්, විද්‍යාඥයින්, විශ්ව විද්‍යාල සිසුන් සහ කාර්මික විද්‍යාල සිසුන් සඳහා දේශණ හා පුහුණු පාඨමාලා පැවැත්වීම.

7. ඩී. පී. පණ්ඩිතරත්න මහතා සහ කේ. එල්. රණසිංහ මහතා පොල් පර්යේෂණ ආයතනය මඟින් පැවැත්වූ පොල් වගාවේ ජල සම්පාදනය හා පොල් ඉඩම් පුනරුත්ථාපනය සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනට සම්පත් දායකත්වය ලබාදීම.

8. ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා පොල් පර්යේෂණ ආයතනය මඟින් පැවැත්වූ පොල් වගාව සඳහා පොහොර භාවිතය, පොල් වගාව සඳහා ජල සම්පාදනය සහ පොල් වගා පුනරුත්ථාපනය යන පුහුණු පාඨමාලාවන් සඳහා සම්පත් දායකත්වය ලබාදීම.

9. ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා සහ ආචාර්ය ඩී. එම්. ඩී. අයි. විජේබණ්ඩාර මහත්මිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමා සිසුන් සඳහාවූ පුහුණු පාඨමාලාවට සම්පත් දායකත්වය ලබාදීම.

10. ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා හලාවත වැවිලි සමාගමේ වතු කළමණාකරුවන් සඳහා පොහොර යෙදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

11. ආචාර්ය සී. එස්. රණසිංහ මහත්මිය හා ආචාර්ය ඒ. නයිනනායක මහතා ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, වගාකරුවන් හා පොල් සංවර්ධන නිලධාරීන් සඳහා පොල් ගසේ ශාක කායික විද්‍යාව හා පොල් පලදාව සඳහා පාරිසරික සාධක වල බලපෑම පිළිබඳ දේශණ පවත්වන ලදී. පොල් ගසේ ශාක කායික විද්‍යාව පිළිබඳ තොරතුරු ප්‍රදර්ශණ වලදීද ඉදිරිපත් කරන ලදී.

12. ආචාර්ය එල්. සී. පී. ප්‍රනාන්දු මහත්මිය විසින් පොල් වගාවේ රෝග හා පළිබෝධ සමෝධානික පාලනය පිළිබඳ ආරාධිත දේශණයක් 2012. 07.01 සිට 2012.07.06 දින දක්වා පවත්වන ලද 45 වන කොකොටෙක් හමුවේදී පවත්වන ලදී.

13. අයි. එම්. එස්. කේ. ඉදිරිසිංහ මහතා ආයතනයේ මූලධන භාණ්ඩ මිළදී ගැනීමේ කමිටු සඳහා සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය.

14. පොල් සැකසුම් පර්යේෂණ අංශය මඟින් පොල් නිෂ්පාදන තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව විශ්ව විද්‍යාල සිසුන්, කාර්මික විද්‍යාල සිසුන්, පාසල් සිසුන්, පොල් සංවර්ධන නිලධාරීන්, මහවැලි සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හා බන්ධනාගාර නිලධාරීන් සඳහා දේශණ හා ආදර්ශණ පවත්වන ලදී. මෙවැනි වැඩසටහන් පොල් තෙල්, පොල් තලපය, පොල් කිරි (2), නටාඩි කෙකෝ (1), නැවුම් පොල් තෙල් (4), බෝතල් කල පොල් වතුර (1) සංඛ්‍යාවක්

වසර තුලදී පවත්වන ලදී. තවද කුලියාපිටිය විදාතා මධ්‍යස්ථානයේ හා විහාර මහාදේවී උද්‍යානයේ පැවති Health Fest ප්‍රදර්ශණයේදී පොල් නිෂ්පාදන පිළිබඳව දැනුවත් කරන ලදී.

**2.** පොල් වගාවේ දියුණුව සඳහා 2012 වසර තුල සිදුකරන ලද වෙනත් ක්‍රියාකාරකම්

1. කප්රුවන පොල් ප්‍රභේදය මහා පරිමාණ වශයෙන් නිපදවීම සඳහා බීජ පොල් උයනක් ස්ථාපනය කිරීමට හලාවත වැවිලි සමාගම සමඟ එකඟතාවයක් ඇති කර ගන්නා ලදී. කිනියම වත්තේ අක්කර 100 ක භූමි ප්‍රමාණයක් මේ සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය.

2. මොණරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් යෝග්‍යතා අධ්‍යයන නිම කර සිතියම් සකස් කෙරිණි.
3. පොල් පර්යේෂණ ආයතනයේ බීජ පොල් උයන් තුලින් වැඩි දියුණු කල වගා දර්ශයන්ගේ බීජ පොල් 1,538,174 ක් (සීආර්අයිසී 60 1,051,128, සීආර්අයිසී 65 47,953, සීආර්අයිඑස්එල් 98 21,063 සහ කප්රුවන 3,252) නිපදවන ලදී.

4. පොල් පර්යේෂණ ආයතනයේ බීජ සහතික කිරීමේ සේවාව මඟින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ තවාන් වලදී පොලි බෑග් පොල් පැල 414,778 ක් සහතික කරන ලදී.

5. පොල් වගාවේ තාක්ෂණ ක්‍රමයන් හඳුන්වාදීම සඳහා වගාකරුවන් 20 දෙනෙකුගේ ඉඩම් වල උපයෝගීතා පරීක්ෂණ ස්ථාපිත කරන ලදී.

6. වැලිගම පොල් කොළ මැළවීමේ රෝගයට පාත්‍රවීමෙන් ඉවත් කරන ලද වගාවන් වෙනුවෙන් ප්‍රතිරෝධී ප්‍රභේදයක් වන කුන්දිරා ගෙඩි 143,000 ක් තවාන් කරන ලදී.

7. පොල් මයිටාවා විලෝපිත මයිටාවන් (නියෝසිලස් බරාකි) බෝකිරීම සඳහා පර්යේෂණාගාර තුනක් ස්ථාපනය කරන ලදී. තවත් පර්යේෂණාගාර 7 ක් පිහිටුවීම සඳහා (පොල් වගාකිරීමේ මණ්ඩලය (5), කුරුණෑගල වැවිලි සමාගම (1) සහ හලාවත වැවිලි සමාගම (1) සහය වූ අතර එම සියළු පර්යේෂණාගාර සාර්ථකව ක්‍රියාත්මක වේ.

8. පොල් පර්යේෂණ ආයතනය මඟින් සොයා ගන්නා ලද පොල් ආශ්‍රිත නිෂ්පාදන තාක්ෂණයන් ව්‍යවසායකයන් වෙත සෘජුව හෝ විදාතා මධ්‍යස්ථාන හරහා ලබාදෙන ලදී.

## 3. වතු කළමනාකරණ ක්‍රියාකාරකම්



වතු කළමනාකරණ අංශය යටතේ ජාන සම්පත් මධ්‍යස්ථාන 3 ක් හා පර්යේෂණ මධ්‍යස්ථාන 7 ක් සාර්ථකව කළමනාකරණය කරන ලද අතර අළුතින් ස්ථාපනය කරන ලද මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය හැර අනෙකුත් සියළුම වතු ස්වයං මුල්‍යා ඒකකයන් ලෙස නඩත්තු විය. ජාන සම්පත් මධ්‍යස්ථාන වල මුළු බිම් ප්‍රමාණය අක්කර 1980 ක් හා පර්යේෂණ මධ්‍යස්ථාන වල බිම් ප්‍රමාණය අක්කර 1093 ක් විය. වතු කළමනාකරණ අංශයේ මූලික පරමාර්ථය ජාන සම්පත් මධ්‍යස්ථාන තුලින් ඉහළ ගුණාත්මයකින් යුත් බීජ පොල් තවාන් වලට ලබාදීමයි. මීට අමතරව පර්යේෂණ අංශ සඳහා විවිධ කෘෂි දේශගුණික කලාප තුල, විවිධ පාංශු වර්ග තුල, විවිධ පොල් ප්‍රභේද භාවිතා කර පර්යේෂණ පැවැත්වීම සඳහා පහසුකම් සපයා දීමේ කාර්යභාරයද මෙම අංශය සතුය. මෙම පර්යේෂණ ක්ෂේත්‍ර නඩත්තු කටයුතු වතු කළමනාකරණ අංශයේ කාර්ය මණ්ඩලය මඟින් සිදුකරයි. තවද නව තාක්ෂණ ක්‍රම සම්බන්ධ ආදර්ශණ වගාවන් පවත්වා ගනිමින් පර්යේෂකයන්, වතු කළමණාකරුවන්, පොල් වගාකරුවන්, විශ්ව විද්‍යාල සිසුන් හා පාසල් සිසුන් දැනුවත් කිරීමටද දායක වේ. පර්යේෂණ මධ්‍යස්ථාන වලදී එක්දින පුහුණු වැඩසටහන් පැවැත්වීමට පහසුකම් ලබාදීමටද කටයුතු කෙරිණි.

වසර 2005 දී ආරම්භ කරන ලද අක්කර 75 ක මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය සංවර්ධනය වෙමින් පවතී. මෙහි සිටුවන ලද පොල් පැල 2839 කින් 65% ක් මේ වන විට මල් හටගන්නා අවස්ථාවට පත්වී ඇත. මෙම පර්යේෂණ මධ්‍යස්ථානය දකුණු පළාතේ පොල් වගාකරුවන් වෙත පොල් වගාවට අදාළ නව තාක්ෂණික දැනුම ලබාදීමට වැදගත් වේ.

අඹකැලේ, මාදුරුඔය හා පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථාන ඉතා හොඳින් නඩත්තු කරමින් බීජ පොල් නිෂ්පාදනය සිදුකෙරිණි. මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය පසේ සාරවත් බව වැඩිදියුණු කිරීම සඳහා වූ පර්යේෂණ හා කෘෂි වන වගා පර්යේෂණ සඳහා යොදා ගැණින. අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ විශේෂ ක්ෂේත්‍ර කිහිපයක සීආර්අයිසී 65 දෙමුහුම් බීජ පොල් නිපදවීමට යොදා ගැනුනේ ගෙවතු වගා ව්‍යාපෘති සඳහා බීජ පොල් ලබා දීම සඳහාය. වසර 2012 දී මෙම ජාන සම්පත් මධ්‍යස්ථාන මඟින් වැඩි දියුණු කල බීජ පොල් 1,538,174 ක් (සීආර්අයිසී 60-1,051,128, සීආර්අයිසී 65-47,953, සීආර්අයිඑස්එල් 98-21,063 සහ කප්රුවන 3,252) නිපදවනු ලැබීය.

පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානය, රත්මලාගාර හා වල්පිට පර්යේෂණ මධ්‍යස්ථාන තුලින් තෝරාගත් උසස් ලක්ෂණ ඇති මව් ශාක වලින්ද බීජ පොල් 249,735 ක් නිෂ්පාදනය කෙරිණි.

අනෙකුත් සියළුම වතුද ඉතා හොඳින් නඩත්තු කරන ලදී. මේවායේ අස්වැන්න පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසිය හරහා අළෙවි කෙරිණි. 2012 වසරේදී ජාන සම්පත් මධ්‍යස්ථාන හා පර්යේෂණ මධ්‍යස්ථාන වල වගාවන්ගෙන් 90% පොහොර යොදා ඇත.

මෙම වසර තුලදී සියළු වතු වලට අයත් වැටවල් මීටර 13,000 ක් අළුත්වැඩියා කල අතර රුපියල් මිලියන 8.67 වැය කර මීටර් 3200 ක ප්‍රමාණයක අළුත් වැටවල් ඉදිකෙරිණි. අක්කර 2087 ක වල් මර්ධනය හා ගස් 97,783 ක වසුන් යෙදීම සඳහා පිළිවෙලින් රු. 8,706 ක් සහ රු. මිලියන 8.79 ක් වැය විය. අස්වනු ලබා ගැනීම සඳහා රු. මිලියන 8.514 ක් වැය වූ අතර මුළු පොල් එලදාව ගෙඩි මිලියන 4.987 ක් විය. වැටුප් සහ අනෙකුත් නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 35.796 ක් වැය වූ අතර මුළු වියදම රු. මිලියන 79.248 කි. 2012 වසර තුලදී මුළු ආදායම රු. මිලියන 10,416 ක් විය. පහත දැක්වෙන වගුවෙන් ආදායම් සහ වියදම් විස්තරය දක්වා ඇත.

| GRCs* and Research Centres | BE | RE | ISG | PRS | WE | MKSG | MOSG | PSG | DE | EM | TOTAL 2012 | Total 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. (000) | Rs. | Rs. |
| GC* | 3,016 | 3,773 | 6,476 | 3,377 | 983 | 3,115 | 3,435 | 3,751 | 642 | 14,242 | 42,813 | 35,603 |
| Wages | 3,937 | 2,803 | 4,359 | 1,770 | 349 | 1,329 | 1,282 | 3,050 | 571 | 1,846 | 21,300 | 22,037 |
| Upkeep | 1,550, | 1,267 | 7,085 | 1,156 | 466 | 1,429 | 1,465 | 3,567 | 1,615 | | 19,605 | 19,223 |
| CP* | 1,643 | 1,593 | 3,120 | 1,223 | 220 | 812 | 675 | 368 | 133 | | 9,789 | 15,510 |
| Pick* | 2,149 | 964 | 1,885 | 1,163 | 315 | 460 | 952 | 1,043 | 79 | | 9,013 | 7,673 |
| Copra* | 381 | 174 | 174 | 308 | 19 | 121 | 47 | 229 | 16 | | 1,472 | 981 |
| Animal* | 1,356 | 629 | 615 | 490 | | 534 | 338 | 612 | 157 | | 4,734 | 4,340 |
| **TOTAL (E)*** | **14,031** | **11,208** | **23,717** | **9,491** | **2,354** | **7,802** | **8,195,682** | **12,623** | **3,216** | **16,088** | **108** | **105,371** |
| Copra sales | 796 | 254 | 96 | 340 | 16, 3 | 38 | 56 | 556 | | 304 | 2,460 | 1,074 |
| Coconut sales | 13,838 | 10,673 | 29,832 | 17,264 | 3,063 | 8,744 | 16,743 | 12,335 | 1,010 | -571 | 113,505 | 100,662 |
| Seedling sales | 81 | 303 | 1,274 | | 498 | 456 | 89 | 1,289 | 1,518 | 677 | 6,188 | 5,491 |
| Sundries | 1,711 | 520 | 296 | 246 | 215 | 349 | 11 | 477 | 14 | 1,558 | 5,400 | 7,450 |
| Sale of A & AP* | 1,915 | 337 | 614 | 882 | | 1,091 | 217 | 640 | 67 | | 5,768 | 4,594 |
| Total (S)* | **18,342** | **12,088** | **32,113** | **18,734** | **3,794** | **10,680** | **17,118** | **15,299** | **2,611** | **2,539** | **133,323** | **119,274** |
| **S/D*** | 4,037 | 1,768 | 4,638 | 3,958 | 1,292 | 4,256 | 9,792 | 1,940 | -1,400 | -14,122 | 16,162 | 33,674 |
| **S/D (N)*** | **2,761** | **1,408** | **3,897** | **3,624** | **1,192** | **4,047** | **9,544** | **790** | **-1,608** | **-15,242** | **10,416** | **29,496** |

* GRCs, Genetic Resources Center (GRC), GC, General charges, CP, Cultural practices, Pick, Cost for harvesting nuts, * Total (E), Sale of animals and animal produce, Total (S), Total sales, S/D, surplus/deficit, S/D (N), surplus/deficit (Net)

## 4. සංවර්ධන කටයුතු

1. කෘෂි කාළගුණ දත්ත ලබා ගැනීමේ හා එම මධ්‍යස්ථාන නඩත්තු කිරීමේ කටයුතු ශාක කායික විද්‍යා අංශයට පැවරීමට කටයුතු කෙරිණි.

2. මිද්දෙනිය පර්යේෂණ මධ්‍යස්ථානයේ කෘෂි කාළගුණික දත්ත මධ්‍යස්ථානයක් ස්ථාපනය කෙරුන අතර එහි දත්ත ලබා ගැනීම 2013 පෙබරවාරි ආරම්භ කිරීමට නියමිතය.

3. කොහු සැකසුම් පර්යේෂණ සඳහා නව විද්‍යාගාරයක් ඉදිකරනු ලැබීය.

4. ශෂ්‍ය විද්‍යා, ශාක කායික විද්‍යා සහ වගා සංරක්ෂණ අංශ වලට අයත් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර තීන්ත ආලේප කරන ලදී.

5. පරපෝෂිත අභිජනන විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කරන ලදී.

6. ආයතනයේ ආගන්තු නිවාසය ප්‍රතිසංස්කරණය කර වැඩිදියුණු කරන ලදී.

7. පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිරිපස වැට ඉදිකිරීමේ කටයුතු නිමකරන ලදී.

8. ප්‍රධාන කාර්යාල පරිශ්‍ර යේ වීථි ලාම්පු සවිකරන ලදී.

## 5. පාර්ශ්වකරුවන් වෙත සපයන ලද සේවාවන්

1. ස්ථාන 12 ක ස්ථාපනය කරන ලද විලෝපිත මයිටා අභිජනන මධ්‍යස්ථාන සාර්ථකව ක්‍රියාත්මක වෙමින් විලෝපිත මයිටා අඩංගු කුඩා පැකට්ටු 48,850 ක් නිපදවා වගාකරුවන්ට ලබා දෙන ලදී.

2. පොල් වගාකරුවන් 110 කට අයත් අක්කර 9,372 ක පොල් වගාවන් සඳහා පොල් කොළ සාම්පල විශ්ලේෂණය කර ආන්තරික පොහොර නිර්දේශයන් ලබාදෙන ලදී.

3. තත්ත්ව සහතික නිකුත් කිරීම සඳහා අකාබනික පොහොර සාම්පල 343 ක් සහ කාබනික පොහොර සාම්පල 124 ක් විශ්ලේෂණය කරන ලදී.

4. රතු කුරුමිණි පාලනය කිරීම සඳහා පෙරමෝන නල 3,998 ක් නිපදවා වගාකරුවන්ට ලබා දෙන ලදී.

5. කොහුබත් සහ තැඹිලි අපනයනය සඳහා සහතිකපත් 47 ක් නිකුත් කරන ලදී.

6. පොල් වතු වල සත්ත්ව පාලනය උසස් කිරීම සඳහා එළුවන් හා බැටලුවන් 22 ක් අභිජනනය කර පොල් වගාකරුවන් වෙත ලබාදෙන ලදී.

7. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දත්ත සංචිතය සඳහා ආයතනයේ කෘෂි කාලගුණවිද්‍යා මධ්‍යස්ථාන වලින් ලබාගන්නා දත්ත ලබා දෙන ලදී. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පර්යේෂණ ආයතන, සිසුන් හා වගාකරුවන් 80 ක් පමණ ආයතනයෙන් දත්ත ලබා ගැනීමට ඉල්ලුම් කල අතර දත්ත ලබා දීමට කටයුතු කරන ලදී.

8. අපනයනය සඳහා තැඹිලි කල්තබා ගැනීමේ ක්‍රමවේදය අපනයනකරුවන් 15 දෙනෙකුට ලබා දී ඇති අතර වසර තුලදී තැඹිලි ගෙඩි 200,000 ක් පමණ අපනයනය කර ඇත.

9. කළල රෝපිත දීකිරි පැළ 65 ක් ඒ සඳහා කැමැත්තක් දක්වන වගාකරුවන් වෙත ලබාදෙන ලදී.

## 6. සම්මන්ත්‍රණ, වැඩමුළු, උපදෙස් ලබාගැනීම් ආදිය

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික අධිකාරිය මඟින් පැවැත්වූ Toxicology Clinical, Industrial and Environmental Application නම් වූ පුහුණු වැඩමුළුවට 2012 ජනවාරි මස 20 දින සහභාගී විය.

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය ජාතික විද්‍යා පදනම මඟින් පැවැත්වූ Social Science Research and Comprehensive Research Proposal Development නම් වූ පුහුණු වැඩමුළුවට 2012 පෙබරවාරි මස 24 දින සහභාගී විය.

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය මඟින් පැවැත්වූ ආහාර ආකලනය, අපවිත්‍රවීම සහ ආරක්ෂණය නම් වූ වැඩමුළුවට 2012 මාර්තු මස 21 දින සහභාගී විය.

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම මඟින් පැවැත්වූ පර්යේෂණ ආචාරධර්ම සම්මන්ත්‍රණයට 2012 අප්‍රියෙල් මස 20 දින සහභාගී විය.

ඒ. ආර්. කුලතුංග මහතා සීමාසහිත ටෙක්නො ඉන්ස්ට්‍රුමන්ට් (පුද්ගලික) ආයතනයේ පැවති Agilent Spectroscopy සම්මන්ත්‍රණයට 2012 අප්‍රියෙල් මස 24 දින සහභාගී විය.

ඩබ්. පී. කේ. කේ. ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් පවත්වන ලද accreditation of testing and calibration laboratories පුහුණු වැඩසටහනට 2012 මැයි මස 14 – 18 දක්වා සහභාගී විය.

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් පවත්වන ලද Accreditation: Supporting Safe Food and Clean Drinking Water පුහුණු වැඩමුළුවට 2012 ජූනි මස 12 දින සහභාගී විය.

වී. ජී. ඩී. නයනක මහතා තරුණ විද්‍යාඥයින්ගේ සංගමය මඟින් සංවිධානය කරන ලද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැවති නව නිමැවුම් හා නවොත්පාදන පිළිබඳ වැඩමුළුවට 2012 ජූනි මස 26 දින සහභාගී විය.

වී. ජී. ඩී. නයනක මහතා ජාතික විද්‍යා පදනම මඟින් සංවිධානය කරන ලද පර්යේෂකයන් තොරතුරු සම්බන්ධව බල ගැන්වීම පිළිබඳ වැඩමුළුවට 2012 අගෝස්තු මස 12 දින සහභාගී විය.

ආචාර්ය එස්. එච්. සේනාරත්න මහතා සහ ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ජාතික පරමාණුක බලශක්ති අධිකාරිය විසින් සංවිධානය කර අගෝස්තු 27 – 31 දක්වා කොළඹදී පවත්වන ලද පසේ

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පාලනය සහ නායකත්වය පිළිබඳව පැවති පුහුණු වැඩසටහනට 2012 සැප්තැම්බර් මස 25 දින සහභාගී විය.

පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් සැප්තැම්බර් මස 30 - ඔක්තෝබර් මස 01 දින දක්වා තාජ් සමුද්‍ර හෝටලයේදී පැවති 4 වන වැව්ලි බෝග පර්යේෂණ සම්මන්ත්‍රණය වෙනුවෙන් සහභාගී විය. මෙහිදී පර්යේෂණ නිලධාරීන් 6 දෙනෙකු පර්යේෂණ පිළිබඳ දේශණ ඉදිරිපත් කරන ලදී.

ඒ. ආර්. කුලතුංග මහතා සහ ගංගා වීරසිංහ මහත්මිය ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය මඟින් පැවැත්වූ රසායනාගාර තත්ත්ව හා ඵලදායීතාව ඉහළ නැංවීම පිළිබඳ සම්මන්ත්‍රණයට 2012 ඔක්තෝබර් මස 18 දින සහභාගී විය.

වී. ජී. ඩී. නයනක මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යා සංගමය මඟින් සංවිධානය කල පොල් පර්යේෂණ ආයතනයේ පැවති වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයට 2012 නොවැම්බර් මස 23 දින සහභාගී විය.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී කාබනික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා ජාතික පාර්ශ්වකරුවන්ගේ විශේෂඥ උපදෙස් ලබා ගැනීම සඳහා වූ වැඩමුළුවට 2012 දෙසැම්බර් මස 6 දින සහභාගී විය.

වී. ජී. ඩී. නයනක මහතා ශ්‍රී ලංකා පාංශු විද්‍යා සංගමය මඟින් සංවිධානය කල බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ පැවති පොහොර දිනයට 2012 දෙසැම්බර් මස 14 දින සහභාගී විය.

පී. එම්. ඊ. කේ. පතිරාජ මහත්මිය වෙළඳපල ආරක්ෂණය සහ පොල් නිෂ්පාදනය සඳහා කාලීනව ඇතිවන සන්සන්දනාත්මක වාසිය ඇගයීම පිළිබඳව 2012 දෙසැම්බර් මාසයේදී පොල් පර්යේෂණ ආයතනයේදී දේශණයක් පවත්වන ලදී.

කේ. වී. එන්. එන්. ජයලත් මහත්මිය ලෝක වෙළඳපලේ මිළ ශ්‍රී ලංකා පොල් කර්මාන්තයට බලපාන

අන්දම පිළිබඳ දේශණයක් ආයතනයේදී පවත්වන ලදී.

එච්. ඒ. ඊ. සමරනායක මහත්මිය ජාතික විද්‍යා පදනම මඟින් පවත්වන ලද Empowering Researches with Information පුහුණු වැඩසටහනට සහභාගී විය.

**විදේශ ගමන්**

එන්. අයි. සුවඳරත්න මහත්මිය තායිලන්තයේ බැංකොක්හි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ටෙට්‍රාස්ටිකස් බ්‍රොන්ටිස්පේ පරපෝෂිත අභිජනනය පිළිබඳ පුහුණුවක් 2012 ජනවාරි මස 10-26 දක්වා ලබාගන්නා ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා ඉන්දියාවේ CPCRI හි දේශීය හා විදේශීය පොල් ජාන සම්පත් බැංකු තත්ත්වය අධ්‍යයනය කිරීමට Coconut Genetic Resource Network වෙනුවෙන් 2011 ජනවාරි මස 13 – 22 දක්වා සහභාගී විය.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ඉන්දියාවේ චෙන්නායිහි එම්. එස්. ස්වාමිනාදන් පර්යේෂණ පදනමේ පැවති Sustainable Development; Twenty years after RIO ජාත්‍යන්තර සමුළුවට 2012 පෙබරවාරි මස 15 – 17 දක්වා සහභාගී විය.

ආචාර්ය එල්. සී. පී. ප්‍රනාන්දු මහත්මිය 2012 පෙබරවාරි මස 16 – 18 දක්වා තායිලන්තයේ පැවති ජාතික පොල් සම්මේලනයේදී ඔපිසිනා ඇරිනොසෙල්ලා පොල් දළඹුවාගේ සමෝධානික පාලනය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා පිලිපීනයේ ඇල්බායි පර්යේෂණ මධ්‍යස්ථානයේ සහ සැන්බොඅන්ගා පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යයන චාරිකාවක් වෙනුවෙන් 2012 අප්‍රියෙල් මස 9-24 දක්වා සහභාගී විය.

ආචාර්ය එල්. පෙරේරා මහතා ඉන්දියාවේ කොචින්හි පැවති COGENT Steering කමිටුවට 2012 ජූලි මස 8 – 10 දක්වා සහභාගී විය.

කුමුදු ප්‍රනාන්දු මහත්මිය ඉන්දියාවේ බැන්ගලෝරයේ පැවති Global Natural Fibers සමුළුවට 2012 සැප්තැම්බර් මස 25 – 26 දක්වා සහභාගී විය.

## 7. සහයෝගීතාවයන්/හවුල්කරුවන්

පොල් තෙල් හා වෙනත් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යමය වාසි පිළිබඳ පර්යේෂණයක් සඳහා පොල් පර්යේෂණ ආයතනය කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ එකඟතාවයක් ඇති කරගන්නා ලදී. මේ සඳහා වූ අවබෝධතා ගිවිසුම කැළණිය විශ්ව විද්‍යාලයේ උප කුලපති කාර්යාලයේදී 2012 මැයි මස 14 දින අත්සන් කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය,පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දොඩන්ගොල්ල ගොවිපල පරිශ්‍රයේ විශ්ව විද්‍යාල සිසුන්ට පොල් වගාව පිළිබඳ පුහුණු කටයුතු හා පර්යේෂණ කටයුතු වල නිරත වීමට රුකුලක් ලෙස පොල් වගාව පිළිබඳ ආදර්ශණයක් ස්ථාපිත කිරීමට සහයෝගය ලබාදෙන ලදී. මේ සඳහා වැඩි දියුණු කල නව දෙමුහුම් ප්‍රභේද වල පොල් පැල පොල් පර්යේෂණ ආයතනය මඟින් ලබා දෙන ලදී.

පොල් පර්යේෂණ ආයතනය, හේකාබ් ආයතනය සහ කර්මාන්ත සේවා කාර්යාංශය සමඟ පරිසර හිතකාමී පොල් කටු අඟුරු උඳුනක් සෑදීම සඳහා එකඟතාවයකට එළඹිණි.

## 8. විදේශීය සහයෝගීතාවයන් (FAO, COGENT, WFC යනාදිය)

පොල් පර්යේෂණ ආයතනය ලෝක කෘෂිවනවගා මධ්‍යස්ථානය සමඟ පොල් ඉඩම් වල කෘෂිවනවගා සංවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණ සහයෝගීතා වැඩසටහන යටතේ දකුණු පළාතේ දැනට පැතිර පවතින වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය කලින් හඳුනා ගැනීමට සහ රෝගය පැතිරයාම වැළැක්මේ ක්‍රම දියුණු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 307,000 ක මූල්‍යමය ආධාර සහ තාක්ෂණික සහාය ලැබිණි.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශයේ අංශ ප්‍රධානී ආචාර්ය එල්. පෙරේරා මහතා COGENT Steering කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්කරනු ලැබීය.

ශ්‍රී ලංකා කියුබානු නව තානාපතිනිය අතිගරු ඉන්දිරා ලෝපෙස් මහත්මිය දෙසැම්බර් මස 4 වන දින පොල් පර්යේෂණ ආයතනයට පැමිණ අධ්‍යක්ෂ මණ්ඩලය සහ නිලධාරීන් හමුවී පොල් වගාව සංවර්ධනය සඳහා කියුබානු රජය සමඟ ඇතිකරගත් සහයෝගීතාවය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

පහත සඳහන් නියෝජිතයන් ගතවූ වසරේදී පොල් පර්යේෂණ ආයතනයට පැමිණෙන ලදී.

Paio Yongfan, Senior Plant Protection Officer, FAO Regional Office , Bangkok, Thailand

Dr. Rethinam Ponniah, Lead consultant, FAO-TEC Project on Weligama Coconut Leaf Wilt Disease (WCWLD)

Prof. Toyoki Kozai, Emeritus Professor, Chiba University, Japan

Mr. Keita Iwase, Second Secretary, Embassy of Japan, Colombo

Dr. Manimekalai, FAO Consultant, Central Plantation Crop Research Institute, Kasaragod, Kerala, India

Dr. Roland Bourdex the COGENT coordinator

Mr. Patrick Evans, FAO Representative in Sri Lanka

Dr. Mathew Jacob, Principal Coconut Breeder, CPCRI

Dr. O R Reddy, Pathologist, Former Joint Director (Plant Pathology), Department of Agriculture and Cooperation, Government of India

Dr. R J Rabindra, Entomologist, Former Director, National Bureau of Agriculturally Important Insects, Bangalore, India

## 9. වෙනත් සැළකිය යුතු සංවර්ධනයන්

### 9.1 නව ප්‍රකාශන

1. පොල් පර්යේෂණ මණ්ඩලයේ සභාපති මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා විසින් "පර්යේෂණ යෝජනා පිළියෙල කිරීමේ මඟ" ( ISBN 978-955-9013-11-2) නමින් ප්‍රකාශණයක් එළිදැක්වීය.

2. වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය: සය වසරකට පසු (ISBN 978-955-9013-10-5)
   වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය 2006 වසරේ දී ශ්‍රී ලංකාවේ දකුණු පළාතෙන් වාර්තා විය. මෙය පයිටොප්ලාස්මා මඟින් ඇතිවන සුවකල නොහැකි රෝගී තත්ත්වයකි. පොල්

සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් මෙම රෝගය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති තීරණ ගණනාවක් ගනු ලැබීය. මෙම පොත මඟින් 2006 – 2012 කාලයේදී රෝග පාලනයට ගත් ක්‍රියාමාර්ග හා ඒවායේ ප්‍රගතිය විස්තර කරයි. එබැවින් මෙම පොත විද්‍යාඥයින්ට රෝගය තුරන් කිරීමට වැඩිදුර පර්යේෂණ සැලසුම් කිරීමටත්, ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඉදිරියේ ඇතිවිය හැකි මෙවැනි රෝග පාලනයට ගත යුතු ක්‍රියාමාර්ග අධ්‍යයනයටත් ප්රයෝජනවත් වනු ඇත.

## 9.2 පොල් පර්යේෂණ ආයතනය මඟින් සංවිධානය කල වැඩමුළු හා සම්මන්ත්‍රණ

1. කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂිව්‍යාපාර කළමනාකරණ අංශය අනෙකුත් අංශ වල සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා කෘෂි ආර්ථික විද්‍යා සංගමයේ 6 වන වාර්ෂික පර්යේෂණ වැඩමුළුව සංවිධානය කරන ලදී. එහි තේමාව Greening the Economy: Challenges from Rio+20 to Sri Lankan Agriculture/Plantation Sector විය.

2. ශාක කායික විද්‍යා අංශය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාවයෙන් කාලගුණ දත්ත ලබා ගැනීමේ යෙදී සිටින නිලධාරීන් සඳහා එක්දින පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

3. පොල් සැකසුම් පර්යේෂණ අංශය Switch Asia ආයතනය සමඟ සහයෝගීතාවයෙන් වඩාත් පිරිසිදු දිසිදි පොල් නිපදවීම ප්‍රචලිත කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.

## 9.3 ආයතනයේ කාර්යමණ්ඩලය විසින් පශ්චාත්,උපාධිධාරී සහ ඩිප්ලෝමා සිසුන් අධීක්ෂණය

Dr. C.S. Ranasinghe supervised the M.Sc. project of Ms Jayaranjanie Sivasubramanium, a student of Postgraduate Institute of Agriculture (PGIA), Peradeniya, and continued for M Phil. Title, 'Estimation of canopy photosynthesis of adult coconut palms of different varieties and its variation with soil moisture availability'

Dr. (Ms) S A C N Perera supervised the M Phil research project of Miss. L. C. J. Kamaral, University of Sri Jayawardenepura. Tiltle 'Determination of yellow dwarf coconut population structure in Sri Lanka'

Dr. C S Ranasinghe supervised in-plant research training of Ms G M N Sanjeewani, B.Sc. (Agric), Faculty of Agriculture, University of Peradeniya

Dr. S.H.S. Senarathne supervised the fianl year research project of Miss. I.M.P.S. Illangamudali's, an undergraduate student of Rajarata University

Dr. S.H.S. Senarathne supervised a B.Sc. (Agriculture) final year research project of Miss. Nishamani Ratnayake of Uwa Wellassa University of Sri Lanka.

Dr. (Mrs.) D.M.D.I. Wijebandara supervised the B.Sc. (Agriculture) final year research project of Mr. D'heer Jeron of Faculty of Bioscience Engineering, Ghent University, Belgium.

Dr. H T R Wijesekara and N S Aratchige supervised the supervised the B.Sc. (Agriculture) final year research project of Ms H M P C Kumarihamy of of Sabaragamuwa University

Dr N S Aratchige and N I Suwandarathne supervised the supervised the B.Sc. (Agriculture) final year research project of Ms. B D C D Bentharage of Uwa Wellassa University

Dr N S Aratchige supervised the supervised the B.Sc. (Agriculture) final year research project of Ms E A N Kaushala of Uwa Wellassa University.

Dr. H T R Wijesekara and N S Aratchige supervised the supervised the B.Sc. (Agriculture) final year research project of M.S.N. Premarathna of Rajarata University

Dr. J. M. M.A Jayasundera supervised undergraduate research project of Ms. Supeshala Oshani, Department of Food Science and Technology, Faculty of Livestock, Fisheries and Nutrition, Wayamba University of Sri Lanka

Mrs. E. Samaranayake supervised undergraduate research project Ms. Gamlath Department of Food Science and Technology, Faculty of Livestock, Fisheries and Nutrition, Wayamba University of Sri Lanka

Mr R M N A Rathnayake, an Agriculture diploma student of HNDT Apprentices completed his practical training under the supervision of Dr C S Ranasinghe at the Plant Physiology Division from March to July 2012.

Dr. (Mrs.) D.M.D.I. Wijebandara supervised a Higher National Diploma in Technology research project of Miss. Udari of National Apprentice & Industrial Training Authority , Naiwala, Sri Lanka. The title of the study was “Soil and leaf nutrient status of oil palm growing soils of wet zone of Sri Lanka”.

## 10. කාර්ය මණ්ඩල කරුණු

### 10.1 කාර්ය මණ්ඩලය ලද කෙටිකාලීන (දින 7 ට වැඩි) සහ දිගුකාලීන පුහුණුවීම්

කේ. ඒ. එස්. සී. එන්. ප්‍රනාන්දු මහතා Ingrin Institute of Printing and Graphics Sri Lanka Ltd ආයතනයේ ඕෆ්සෙට් මුද්‍රණය පිළිබඳ මාස 4 ක සහතික පත්‍ර පාඨමාලාවකට සහභාගී විය.

## 10.2 පශ්චාත් උපාධි පුහුණුවීම්

ශාක කායික විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරී එච්. සී. මෙන්ඩිස් මහතා 2009 අගෝස්තු 11 දින සිට ඇමරිකාවේ ෆ්ලොරිඩා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයනය කටයුතු වල නිරතවෙමින් සිටී.

ඉන්දිකා හේරත් මහත්මිය නවසීලන්තයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සිටී.

ප්‍රමුදිතා වෛද්‍යරත්න මහත්මිය නවසීලන්තයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සිටී.

එම්. කේ. එෆ්. නදීෂා මෙනවිය 2012 ජනවාරි මස 2 දින සිට ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් අධ්‍යයන නිවාඩු ලබා ඇත.

පර්යේෂණ නිලධාරී ඒ.ඩී.එන්.ටී. කුමාර මහතා ඉන්දියාවෙන් ප්‍රධානය කරන ලද ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ බැන්ගලෝරයේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිය හදාරමින් සිටී.

එන්. අයි. සුවදරත්න මහත්මිය පේරාදෙණිය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු වල නිරතවෙමින් සිටී.

පර්යේෂණ නිලධාරී එම්. ජී. එම්. කේ. මීගහකුඹුර මහතා 2012 සැප්තැම්බර් මස 5 දින සිට චීනයේ කුමින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇත.

## 10.3 සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි

කේ. වී. එන්. එන්. ජයලත් මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශයේ මහාචාර්ය ජේ. වීරහේවා සහ මහාචාර්ය එල්. එච්. පී. ගුණරත්න යන අයගේ අධීක්ෂණය යටතේ සම්පූර්ණ කරන ලදී.

පී. එම්. ඊ. කේ. පතිරාජ මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශයේ මහාචාර්ය ජේ. වීරහේවා සහ ආචාර්ය ෆෙඩ්රික් අබේරත්න යන අයගේ අධීක්ෂණය යටතේ සම්පූර්ණ කරන ලදී.

## 10.4 පත්වීම්

| | | |
|---|---|---|
| 1. | ආචාර්ය ආර් පී බී එස් එච් එස් සේනාරත්න | අංශ ප්‍රධානී/ශෂ්‍ය විද්‍යා |
| 2. | ආචාර්ය අයි එම් එස් කේ ඉදිරිසිංහ | අංශ ප්‍රධානී/කෘෂි ආර්ථික |
| 3. | ආචාර්ය වී ආර් එම් විදානාරච්චි | අංශ ප්‍රධානී/පටක රෝපණ |
| 4. | ආචාර්ය එච් ටී ආර් විජේසේකර | අංශ ප්‍රධානී/වගා සංරක්ෂණ |
| 5. | ආචාර්ය එස් ඒ සී එන් පෙරේරා | ප්‍රධාන පර්යේෂණ නිලධාරී |
| 6. | ආචාර්ය එන් එස් ආරච්චිගේ | ප්‍රධාන පර්යේෂණ නිලධාරී |
| 7. | ආචාර්ය ජේ එම් එම් ජයසුන්දර | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| 8. | ආචාර්ය එච් ඩී ඩී බන්දුප්‍රියා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| 9. | වී ජී ඩී නයනක මහතා | පර්යේෂණ නිලධාරී |
| 10. | ඩී බී විජේසිංහ මහතා | පර්යේෂණ නිලධාරී |
| 11. | කේ ඩබ් කේ අයි සිල්වා මෙනෙවිය | පර්යේෂණ නිලධාරී |
| 12. | ඩී පී කුමාරතුංග මහතා | පර්යේෂණ නිලධාරී |
| 13. | වී පී එම් ප්‍රසාන්ත මහතා | කළමණාකරු (වතු) |
| 14. | ඒ සෙනවිරත්න මහතා | තාක්ෂණ නිලධාරී (විදුලි) |
| 15. | පී එස් සෙනවිරත්න මහතා | තාක්ෂණ නිලධාරී (සිවිල්) |
| 16. | ආර් එම් එල් එස් රත්නායක මෙනෙවිය | කළමනාකරණ සහකාර (පොත් තබන්නා) |
| 17. | ඒ එච් එම් ජේ එස් අබේරත්න මහතා | කළමනාකරණ සහකාර (පොත් තබන්නා) |
| 18. | ජේ එම් එස් වී පෙරේරා මෙනෙවිය | කළමනාකරණ සහකාර (පොත් තබන්නා) |
| 19. | එන් එම් පියසේන මෙනෙවිය | ශිල්පීය නිලධාරී |
| 20. | ජී අයි ඩී ටී රූපිකා මෙනෙවිය | ශිල්පීය නිලධාරී |
| 21. | ආර් එම් අයි අයිවන් මෙනවිය | ශිල්පීය නිලධාරී |
| 22. | ආර් ඩී එස් යූ ජයසේකර මෙනවිය | ශිල්පීය නිලධාරී |
| 23. | එම් එච් එල් එස් මල්වැන්න මෙනවිය | ශිල්පීය නිලධාරී |

| | | |
|---|---|---|
| 24. | ජී ඒ එම් සමන්ති මෙනවිය | ශිල්පීය නිලධාරී |
| 25. | එන් ඒ ඒ ඩී එම් නිස්සංක මෙනවිය | ශිල්පීය නිලධාරී |
| 26. | ඩබ් එම් එස් එම් රත්නායක මෙනවිය | පිළිගැනීමේ නිලධාරී/දුරකථන ක්‍රියාකාරු |
| 27. | එස් එම් ආර් අයි සමරතුංග මෙනවිය | ක්ෂේත්‍ර පරීක්ෂක |
| 28. | ආර් එම් ඒ සේරම් මෙනවිය | ක්ෂේත්‍ර පරීක්ෂක |
| 29. | එස් ඒ එන් බී ලක්මාල් මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 30. | ඩී බී එච් කේ ජයරත්න මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 31. | ජේ ඒ ආර් ටී ජයසිංහ මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 32. | කේ කේ සී කේ එම් කොඩිතුවක්කු මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 33. | කේ ආර් එස් පී ප්‍රනාන්දු මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 34. | කේ එල් එස් කරුණාරත්න මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 35. | එම් ඒ එන් කුමාර මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 36. | ආර් ජී එම් යූ කේ ගමගේ මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 37. | එස් එන් ආර් එම් වී බී හේරත් | රසායානාගර ක්ෂේත්‍ර සහකාර |
| 38. | ටී ඩී ඒ ඒ කීර්තිසිංහ මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 39. | ඩබ් එම් එන් ප්‍රනාන්දු මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 40. | කේ ජී ඒ එස් කෝරලේගෙදර මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සහකාර |
| 41. | එම් ඒ ආර් පී කුමාර මහතා | රියදුරු |
| 42. | කේ ඩී එල් ගුණවර්ධන මහතා | රියදුරු |
| 43. | ආර් ජී එන් බණ්ඩාර මහතා | රියදුරු |
| 44. | එච් එම් ඩී එන් හේරත් මහතා | රියදුරු |
| 45. | ඒ කේ පේමදාස මහතා | රියදුරු |
| 46. | ආර් ජී ඒ ජී ජිනදාස මහතා | රියදුරු |
| 47. | ටී පී ජේ වමේන්ද්‍ර මහතා | රියදුරු |
| 48. | සී එස් බස්නායක මහතා | රියදුරු |
| 49. | ඒ එම් පී එස් අබේවීර මහතා | රියදුරු |
| 50. | ඩබ් එම් ජයරත්න බණ්ඩා මහතා | රියදුරු |
| 51. | එස් එම් මාරසිංහ මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 52. | එල් බී පී නිරෝෂන මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 53. | ජේ ඒ එස් එල් ජයසිංහ මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 54. | එම් ඒ ජී පතිරාජ මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |

| | | |
|---|---|---|
| 55. | ආර් එම් එස් එස් රත්නායක මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 56. | ඩබ් එස් එස් ප්‍රනාන්දු මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 57. | ටී එස් අබේරත්න මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 58. | එස් එම් ඒ විරන්ති මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 59. | ආර් කේ කේ එච් ජෙ ජයසිංහ මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 60. | එච් ඒ සී පී හෙට්ටිආරච්චි මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 61. | ආර් ඩී ඒ ලෙනාඩ් මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 62. | එච් ඒ ඒ එස් කුමාර මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 63. | ජේ එම් ඒ එස් කුමාර මහතා | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 64. | එම් පී ගයාදාරී මෙනවිය | රසායනාගාර ක්ෂේත්‍ර සේවක |
| 65. | කේ ඒ කේ කුමාර මහතා | පොදු සේවක |
| 66. | ඩී කේ එස් සෙනරත් මහතා | පොදු සේවක |
| 67. | එම් පී එස් ප්‍රනාන්දු මහතා | පොදු සේවක |
| 68. | ඊ එම් යූ නිශාන්ත මහතා | පොදු සේවක |
| 69. | කේ එම් වී සී කුමාරසිංහ මහතා | පොදු සේවක |
| 70. | ජේ එම් සී පී ජයමාන්න මහතා | පොදු සේවක |
| 71. | එච් ඒ තිලකුමාර මිය | පොදු සේවක |
| 72. | එච් ඩී සුසිතා මිය | පොදු සේවක |

## 10.5 ස්ථාන මාරු

පර්යේෂණාත්මක නිලධාරී ඩී. පී. පණ්ඩිතරත්න මහතා පාංශු හා ශාක පෝෂණ අංශයේ සිට පොල් සැකසුම් පර්යේෂණ අංශය වෙත මාරු කරන ලදී.

ශිල්පීය නිලධාරී ඒ. ඒ. ප්‍රනාන්දු මහතා අඹකැලේ හුදකලා බීජ පොල් උයනේ සිට ප්‍රවේණි හා ශාක අභිජනන අංශය වෙත මාරු කරන ලදී.

කාර්යාල සහායක ඩී. එම්. රූපිකා චාන්දනී මිය ගිණුම් අංශයේ සිට ප්‍රවේණි හා හාක අභිජනන අංශය වෙත මාරු කරන ලදී.

## 10.6 ඉල්ලා අස්වීම්

පටක රෝපණ අංශයේ අංශ ප්‍රධානී ආචාර්ය එල්.කේ. වීරකෝන් මහත්මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය එස්. සී. ප්‍රනාන්දු මහත්මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය ප්‍රශාන්ති පෙරේරා මහත්මිය, ජ්‍යෙෂ්ඨ ශිල්පීය නිලධාරී ආර්. මාරසිංහ මහතා සහ ශිල්පීය නිලධාරී ඒ. ඒ. ඩී. මනෝරි නිශ්ශංක මෙනවිය සේවයෙන් ඉල්ලා අස්විය.

## 10.7 විශ්‍රාමගැනීම්

ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සහකාර ඩබ්. එස්. එම්. ඒ. ප්‍රනාන්දු මහතා, රසායනාගාර ක්ෂේත්‍ර සේවක ඩබ්. ඒ. හේමවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සහකාර වී. යූ. එම්. ප්‍රනාන්දු මහතා, ජ්‍යෙෂ්ඨ ශිල්පීය නිලධාරී ආර්. බී. අත්තනායක මහතා සහ ජ්‍යෙෂ්ඨ කාර්යාල සහායක ඒ. ජී. නන්දසේන මහතා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 10.8 වෙනත් සැළකිය යුතු මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

ආචාර්ය එස්. ඒ. සී. එන් පෙරේරා මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාක අභිජනන පාඨමාලාව සඳහා දේශකවරියක් ලෙස සහභාගී විය.

ආචාර්ය එස්. ඒ. සී. එන් පෙරේරා මහත්මිය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාක අභිජනන පාඨමාලාව සඳහා දේශකවරියක් ලෙස සහභාගී විය.

ආචාර්ය ඒ. නයිනනායක මහතා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශාක කායික විද්‍යා පාඨමාලාව සඳහා දේශකවරයෙකු ලෙස සහභාගී විය.

ආචාර්ය සී.එස්. රණසිංහ මහත්මිය 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පේරාදෙණිය පශ්චාත් උපාධි ආයතනයේ ශාක ජීව විද්‍යා අංශයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී

ආචාර්ය ඩී. එම්. ඩී. අයි. විජේබණ්ඩාර මහත්මිය පොල් සංවර්ධන අධිකාරියට රසායන ද්‍රව්‍ය මිළදී ගැනීමේ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය ඩී. එම්. ඩී. අයි. විජේබණ්ඩාර මහත්මිය පාංශු විද්‍යා සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය ඩී. එම්. ඩී. අයි. විජේබණ්ඩාර මහත්මිය දකුණු හා නිරිතදිග ආසියා පාංශු විද්‍යා සංගම් මඟින් 2012 ඔක්තෝබර් 10-13 දක්වා පවත්වන ලද 10 වන ජාත්‍යන්තර සමුළුව සංවිධානය කිරීමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය අයි. එම්. එස්. කේ ඉදිරිසිංහ මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සංගමයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය අයි. එම්. එස්. කේ ඉදිරිසිංහ මහතා වයඹ විශ්වවිද්‍යාලයේ පවත්වන ලද 7 වන කෘෂි ව්‍යාපාර කළමනාකරණ සම්මන්ත්‍රණයේ විනිශ්චය මඩුල්ලේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය ජේ. එම්. ඩී. ටී. එවරාඩ් මහතා ජාතික විද්‍යා සභාවේ ජාතික ජෛවතාක්ෂණික මඩුල්ලේ සමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී

ආචාර්ය ජේ. එම්. ඩී. ටී. එවරාඩ් මහතා වයඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා උසස් අධ්‍යාපන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය ජේ. එම්. ඩී. ටී. එවරාඩ් මහතා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ බාහිර සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා සහ ආර්. ජයතිලක මහතා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික බීජ නිෂ්පාදන කමිටුවේ කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ශාක අභිජනන ජාතික කමිටුවේ සම සභාපති ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා ජාතික විද්‍යා පදනමේ ජාතික ජෛවතාක්ෂණික කමිටුවේ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එල්. පෙරේරා මහතා සහ ආචාර්ය එස්. ඒ.සී. එන්. පෙරේරා මෙනවිය ජාතික පර්යේෂණ සභාවේ අරමුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ ව්‍යාපෘතීන් ඇගයීමේ කටයුතු වලට දායක විය.

ආචාර්ය එල්. පෙරේරා මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුදල් යොදවනු ලැබූ ව්‍යාපෘතීන්හි ප්‍රගතීන් ඇගයීමේ කටයුතු වලට දායක විය.

ආචාර්ය එල්. පෙරේරා මහතා ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ අරමුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා ඇගයීමේ පර්යේෂණ මඩුල්ලේ සමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා පොල් පර්යේෂණ ආයතනයේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ තාක්ෂණ ඇගයීමේ කමිටු 9 ක සභාපති ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ කාබනික පොල් නිපදවීමේ කමිටුවේ කමිටු සභාපති ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකොන් මහතා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලැබූ පොහොර උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා පරිසර අමාත්‍යාංශය මඟින් පත්කරන ලද කර්මාන්තශාලා වලින් ඉවත ලන ද්‍රව්‍ය වගාවේ භාවිතා කිරීම කෙරෙහි සොයා බැලීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා කොළඹ අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් පත් කරන ලද කාබනික කෘෂිකාර්මික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මඟින් පත් කරන ලද පොල් සඳහා කාබනික පොහොර සහනාධාර වැඩසටහනේ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් පත්කරන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා බත්තරමුල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාබනික පොහොර පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය මඟින් සම්බන්ධීකරණය කරන ලද පසේ සාරවත්භාවය වැඩි දියුණු කිරීම, ඉඩම් ඵලදායීතාවය හා ඉඩම් කට්ටිකරණය අඩුකිරීම සඳහා වන ජාතික ව්‍යාපෘතියේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එන්. ඒ. තෙන්නකෝන් මහතා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිරසාර කාබනික වගා තාක්ෂණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය වී. විදානආරච්චි මහත්මිය සහ ආචාර්ය එච්. ඩී. ඩී. බන්දුප්‍රියා මහත්මිය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ජෛව තාක්ෂණ අංශයේ දේශකවරියන් ලෙස සහභාගී විය.

ආචාර්ය වී. විදානආරච්චි මහත්මිය කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මඟින් ස්ථාපිත කරන ලද කෘෂිකාර්මික ජෛව තාක්ෂණ ජාතික කමිටුවේ සාමාජකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය අයි. එම්. එස්. කේ. ඉදිරිසිංහ මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යා සංගමයේ උප සභාපති ලෙස පත්කරන ලදී.

ආචාර්ය අයි. එම්. එස්. කේ. ඉදිරිසිංහ මහතා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2013 කෘෂිකාර්මික සංඛ්‍යාන ලබා ගැනීම, පුහුණුව හා ප්‍රශ්ණාවලිය සෑදීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එස්. එච්. එස්. සේනාරත්න මහතා කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ආචාර්ය එස්. එච්. එස්. සේනාරත්න මහතා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

කේ. වී. එන්. එන්. ජයලත් මහත්මිය මුදල් අමාත්‍යාංශය මඟින් කරන ලද එච්එස් කේතාංක සංශෝධනය කිරීමේ කමිටුවසඳහා පොල් පර්යේෂණ ආයතනය නියෝජනය කරන ලදී.

## 11. වෙනත් ජයග්‍රහණ

### 11.1 ප්‍රකාශණ/නිර්දේශ


Aratchige N.S., Fernando L.C.P., Kumara A.D.N.T., Jayalath K.V.N.N., Perera K.F.G. and Suwandarathne N.I. (2012). Biological control of coconut mite: Effect of inundative release of the predatory mite, *Neoseiulus baraki* (Acari: Phytoseiidae). *In:* L.S.K. Hettiarachchi and I.S.B. Abeysinghe (Eds.) Proceedings of the 4$^{th}$ Symposium on Plantation Crop Research – Technological Innovations for Sustainable Plantation Economy. Tea Research Institute of Sri Lanka, St. Coombs, Talawakelle, 22100, Sri Lanka. pp. 125-133.

Aratchige N.S., Fernando L.C.P., Waidyarathne K.P. and Chandrasiri K.A.S. (2012). Population dynamics of *Aceria guerreronis* (Acari: Eriophyidae) and its predatory mite, *Neoseiulus baraki* (Acari: Phytoseiidae) in two coconut growing areas in Sri Lanka. *Experimental and Applied Acarology.* 56:319-325. ISSN 0168-8162. DOI: 10.1007/s10493-012-9519-z

Bandupriya, H. D. D. and Dunwell, J. M. (2012). Analysis and functional annotation of expressed sequence tags from coconut (*Cocos nucifera* L.) mature embryo. In: Hettiarachchi L. S. K. and Abeysinghe I. S. B. (eds.) Proceedings of the Fourth Symposium on Plantation Crop Research. September 20-21 Colombo, Sri Lanka.

Bandupriya, H. D. D. and Dunwell, J. M. (2012). Sequencing Coconut *(Cocos nucifera* L.*)* expressed sequenced tags (EST) using 454 Life Sciences technology. 2012 World Congress on *In Vitro* Biology, June 3-7, Bellevue, Washington, USA.

Bandupriya, H.D.D., Dunwell, J.M. (2012). Overexpression of *CnANT*, coconut *BABYBOOM* homologue alters plant growth and morphology in transgenic *Arabidopsis* plants. Tropical Agricultural Research *23 (3): 249-260*

Dissanayake H.D.M.A., Attanayake, R.B., Fernando, A.A., Jayathilake, R., Padmasiri, M.H.L., Herath, H.M.N.B., Chandrasiri, S.A.S., Perera, S.A.C.N., Meegahakumbura, M.K., and Perera, L. (2012). Development of promising coconut hybrids utilizing novel brown dwarf coconut variety, 4th Plantation Crop Research Symposium 20-21 September at BMICH, Colombo.

Fernando S. C., Santha, E. S., Perera, S. A. C. N., Dissanayake, H. D. M. A., Meegahakumbura, M.G. M. K. and Perera, L. (2012). *In vitro* characterization of indigenous coconut varieties (*Cocos nucifera* L.) of Sri Lanka for water stress tolerance. CORD 28 (2) 55-63

Gunasena, H.P.M and Idirisinghe, I.M.S.K. (2012). Coconut Industry in the Kurunegala District, (Submitted for publish in book to be published in Wayamba Provincial Council)

Gunathilake, H.A.J and Gunasena, H.P.M. (2012). Enhancement of biodiversity of coconut plantations for livelihood improvement in Sri Lanka. Paper presentation at the International Consultation on Sustainable Development: Twenty years after RIO. February 15-17, Chennai, India.

Gunathilake, H.A.J. (2012). Future of the coconut industry. Sri Lanka exporter, Issue 79. A Publication of the National Chamber of Exporters of Sri Lanka.

Gunathilake, H.A.J. (2012). Technological development on coconut crop improvement, coconut agronomy/nutrition and coconut based farming systems in Sri Lanka. Paper presentation at the ZLV Cocotech Meeting, Kochi, India.

Gunathilake, H.A.J. and Gunasena, H.P.M. (2012). Enhancement of biodiversity of coconut plantations for livelihood improvement in Sri Lanka. Paper presented at the conference on International Consultation on Sustainable Development, Twenty Years after Rio, MSSRF, Chennai, India. 15-17 February 2012.

